අත්තනගල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම
(අත්තනගල්ල ප්‍රාදේශීය සභාවෙන් කොටසක්)

2013 – 2033

වෙළුම II

නගර සංවර්ධන සැලැස්ම

නාගරික සංවර්ධන අධිකාරිය
"සෙත්සිරිපාය"
බත්තරමුල්ල
2013

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1841/7 - 2013 දෙසැම්බර් මස 17 වැනි අඟහරුවාදා - 2013.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

අත්තනගල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2011 ජූලි මස 06 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැළකිල්ලට ගෙන අත්තනගල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2013 ඔක්තෝබර් මස 24 වැනි දින,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

අත්තනගල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "අ" වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද අත්තනගල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 "ඊ" වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2013 ඔක්තෝබර් මස 24 වැනි දින අනුමත කරන ලද බවත්, මෙම ගැසට් නිවේදනය පළ වූ දින සිට එය බලපැවැත්වෙන බවත්, මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

නිමල් පෙරේරා,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2013 නොවැම්බර් මස 27 වැනි දින,

01 - 27

1A - PG 01877 — 210 (2013/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අත්තනගල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය
සඳහා සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "**ඊ**" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2011 ජූලි මස 06 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැළකිල්ලට ගෙන අත්තනගල්ල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය

රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
අංක: 15/5,
බාලදක්ෂ මාවත,
කොළඹ 03.
2013.

ක්‍රමවේදය


- ජනගහනය
- භූමි පරිහරණය
- නිවාස
- මාර්ග හා ප්‍රවාහනය
- භෞතික පහසුකම්
- සමාජ අපරවූහ පහසුකම්
- පරිසරය
- කෘෂිකර්මාන්තය
- ආර්ථිකය
- ඉඩම් අයිතිය
- කර්මාන්ත
- ඓතිහාසික හා පූරා විද්‍යාත්මක උරුමය
දත්ත රැස්කිරීම
නාගරික සංවර්ධන අධිකාරිය
පළාත් පාලන ආයතන හා අදාල අනෙකුත් ආයතන
අංශ විශ්ලේෂණය
ප්‍රශ්න හා විභවතා හඳුනා ගැනීම
අරමුණු
භෞතික
සමාජීය
පාරිසරික
ආර්ථික
කලාපීකරණය
සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි
උපදේශක සැලසුම්
නිර්දේශිත ව්‍යාපෘති
උපාය මාර්ග
පළාත් පාලන ආයතන, මහජනතාව හා අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කිරීම
නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම
අවසාන සැලැස්ම සකස් කිරීම
ගරු ඇමතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීම
නීතිගත කිරීම සඳහා ප්‍රකාශයට පත් කිරීම
ක්‍රියාත්මක කිරීම
පසු විපරම් කිරීම

නගර සංවර්ධන සැලැස්ම

1.0 හැඳින්වීම

ආංශික විශ්ලේෂණයේදී අත්තනගල්ල නාගරික ප්‍රදේශය සඳහා වූ ගැටලු, විභවතා සහ නගරයේ සංවර්ධනය යා යුතු දිශාව පිළිබඳව කරුණු හඳුනාගන්නා ලදී. ඒ ආශ්‍රයෙන් නගරයේ සංවර්ධන උද්දීපනයක් ඇති කිරීම සඳහා පෙර දැක්ම සකසන ලද අතර එම දැක්ම කරා ළඟාවීම සඳහාත් ප්‍රදේශයේ අඛණ්ඩ සංවර්ධනයක් කරා යෑම සඳහාත් අරමුණු හඳුනා ගන්නා ලදී. මෙම අරමුණු ශාක්ෂාත් කර ගැනීමේ උපාය මාර්ගයක් ලෙස ක්‍රියාකාරී ව්‍යාපෘති මෙම සැලැස්මේදී නිර්දේශ කරන අතර කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන ව්‍යාපෘති ලෙස මෙහිදී ඉදිරිපත් කෙරේ.

රූපය 01න් අත්තනගල්ල නාගරික ප්‍රදේශය සඳහා වූ සැලැස්ම සංක්ෂිප්තව දක්වා ඇති අතර සංවර්ධන දර්ශනය කරා එළඹුනු ආකාරය ද සඳහන් කර ඇත. ශක්තීන්, දුර්වලතා, විභවතා, තර්ජන (ශදුවිත) විශ්ලේෂණය තර්කානුකූලව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව රූපයේ දැක්වෙන පරිදි නගරයේ විශේෂ සංවර්ධන විභවතා හඳුනා ගන්නා ලදී.

සංවර්ධන දර්ශනය

"අත්තනගල්ල නාගරික ප්‍රදේශය ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංස්කෘතික කේන්ද්‍රස්ථානය ඔවට පත් කරමින් සංචාරකයින් ආකර්ෂණය කරගන්නා වූ නගරයක් ඔවට පත් කිරීම "

මෙම දර්ශනය කරා නගරය යොමු කරවීම සඳහා සංවර්ධන අරමුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

හඳුනා ගන්නා ලද අරමුණු සහ ව්‍යාපෘති සවිස්තරාත්මකව මතු කියැවෙන පරිච්ඡේදයේ දක්වා ඇත.

2.0 අරමුණු

1. පවතින ඓතිහාසික ස්ථාන ඒකාබද්ධ කිරීම තුළින් සංස්කෘතික අනන්‍යතාවය වැඩි දියුණු කිරීම හා පාරිසරික සංවේදී ප්‍රදේශද එයට අන්තර්ග්‍රහණය කරමින් සංචාරක ආකර්ශණය තීව්‍ර කිරීම.

   - අත්තනගල්ල රජ මහා විහාරය ඇතුලු අනෙකුත් සිද්ධස්ථාන හා සංස්කෘතික මධ්‍යස්ථාන බැතිමතුන් හට පහසුකම් සලසන මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කිරීම.
   - සංචාරකයින් සඳහා තොරතුරු ලබා දීමේ මධ්‍යස්ථානයක් ඇති කිරීම.
     මෙම මධ්‍යස්ථානය තුළ පහත සඳහන් අංග ඇතුළත් කිරීමට යෝජිතය.

     - සංචාරකයින් සඳහා අවශ්‍ය අංග සම්පූර්ණ නවාතැන් පහසුකම් සැපයීම
     - අන්තර්ජාල පහසුකම් ඇති කිරීම
     - ප්‍රදර්ශන මධ්‍යස්ථාන ඇති කිරීම
     - රැස්වීම් ශාලා
     - දේශීය නිෂ්පාදන විකිණීමේ මධ්‍යස්ථාන
     - සංචාරක මාර්ගෝපදේශ ජාලයක් ඇති කිරීම

2. දේශීය වෛද්‍ය ශිල්පීය ක්‍රම සංචාරක ආකර්ශනය සඳහා යොදා ගැනීම.

3. අත්තනගල්ල ප්‍රදේශයේ පවතින සම්පත් උපයෝගී කරගෙන ක්‍රීඩා සංවර්ධනය ඇති කිරීම.

සංවර්ධන සැලැස්මේ සංක්ෂිප්තය

රූපය 01



ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

4. නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම

i. දේශීය හා විදේශීය සංචාරකයන් සහ නගරයෙන් සේවා ලබා ගැනීමට පැමිණෙන සියළු ජනතාවට ප්‍රශස්ථ සේවයක් සැළසෙන පරිදි නිර්මාණය වූ නගර මධ්‍ය සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

- නගර මධ්‍යයේ පවතින ඉඩම් මනා සැලසුම්කරණයක් තුළින් ප්‍රශස්ථ භාවිතයට ගැනීම.
- ගැළපෙන භාවිතයන් ඒකරාශී කිරීම.
- නගර මධ්‍ය ප්‍රදේශය සහ බස් නැවතුම්පල සඳහා කාර්යක්ෂම හා ආරක්ෂාකාරී ප්‍රවාහන රටාවක් හඳුන්වා දීම.
- අත්තනගල්ල ප්‍රාදේශීය සභාව නිර්මාණය වූ නගරයේ ප්‍රධාන ආයතනය වශයෙන් අනන්‍යතාවයක් ලබා දෙන ලෙස සංවර්ධනය කිරීම.
- පවතින මාර්ගවල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම.
- භූ දර්ශන සැලසුම් හා නගර අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පදිකයන් සඳහා වූ ප්‍රදේශ හඳුන්වා දීම.

ii. වෙයන්ගොඩ නගර මධ්‍යයේ පවතින ඉඩම් ප්‍රශස්ථ භාවිතය සඳහා යොදා ගැනීම සහ කාර්යක්ෂම හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම.

- නගර මධ්‍ය සැලසුම් සකස් කිරීම.
- ප්‍රවාහන මාධ්‍යයන් ඒකාබද්ධ කිරීම.
- ඉඩම් මනා සැලසුම්කරණයක් තුළින් ප්‍රශස්ථ භාවිතයට ගැනීම.
- ගැලපෙන භාවිතයන් ඒකරාශී කිරීම.
- පවතින මාර්ගවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- භූ දර්ශන හා නගර අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- පදිකයන් සඳහා වූ ප්‍රදේශ හඳුන්වා දීම.

5. ප්‍රදේශයේ පවතින භූමීය ප්‍රශස්ථ භාවිතයට යොදා ගැනීම සඳහා කලාපීකරණ සැලැස්මකට අනුගත කිරීම.

6. ප්‍රදේශයේ නේවාසික පරිසරයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සහ අනාගත අවශ්‍යතාවයන් සපුරා ලීම සඳහා නව නිවාස ව්‍යාපෘති හඳුනා ගැනීම.

- නේවාසික සංවර්ධනයට අවශ්‍ය ප්‍රජා මූලික අපරව්‍යුහ පහසුකම් වැඩි දියුණු කිරීම.
- ක්‍රමවත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමේ වැඩපිළිවෙලක් ඇති කිරීම.
- නේවාසික සංවර්ධනයට සුදුසු යයි හඳුනාගත් ප්‍රදේශ තුළ ඒ සඳහා සංවර්ධනකරුවන් දිරිමත් කිරීම.

7. අපරව්‍යුහ සැලැස්මක් සකස් කිරීම
   - හඳුනාගත් මාර්ග ප්‍රමුඛතාවය මත සංවර්ධනය කිරීම.
   - ජල සැපයුම් ලබා දීම.

8. තෙත් බිම් සංරක්ෂණය කිරීම.
   - තෙත් බිම් සංරක්ෂණය කිරීම සඳහා සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම තුළින් තෙත් බිම් ප්‍රශස්ථ භාවිතයක් සඳහා යොදා ගැනීම.

9. ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය නැංවීම.
   - කෘෂිකාර්මික ඉඩම් සංරක්ෂණය.
   - පවතින පොල්, රබර් සහ කුඹුරු ඉඩම් ඵලදායි භාවිතය සඳහා නීති පද්ධතියක් ඇති කිරීම හා බලාත්මක කිරීම.
   - දේශීය කෘෂි නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා ප්‍රදේශ හඳුන්වා දීම.
   - නාගරික කෘෂිකර්මාන්ත සංවර්ධනය සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම.
   - ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය සඳහා යොදා ගන්නා ජල මාර්ග නිසි පරිදි නඩත්තු කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම.

10. ප්‍රදේශයේ පරිසරයේ ගුණාත්මක භාවය වැඩි කිරීම සඳහා කසළ අපහරණ සැලැස්මක් හඳුන්වාදීම.

11. වන රක්ෂිත හා අත්තනගලු ඔය ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය කිරීම තුළින් ස්වභාවික විපත් අවම කිරීම.

    - ඇල රක්ෂිත ප්‍රදේශ අමුණු ආදී වාරි මාර්ග ක්‍රමය ආරක්ෂාවන පරිදි පවතින නීති නාගරික සංවර්ධන නීතියට අන්තර්ග්‍රහනය කිරීම.
    - ගංවතුර තර්ජන ඇතිවන ප්‍රදේශ හඳුනාගෙන ඒවායේ ඇති ජල රැඳවුම් ප්‍රදේශ ආරක්ෂා කිරීම.

12. ප්‍රදේශයේ ජනතාවගේ රැකියා වියුක්තිය තුරන් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් හඳුන්වා දීම.
    - ප්‍රදේශයේ ජනතාවගේ අනාගත අවශ්‍යතාවයට ගැළපෙන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා පුළුල් කිරීම.
    - ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථිකය නැංවීමට ක්‍රම උපාය මාර්ග සැකසීම.

3.0 ක්‍රම උපාය මාර්ග

ඒ සඳහා පහත දැක්වෙන උපාය මාර්ග සැලසුම් කිරීම හා ඒ අනුව ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ.

(i) කලාපීකරණ සැලැස්ම

(ii) සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි

(iii) උපදේශක සැලසුම්

- නේවාසික සැලැස්ම
- මාර්ග හා ප්‍රවාහන සැලැස්ම
- තෙත් බිම් සංරක්ෂණ සැලැස්ම

(iv) නිර්දේශිත ව්‍යාපෘති

3.1 කලාපීකරණ සැලැස්ම

සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමේදී කලාපීකරණය මූලික උපාංගයක් වේ.

එකිනෙකට ගැලපෙන භාවිතයන්, එයට අදාල අපරවාහ පහසුකම් සමග ඒකාබද්ධ වන ලෙස විධිමත්ව ඒකරාශී වී ක්‍රියාත්මක වීමට සැලසුම් කිරීම කලාපීකරණය මගින් කෙරේ. එසේම මේ තුළින් පොදු මහජනතාවගේ සුභසාධනය ආරක්ෂා කිරීම, ක්‍රමානුකූල ප්‍රජා වර්ධනයක් සහතික කිරීම හා දේපල වටිනාකම් ආරක්ෂා කිරීමද සිදුකරන අතර නොගැළපෙන භාවිතයන් සුදුසු ලෙස ඉවත් කර, සැලසුම් සහගත නගරයක් ඇති කිරීම අපේක්ෂා කෙරේ (සිතියම් අංක 01).

3.1.1 විෂය පථය

විටින් විට කරන ලද සංශෝධනයන්ට යටත්ව 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3වන වගන්තිය යටතේ අංක 1171/10 හා 2001.02.13 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ, නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අත්තනගල්ල නාගරික ප්‍රදේශයට මෙම රෙගුලාසි බල පැවැත්වේ.

3.1.2 පොදු නියමතා

i. අත්තනගල්ල නාගරික ප්‍රදේශය තුළ පිහිටි සියළුම බිම් කොටස්, ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද කලාපීකරණ සැලැස්මේ කිසියම් කලාපයකට අයත් වන අතර අදාල කලාප වල නිර්දේශිත භාවිතයන් සඳහා පමණක් භාවිතා කළ යුතු වේ.

කලාපීකරණ සැලැස්ම (2010 - 2030)
අත්තනගල්ල නාගරික ප්‍රදේශය

සිතියම් අංක 01





යතුර

- විශේෂ නේවාසික කලාපය
- ප්‍රාථමික නේවාසික කලාපය (I, II & III)
- වාණිජ කලාපය (I & II)
- මිශ්‍ර සංවර්ධන කලාපය (I & II)
- ආයතනික කලාපය
- පහත් බිම්
- ජල මාර්ග
- අත්තනගල්ල නාගරික ප්‍රදේශය

පරිමාණය :- 1 : 50,000

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

ii. පවතින තෙත් බිම්වල සිදු කරනු ලබන සියළුම ක්‍රියාකාරකම් තෙත් බිම් සංරක්ෂණ සැලැස්මට අනුකූල විය යුතුය.

iii. ඕනෑම ගොඩනැගිල්ලක් හෝ බිම් කොටසක් සඳහා අත්තනගල්ල ප්‍රාදේශීය සභාවෙන් ලබා ගන්නා ලද සංවර්ධන බලපත්‍රයේ සඳහන් කාර්යයන් හැර වෙනත් කාර්යයන් සඳහා භාවිතා නොකළ යුතුය.

iv. අධිකාරිය විසින් සුදුසු යයි හැඟෙන අවස්ථාවකදී, කිසියම් ප්‍රදේශයක් පහත සඳහන් විශේෂ ව්‍යාපෘති ප්‍රදේශයක් වශයෙන් අර්ථ නිරූපනය කළ හැකිය. එනම්;

   අ. සංරක්ෂණ ප්‍රදේශ (ස්වභාවික රක්ෂිත වනාන්තර ප්‍රදේශ, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක රක්ෂිත ප්‍රදේශ සහ ස්වභාවික සෞන්දර්යාත්මක ප්‍රදේශ)

   ආ. නගර මධ්‍ය ප්‍රදේශ

   ඇ. විශේෂ නිවාස ව්‍යාපෘති ප්‍රදේශ හෝ වෙනත් විශේෂිත ව්‍යාපෘති ප්‍රදේශ එවැනි ප්‍රදේශ තුළ කිනම් හෝ ආකාරයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා බිම් ප්‍රදේශ භාවිතා කිරීම පිණිස වෙනම රෙගුලාසි පැනවීම සහ අවශ්‍යතාවන් දැක්වීම අධිකාරිය විසින් සිදුකරනු ලැබිය හැකිය.

v. කිසියම් ඉඩම් කොටසක් කලාප දෙකකට අයත් වන අවස්ථාවන්හිදී එම ඉඩම් කොටස සඳහා කලාපය තීරණය කරනු ලබන්නේ එම බිම් කොටසට ප්‍රධාන ප්‍රවේශය අයත් කලාපය වේ. එසේ වුවද යම් කලාපීකරණ මායිමක් දිග පළලින් යුතුව ස්ථිර කර ඇති අවස්ථාවකදී එම විශේෂිත සීමාවන්ට අනුව එම බිම් කොටසේ කලාපය තීරණය වේ.

vi. මෙම නීති රීති බල පවත්වනු ලබන දිනය වන විට කිසියම් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කරනු ලබන භාවිතයක් එම කලාපයට නොගැලපේ නම් එකී භාවිතය කාලය දීර්ඝ කිරීමෙන් හෝ යාබද ඉඩම්වලින් කොටස් එකතු කිරීමෙන් හෝ කිසියම් ව්‍යාප්තියකට තුඩු දෙන ක්‍රියාකාරකම් සඳහා හෝ අවසර දෙනු නොලැබේ.

   තවද යෝජිත භූමිය හෝ ගොඩනැගිල්ල දිගින් දිගටම පවත්වාගෙන යාම අහිතකර යයි හැඟී යන්නේ නම් එකී නොගැළපෙන භාවිතය නතර කරන ලෙස අධිකාරියට නියම කරනු ලැබිය හැකිය. එවැනි නොගැළපෙන භාවිතයක් මාස 12කට වැඩි කාලයක් නතර කර හෝ තාවකාලිකව නතර කර හෝ නවතා ඇති විට එම ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරුට හෝ පදිංචිකරුට එම ඉඩම හෝ ගොඩනැගිල්ලේ එකී නොගැළපෙන භාවිතය නැවත කරගෙන යාමට හිමිකම් නොමැත්තේය.

vii. 3.1.3 දරන වගන්තිය යටතේ ඇති භාවිත කලාප සහ 3.1.2 (IV) වගන්තිය යටතේ නියම කර ඇති විශේෂිත සංවර්ධන ප්‍රදේශ, කලාප සිතියමේ සුදුසු පරිමාණයෙන් මායිම් වශයෙන්, නියමිත ඉරි යෙදීමෙන්, පාට කිරීමෙන් හෝ වෙනත් සලකුණු මගින් වෙන්කර දක්වනු ලැබේ. එවිට එම සිතියමෙහි සඳහන් සියළු කරුණු පැහැදිලි කිරීම් සහිතව සහ එම අවශ්‍යතාවයන්ට සරිලන පරිදි සකස් කර ඇති සිතියම් ආදේශ කිරීම හෝ අතිරේක සිතියම් එකතු කිරීම සිදු කරනු ලැබේ.

viii. පුරාවිද්‍යාත්මක, පුරාණ ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රම සම්බන්ධ සහ ජාතික උරුමයන් හා සම්බන්ධ සියළු ගොඩනැගිලි හා භූමි භාගයන් පවතින ආකාරයට සංරක්ෂණය කළ යුතු අතර, වැඩි දියුණු කිරීමක් හෝ ප්‍රතිසංස්කරණයක් සිදු කිරීමේදී සහ නව ඉදි කිරීමක් සිදු කිරීමේදී පුරාවිද්‍යාත්මක අගයන් ආරක්ෂා වන පරිදි සැලසුම් කළ යුතු අතර, ඒ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාගත යුතුය.

ix. සියළු කලාප වලට අදාල අවම භූමි ප්‍රමාණය ඇමුණුම I ආකාරයට විය යුතු අතර ගෙබිම් අනුපාතය ඇමුණුම II හි ආකාරයට විය යුතුය.

3.1.3 භාවිත කලාප

අත්තනගල්ල නාගරික ප්‍රදේශය තුළ පවතින සියළුම භූමි පහත සඳහන් කලාපයන්ට අනුගත වන පරිදි කලාපීකරණ සැලැස්මට ඇතුලත් කෙරේ (සිතියම් අංක 01).

i. විශේෂ නේවාසික කලාපය
ii. ප්‍රාථමික නේවාසික කලාපය I, II, III
iii. වාණිජ කලාපය I හා II
iv. මිශ්‍ර සංවර්ධන කලාපය I හා II
v. ආයතනික කලාපය

3.1.4. කලාප මායිම්

සිතියම් අංක 01හි දක්වා ඇති සියළුම තෙත් බිම්වලට අදාල වන මායිම් හා රෙගුලාසි මෙහි 3.3.3 ඡේදයෙහි විස්තර වන තෙත් බිම් සංරක්ෂණ සැලැස්ම යටතේ හා සිතියම් අංක 06හි දක්වා ඇති පරිදි ක්‍රියාත්මක වන බව සැළකිය යුතුය.

3.1.4.1 **විශේෂ නේවාසික කලාපය -**

උතුර -

අංක 349 මඩුවේගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම හා අංක 349ඩී රන්පොකුණගම සී කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගෙන ඊසාන දෙසට අංක 349 ඩී රන්පොකුණගම සී කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 349 ඊ රන්පොකුණගම ඩී කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන, නැගෙනහිර දෙසට අංක 349ඊ රන්පොකුණගම ඩී කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද ;

නැගෙනහිර -

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට දකුණු, නිරිත හා දකුණු දෙසට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 349 ඒ රන්පොකුණගම ඒ කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා;

දකුණ -

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට බටහිර දෙසට අංක 349 ඒ රන්පොකුණගම ඒ කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍ය දක්වාද; එතැන්සිට වයඹ දෙසට නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 349 සී රන්පොකුණගම බී කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට වයඹ දෙසට අංක 349සී රන්පොකුණගම බී කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 349 සී රන්පොකුණගම බී කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද;

බටහිර -

අවසන් වරට සඳහන් කරන ලක්ෂ්‍යයේ සිට වයඹ, ඊසාන, උතුරු දෙසට අංක 349සී රන්පොකුණගම බී කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ අංක 349ඩී රන්පොකුණගම සී කලාපයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද ; එතැන්සිට වයඹ දෙසට අංක 349ඩී රන්පොකුණගම බී කලාපය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

3.1.4.2 ප්‍රාථමික නේවාසික කලාපය I

උතුරට -

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ උතුරු මායිම හා මිණුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගෙන නැගෙනහිර දෙසට අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උතුරු මායිම ඔස්සේ බණ්ඩාරනායක මාවත මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද,

නැගෙනහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට නිරිත දෙසට බණ්ඩාරනායක මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ 'දී ඇලි' ඔයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර දෙසට 'දී ඇලි' ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 329 සී හිරිපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට වයඹ දෙසට අංක 329 සී හිරිපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ බාදුරාගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර දෙසට බාදුරාගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ විජය මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ගිණිකොණ හා දකුණු දෙසට විජය මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නිට්ටඹුව -කටුනායක මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන වේයන්ගොඩ මංසන්ධිය හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට කටුනායක- වේයන්ගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දෙසට නිදහස් මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍ය දක්වාද; එතැන්සිට ගිණිකොණ දෙසට නිදහස් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ සිරිවර්ධන මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ගිණිකොණ දෙසට සිරිවර්ධන මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ පාරමුල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට පාරමුල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍ය දක්වාද;

දකුණ -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට උතුරු, බටහිර, වයඹ දෙසට අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ බටහිර මායිම ඔස්සේ නිට්ටඹුව - කටුනායක මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර දෙසට නිට්ටඹුව - කටුනායක මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ මිණුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද;

බටහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඊසාන දෙසට මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නැගෙනහිර මායිම ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

3.1.4.3 **ප්‍රාථමික නේවාසික කලාපය II**

උතුරට -

කොළඹ - නුවර දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව හා නිවටඹුව - කටුනායක මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ කර නැගෙනහිර දෙසට නිවටඹුව - කටුනායක මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 348 සී එගොඩ නිවටඹුව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද;

නැගෙනහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට දකුණු දෙසට අංක 348 සී එගොඩ නිවටඹුව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 347 බී නම්බාදළුව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර, ගිණිකොණ, වයඹ, බටහිර දෙසට අංක 347බී නම්බාදළුව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 328බී පත්තලගෙදර - නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට දකුණු දෙසට අංක 328බී පත්තලගෙදර - නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 318ඊ තිහාරිය - දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද;

දකුණ -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට නිරිත හා බටහිර දෙසට අංක 318 ඊ තිහාරිය දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 321 බී කටුවන්ගොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර දෙසට අංක 321 බී කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 328 පත්තලගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට වයඹ දෙසට අංක 328 පත්තලගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 328 සී දන්විලාන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට වයඹ, නිරිත දෙසට අංක 328 සී දන්විලාන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 332 වටද්දර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට අංක 332 වටද්දර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ කොළඹ - නුවර දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද;

බටහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඊසාන දෙසට කොළඹ - නුවර දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

3.1.4.4 ප්‍රාථමික නේවාසික කලාපය III

උතුර -

කොළඹ - නුවර දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව හා අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගෙන ඊසාන, ගිණිකොණ දෙසට අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උතුරු මායිම ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නවදුරටත් නැගෙනහිර දෙසට අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උතුරු මායිම ඔස්සේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද,

නැගෙනහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට දකුණු, බටහිර හා නිරිත දෙසට අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 349ඊ රන්පොකුණගම බී කලාපය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද;

දකුණට -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බටහිර දෙසට අංක 349 ඊ රන්පොකුණගම බී කලාපය ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 349 ඩී රන්පොකුණගම සී ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට අංක 349 ඩී රන්පොකුණගම සී ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 345 නාපාගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට දකුණු දෙසට අංක 345 නාපාගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන්සිට වයඹ දෙසට නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 348 ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන දෙසට අංක 348ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 345 නාපාගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර, වයඹ දෙසට අංක 345 නාපාගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරමින් අංක 348 නිට්ටඹුව උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම මුණගැසෙන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට අංක 348 නිට්ටඹුව උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 348
එෆ් නිට්ටඹුව නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට වයඹ දෙසට අංක 348 එෆ් නිට්ටඹුව නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ පොත්තගල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට උතුරු දෙසට පොත්තගල මර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උදම්විට කණුතැන්න මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර දෙසට උදම්විට කණුතැන්න මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ රාමණායක මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට රාමනායක මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දෙසට නිට්ටඹුව - කටුනායක මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව මීටර් 200ක් උතුරු දෙසින් අඳින ලද සමාන්තර රේඛාව හමුවන ලක්ෂ්‍යය

දක්වාද; එතැන්සිට එම සමාන්තර රේඛාව ඔස්සේ බටහිර දෙසට කොළඹ - නුවර දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද;

බටහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඊසාන දෙසට කොළඹ - නුවර දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

3.1.4.5 වාණිජ කලාපය I

උතුර -

නිට්ටඹුව - කටුනායක මාර්ගයේ මධ්‍ය රේඛාව හා ශාන්ත අන්තෝනි මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය ආරම්භක ලක්ෂ්‍යය වශයෙන් ගෙන නැගෙනහිර දෙසට නිට්ටඹුව - කටුනායක මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන දෙසට කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 348 ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට දකුණු දෙසට අංක 348ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව මීටර් 100ක් දකුණු දෙසින් අඳින ලද සමාන්තර රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට ඉහත කී සමාන්තර රේඛාව ඔස්සේ නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව මීටර් 100 උතුරු දෙසින් අඳින ලද සමාන්තර රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ගිණිකොණ දෙසට ඉහත කී සමාන්තර රේඛාව ඔස්සේ අංක 348 ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද;

නැගෙනහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට නිරිත දෙසට අංක 348 ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ විවේකාරාම පන්සල පාරේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට විවේකාරාම පන්සල පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නිට්ටඹුව රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍ය දක්වාද; එතැන්සිට වයඹ දෙසට නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ජයසූරිය මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට ජයසූරිය මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ මුදලිදූ මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට දකුණු හා බටහිර දෙසට මුදලිදූ මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ කැන්දහේන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද;

දකුණ -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බටහිර දෙසට කැන්දහේන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට උතුරු දෙසට කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ගම්මැද මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර දෙසට ගම්මැද මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ශාන්ත අන්තෝනි මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද;

බටහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට උතුරු, බටහිර, ගිණිකොණ, වයඹ දෙසට ශාන්ත අන්තෝනි මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා වේ.

3.1.4.6 වාණිජ කලාපය II

උතුරට -

විජය මාවතේ මධ්‍ය රේඛාව හා බාදුරාගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යයෙන් ආරම්භකර නැගෙනහිර දෙසට බාදුරාගොඩ මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 329සී හිරිපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍ය දක්වාද; එතැන්සිට ගිණිකොන සෙට අංක 329 සී හිරිපටිය මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 329 සී හිරිපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද;

නැගෙනහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ගිණිකොණ දෙසට අංක 329 සී හිරිපිටිය මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ දී ඇලි ඔයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නැගෙනහිර දෙසට දී ඇලි ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ බණ්ඩාරනායක මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට බණ්ඩාරනායක මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නිවටඹුව - ගුවන්තොටුපල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර දෙසට නිවටඹුව - ගුවන්තොටුපල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ පාරමුල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන්සිට නිරිත දෙසට පාරමුල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ මිහිඳු මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද,

දකුණ -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බටහිර දෙසට මිහිඳු මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නිදහස් මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද,

බටහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට වයඹ, බටහිර, උතුරු දෙසට නිදහස් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නිවටඹුව - ගුවන්තොටුපල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට බටහිර දෙසට නිවටඹුව - ගුවන්තොටුපල මධ්‍ය රේඛාව ඔස්සේ විජය මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට උතුර හා වයඹ දෙසට විජය මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

3.1.4.7 මිශ්‍ර සංවර්ධන කලාපය I

උතුර -

කොළඹ - නුවර දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව හා නිවිටඹුව - කටුනායක මාර්ගයේ මධ්‍ය රේඛාවට මීටර් 200ක් උතුරු දෙසින් අඳින ලද කල්පිත රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භකර නැගෙනහිර දෙසට ඉහතකී කල්පිත රේඛාව ඔස්සේ රාමනායක මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍ය දක්වාද; එතැන්සිට උතුරු දෙසට රාමනායක මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උදම්විට - කණුතැන්න මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නැගෙනහිර දෙසට උදම්විට - කණුතැන්න මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ පොත්තගල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද;

නැගෙනහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට දකුණු දෙසට පොත්තගල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිවිටඹුව - ගුවන්තොටුපල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද;

දකුණ -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බටහිර දෙසට නිවිටඹුව - ගුවන්තොටුපල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ කොළඹ - නුවර දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද,

බටහිර -

අවසන්වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට උතුරු දෙසට කොළඹ - නුවර දුම්රිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

3.1.4.8 මිශ්‍ර සංවර්ධන කලාපය II

උතුර -

අංක 322 ඒ තිරිවානේගම උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම හා අංක 321 කලගෙඩිහේන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගෙන, නැගෙනහිර දෙසට අංක 321 කලගෙඩිහේන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 321 ඒ කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නැගෙනහිර දෙසට අංක 321 ඒ කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 321 බී කටුවන්ගොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට උතුරු දෙසට අංක 321 බී කටුවන්ගොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ අංක 321 බී කටුවන්ගොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ගිණිකොන, ඊසාන, ගිණිකොන, ඊසාන සහ

උතුරු දෙසට අංක 321 බී කඩුවන්ගොඩ බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 318 ඊ තිහාරිය දකුණ, ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන දෙසට අංක 318 ඊ තිහාරිය දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 348 අයි පින්නගොල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට උතුරු දෙසට අංක 348 අයි. පින්නගොල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ අංක 347 බී කෝලවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නැගෙනහිර, ගිණිකොණ, වයඹ, නැගෙනහිර දෙසට අංක 347 බී කෝලවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 348 සී එගොඩ නිට්ටඹුව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන, උතුරු දෙසට අංක 348 සී එගොඩ නිට්ටඹුව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ ගුවන්තොටුපල - නිට්ටඹුව මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ගිණිකොණ දෙසට ගුවන්තොටුපල - නිට්ටඹුව මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ ශාන්ත අන්තෝනි මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට දකුණු දෙසට ශාන්ත අන්තෝනි මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ ගම්මැද පාරේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍ය දක්වාද; එතැන්සිට නැගෙනහිර දෙසට ගම්මැද මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට උතුරු දෙසට කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ කැන්දහේන මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නැගෙනහිර දෙසට කැන්දහේන මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ මුදලිදූ මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන දෙසට මුදලිදූ මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ ජයසූරිය මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද, එතැන්සිට ඊසාන දෙසට ජයසූරිය මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ගිණිකොන දෙසට නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ විවේකාරාම පන්සල පාරේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන දෙසට විවේකාරාම පන්සල පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව මීටර් 100ක් උතුරු දෙසින් අඳින ලද කල්පිත රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට වයඹ දෙසට ඉහත කී

කල්පිත රේඛාව ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාවට සමාන්තරව මීටර් 100ක් දකුණු දෙසින් අඳින ලද කල්පිත රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන දෙසට ඉහත කී කල්පිත රේඛාව ඔස්සේ අංක 348 ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට අංක 348 ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ ගිණිකොන දෙසට අංක 348 ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට අංක 348 ඒ නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට අංක 349 මඩුවේගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද;

නැගෙනහිර -

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට නිරිත දෙසට අංක 349 මඩුවේගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ගිණිකොණ දෙසට නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 350 ඒ චතුපිටිවල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන දෙසට අංක 350 ඒ චතුපිටිවල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ගිණිකොණ, නිරිත දෙසට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ නැගෙනහිර මායිම ඔස්සේ නිට්ටඹුව - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරමින් අංක 349 මඩුවේගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද;

දකුණට -

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට නිරිත දෙසට අංක 349 මඩුවේගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 352 ඩී මාතලාන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට අංක 352 ඩී මාතලාන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 352 ඩී මාතලාන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම මුණගැසෙන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට, බටහිර දෙසට, නිරිත දෙසට අංක 352 ඩී මාතලාන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 352 ඩී මාතලාන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 352 ඩී මාතලාන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම මුණගැසෙන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට, බටහිර දෙසට, නිරිත දෙසට අංක 352 ඩී මාතලාන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ අංක 348 ඊ මල්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට, අංක 348 ඊ මල්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 348 ජේ ඕවර්ඩවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට අංක 348 ජේ ඕවර්ඩවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 318 ඊ මල්වත්ත දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට අංක 318ඊ මල්වත්ත දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 318ඊ මල්වත්ත දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට වයඹ දෙසට අංක 318 ඊ මල්වත්ත දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත දෙසට කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 318 සී තිහාරිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද; එතැන්සිට ගිණිකොණ දෙසට අංක 318 සී තිහාරිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 318 සී තිහාරිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම හමුවන තෙක්ද; එතැන්සිට නිරිත දෙසට සහ වයඹ දෙසට අංක 318සී තිහාරිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 318 සී තිහාරිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ බටහිර මායිම

හමුවන තෙක්ද; එතැන්සිට වයඹ දෙසට හා උතුරු දෙසට අංක 318 සී තිහාරිය උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද; එතැන්සිට, නිරිත දෙසට කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක 321 ඒ කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද; එතැන්සිට දකුණු දෙසට අංක 321 ඒ කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 321 ඒ කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම හමුවන තෙක්ද;

බටහිර -

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට නිරිත, වයඹ, උතුරු දෙසට අංක 321 ඒ කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 321 ඒ කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම මුණගැසෙන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට උතුරු, වයඹ දෙසට අංක 321 ඒ කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය කරමින් අංක 322 බී තිරිවානේගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට වයඹ, නිරිත දෙසට අංක 322 බී තිරිවානේගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 323 ඒ සපුගස්තැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත, ගිණිකොන, දකුණු දෙසට අංක 323 ඒ සපුගස්තැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 323 ඒ සපුගස්තැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම මුණගැසෙන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට නිරිත බටහිර, වයඹ දෙසට අංක 323 ඒ සපුගස්තැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ දකුණු මායිම ඔස්සේ අංක 323 ඒ සපුගස්තැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍ය දක්වාද; එතැන්සිට ඊසාන දෙසට අංක 323ඒ සපුගස්තැන්න ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ අංක 322 බී තිරිවානේගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන, වයඹ දෙසට අංක 322බී තිරිවානේගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ අංක 322 බී තිරිවානේගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට අංක 322 බී තිරිවානේගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ ගිණිකොන, දකුණ, ගිණිකොන දෙසට අංක 322 බී තිරිවානේගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම මුණගැසෙන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට අංක 322 බී තිරිවානේගම දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණ දෙසට අංක 321 කලගෙඩිහේන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට අංක 321 කලගෙඩිහේන ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ ඊසාන, වයඹ, උතුර, ඊසාන, වයඹ, උතුරු දෙසට ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

3.1.4.9 ආයතනික කලාපය

උතුර -

අංක 347 උදම්විට ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම හා අංක 348 එල් නිට්ටඹුව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය ආරම්භක ලක්ෂ්‍යය ලෙස ගෙන එතැන්සිට ගිණිකොණ දෙසට අංක 348 එල් නිට්ටඹුව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ අංක 348 නිට්ටඹුව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද; එතැන්සිට ඊසාන දෙසට අංක 348 නිට්ටඹුව උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ උතුරු මායිම ඔස්සේ කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද;

නැගෙනහිර -

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට නිරිත දෙසට කොළඹ - නුවර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ කටුනායක - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වාද ;

දකුණ -

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බටහිර දෙසට කටුනායක - රුවන්වැල්ල මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ අංක: 348 එල් නිට්ටඹුව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වාද ;

බටහිර -

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට උතුරු දෙසට අංක: 348 එල් නිට්ටඹුව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බටහිර මායිම ඔස්සේ ආරම්භක ලක්ෂ්‍යය දක්වාද වේ.

3.1.5 කලාප වර්ගීකරණය හා නිර්දේශිත භාවිතයන්

සියළු නම් කරන ලද කලාප තුළ අනුමැතිය දියහැකි භාවිතයන් පිළිබඳව විස්තර පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතුය.

i. සියළු භාවිතයන් ප්‍රදේශයේ ස්වරූපයට අනුකූල විය යුතුය.

ii. ප්‍රදේශයේ පවතින භෞතික හා සාමාජීය අපරවියුහ පහසුකම්වලට බාධාවක් හෝ අහිතකර බලපෑමක් ඇති නොවිය යුතුය.

iii. පරිසර දූෂණය වීමක් හෝ වෙනත් ආකාරයක අවහිරවීමක් ඇති නොවිය යුතුය.

iv. වාහන ගමනාගමනයට අවහිර වීමක් නොවිය යුතුය. තවද අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව විසින් කලින් කලට ප්‍රදේශයේ ඇතිවන සංවර්ධනයට සමගාමීව කරනු ලබන අධ්‍යයනයන්ට යටත්ව සංවර්ධනයන් සඳහා වෙන් කළ යුතු වාහන නැවතුම් පලවල් සංඛ්‍යාව පිළිබඳව තීරණය වන අතර, ඒ සඳහා පනවනු ලබන කොන්දේසිවලට අනුකූල විය යුතුය. තවද භූමිය තුළම අවශ්‍ය වාහන ගාල් ප්‍රමාණයන් සැකසීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.

v. අත්තනගල්ල නාගරික ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද මෙම සංවර්ධන සැලැස්මෙහි ඇමුණුම V අනුව ගොඩනැගිලි සීමා හා මාර්ග රක්ෂිත තැබිය යුතුය.

vi. සියළු සංවර්ධනයන් ඇමුණුම I හි දක්වා ඇති ඒ ඒ කලාපයන්ට අදාල වන අවම බිම් ප්‍රමාණයන්ට අනුකූල විය යුතුය.

vii. ඇමුණුම III හි දක්වා ඇති රක්ෂිතයන්ට (ඔය හා ඇල) අනුකූල විය යුතුය.

viii. නේවාසිකාගාර සඳහා ගොඩනැගිලි ඉදිකිරීමේදී ඇමුණුම IV හි සඳහන් රෙගුලාසිවලට අනුකූල විය යුතු වේ.

ix. සියළුම කලාපවල සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් අත්තනගල්ල සංවර්ධන සැලැස්මෙහි කලාපීකරණ සැලැස්මේ **"සැලසුම් සහ ගොඩනැගිලි රෙගුලාසි "** වලට අනුකූල විය යුතුය.

x. වාණිජ කලාපයේ හැර කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගයට මුහුණ ලා පවතින භූමීවල සිදුවන අනුබෙදුම් හා සංවර්ධන කටයුතු පහත සඳහන් නියමයන්ට අනුකූලව විය යුතුය.

   අ. ඉඩමේ අවම භූමි ප්‍රමාණය වර්ග මීටර් 500 ක් විය යුතු අතර අවම මුහුණත පළල මීටර් 06 ක් විය යුතුය.

   ආ. වර්ග මීටර් 100 ක් හෝ ඊට අඩු ගොඩනැගිල්ලක් සඳහා අවම වශයෙන් එක් වාහන නැවතුම් ස්ථානයක් තැබිය යුතු අතර වැඩිවන සෑම වර්ග මීටර් 100 ක් හෝ කොටසක් සඳහා අමතර වාහන නැවතුම් ස්ථාන තැබිය යුතුය. ගාස්තු ගෙවීමට යටත්ව වාහන ගාල් අවලංගු කිරීම සඳහා අවසර දෙනු නොලැබේ.

xi. අත්තනගල්ල නාගරික ප්‍රදේශය තුල පිහිටා ඇති වතුපිටිවල හා මල්වත්ත ආයෝජන ප්‍රවර්ධන කලාප තුළ ආයෝජන මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන කර්මාන්ත හා අනෙකුත් අදාල භාවිතයන් සඳහා අවසර දෙනු ලැබේ.

3.1.5.1 විශේෂ නේවාසික කලාපය

3.1.5.1.1 විශේෂ නේවාසික කලාපය තුළ පහත සඳහන් භාවිතයන් සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ.

i. නේවාසික ගොඩනැගිලි

ii. පාසැල්

iii. අධ්‍යාපන ආයතන

iv. ප්‍රජා සංවර්ධන ආයතන
v. දිවා සුරැකුම් මධ්‍යස්ථාන
vi. වැඩිහිටි නිවාස හා වෙනත් ආබාධිත පුද්ගලයන් සඳහා නිවාස
vii. නේවාසිකාගාර
viii. ග්‍රාමීය රෝහල්
ix. වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන
x. වෛද්‍ය සායන
xi. වෘත්තීයමය කාර්යාල
xii. රාජ්‍ය සේවා මධ්‍යස්ථාන
xiii. සමාජ සේවා හා සංස්කෘතික මධ්‍යස්ථාන
xiv. සිනමාශාලා
xv. මුද්‍රණාල (ඊයම් උණු නොකරන)
xvi. බේකරි
xvii. සුසාන භූමි
xviii. අවමංගල්‍ය සේවා මධ්‍යස්ථාන
xix. උද්‍යාන හා ක්‍රීඩා භූමි
xx. ගෘහස්ථ ක්‍රීඩාංගන
xxi. විනෝද කටයුතු මධ්‍යස්ථාන
xxii. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන වර්ග මීටර් 100ට නොවැඩි කර්මාන්ත
xxiii. ආගමික සිද්ධස්ථාන
xxiv. ප්‍රදර්ශන භූමි
xxv. හෝටල්
xxvi. නිවාඩු නිකේතන
xxvii. විනෝද හා සංචාරක කටයුතුවලට අනුකූල සංවර්ධනයන්
xxviii. බැංකු හා මූල්‍ය ආයතන
xxix. ආපනශාලා
xxx. වාණිජ ෙගාඩනැගිලි
xxxi. තොග වෙළඳාම් කටයුතු
xxxii. ඉන්ධන පිරවුම්හල් හා සේවා මධ්‍යස්ථාන
xxxiii. සුපිරි වෙළඳ සංකීර්ණ
xxxiv. මහල් නිවාස
xxxv. ගබඩා (රසායනික හෝ පුපුරන ද්‍රව්‍ය නොවන)
xxxvi. වාහන අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන
xxxvii. රථගාල්

3.1.5.2.2 සියළුම සේවා කර්මාන්ත, අන්තරාදායක ද්‍රව්‍ය සඳහා වූ ගබඩා සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ හා අදාල ආයතනවල නිර්දේශය ලබාගත යුතුය.

3.1.5.2.3 නිර්දේශිත කර්මාන්ත සඳහා සේවක සංඛ්‍යාව 10 නොඉක්මවිය යුතුය. එහි භාවිත කරන යන්ත්‍රවල ධාරිතාව අශ්වබල 5ට අඩු හා නිකුත් වන ශබ්ද මට්ටම ඩෙසිබල් 52ට

iv. ප්‍රජා සංවර්ධන ආයතන

v. දිවා සුරැකුම් මධ්‍යස්ථාන

vi. වැඩිහිටි නිවාස හා වෙනත් ආබාධිත පුද්ගලයන් සඳහා නිවාස

vii. ග්‍රාමීය රෝහල්

viii. වෛද්‍ය සායන

ix. බාහිර වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන

x. වර්ග මීටර් 100ට නොවැඩි වෘත්තීයමය කාර්යාල

xi. වර්ග මීටර් 50ට නොවැඩි වාණිජ ගොඩනැගිලි

xii. වර්ග මීටර් 100ට නොවැඩි භෝජන ශාලා

xiii. රාජ්‍ය සේවා මධ්‍යස්ථාන

xiv. සමාජ සේවා හා සංස්කෘතික ආයතන

xv. උද්‍යාන හා ක්‍රීඩා භූමි

xvi. ගෘහස්ථ ක්‍රීඩාංගන හා විනෝද කටයුතු ස්ථාන

xvii. ආගමික සිද්ධස්ථාන

xviii. සුසාන භූමි

xix. වර්ග මීටර් 50ට නොවැඩි ගෘහස්ථ කර්මාන්ත

xx. පුස්තකාල

xxi. බේකරි

xxii. රථගාල්

3.1.5.1.2 නිර්දේශිත කර්මාන්ත සඳහා සේවක සංඛ්‍යාව 10 නොඉක්මවිය යුතුය. එහි භාවිත කරන යන්ත්‍රවල ධාරිතාව අශ්වබල 5ට අඩු හා නිකුත් වන ශබ්ද මට්ටම ඩෙසිබල් 52ට අඩු විය යුතුය. එම කර්මාන්ත සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයද අත්තනගල්ල ප්‍රාදේශීය සභාවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රය ද ලබා ගත යුතුය.

3.1.5.2 ප්‍රාථමික නේවාසික කලාපය I, II හා III

3.1.5.2.1 ප්‍රාථමික නේවාසික කලාප තුළ පහත සඳහන් භාවිතයන් සඳහා අනුමැතිය දෙනු ලැබේ.

i. නේවාසික ගොඩනැගිලි

ii. පාසැල්

iii. අධ්‍යාපන ආයතන

iv. ප්‍රජා සංවර්ධන ආයතන
v. දිවා සුරැකුම් මධ්‍යස්ථාන
vi. වැඩිහිටි නිවාස හා වෙනත් ආබාධිත පුද්ගලයන් සඳහා නිවාස
vii. නේවාසිකාගාර
viii. ග්‍රාමීය රෝහල්
ix. වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන
x. වෛද්‍ය සායන
xi. වෘත්තීයමය කාර්යාල
xii. රාජ්‍ය සේවා මධ්‍යස්ථාන
xiii. සමාජ සේවා හා සංස්කෘතික මධ්‍යස්ථාන
xiv. සිනමාශාලා
xv. මුද්‍රණාල (ඊයම් උණු නොකරන)
xvi. බේකරි
xvii. සුසාන භූමි
xviii. අවමංගල්‍ය සේවා මධ්‍යස්ථාන
xix. උද්‍යාන හා ක්‍රීඩා භූමි
xx. ගෘහස්ථ ක්‍රීඩාංගන
xxi. විනෝද කටයුතු මධ්‍යස්ථාන
xxii. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන වර්ග මීටර් 100ට නොවැඩි කර්මාන්ත
xxiii. ආගමික සිද්ධස්ථාන
xxiv. ප්‍රදර්ශන භූමි
xxv. හෝටල්
xxvi. නිවාඩු නිකේතන
xxvii. විනෝද හා සංචාරක කටයුතුවලට අනුකූල සංවර්ධනයන්
xxviii. බැංකු හා මූල්‍ය ආයතන
xxix. ආපනශාලා
xxx. වාණිජ ෙංගාඩනැගිලි
xxxi. තොග වෙළඳාම් කටයුතු
xxxii. ඉන්ධන පිරවුම්හල් හා සේවා මධ්‍යස්ථාන
xxxiii. සුපිරි වෙළඳ සංකීර්ණ
xxxiv. මහල් නිවාස
xxxv. ගබඩා (රසායනික හෝ පුපුරන ද්‍රව්‍ය නොවන)
xxxvi. වාහන අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන
xxxvii. රථගාල්

3.1.5.2.2 සියළුම සේවා කර්මාන්ත, අන්තරාදායක ද්‍රව්‍ය සඳහා වූ ගබඩා සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ හා අදාල ආයතනවල නිර්දේශය ලබාගත යුතුය.

3.1.5.2.3 නිර්දේශිත කර්මාන්ත සඳහා සේවක සංඛ්‍යාව 10 නොඉක්මවිය යුතුය. එහි භාවිත කරන යන්ත්‍රවල ධාරිතාව අශ්වබල 5ට අඩු හා නිකුත් වන ශබ්ද මට්ටම ඩෙසිබල් 52ට

අඩු විය යුතුය. එම කර්මාන්ත සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයද අත්තනගල්ල ප්‍රාදේශීය සභාවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රය ද ලබා ගත යුතුය.

3.1.5.2.4 ප්‍රාථමික නේවාසික කලාපය තුළ සිසුන් 30ට වැඩි හෝ වර්ගමීටර් 30ට වැඩි උපකාරක පංති සඳහා අවසර දෙනු නොලැබේ.

3.1.5.2.5 දිවා සුරුකුම් මධ්‍යස්ථාන හා වැඩිහිටි නිවාස සඳහා අවම බිම් ප්‍රමාණය පර්චස් 20 විය යුතුය.

3.1.5.2.6 නේවාසිකාගාර සඳහා ගොඩනැගිලි ඉදිකිරීමෙහිදී ඇමුණුම **IV**හි සඳහන් රෙගුලාසිවලට අනුකූල විය යුතුය.

3.1.5.3 වාණිජ කලාපය I හා II

3.1.5.3.1 වාණිජ කලාප තුළ පහත සඳහන් භාවිතයන් සඳහා අනුමැතිය දෙනු ලැබේ.

i. වාණිජ ගොඩනැගිලි
ii. ආපනශාලා
iii. බැංකු සහ මූල්‍ය ආයතන
iv. සිනමාශාලා සහ විවේක කටයුතු ප්‍රදේශ
v. වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන
vi. වෘත්තීයමය කාර්යාල
vii. ඉන්ධන පිරවුම්හල්
viii. නේවාසික ගොඩනැගිලි
ix. ආගන්තුක නිවාස හා ලැගුම්හල්
x. බේකරි
xi. මුද්‍රණාල
xii. වාහන ප්‍රදර්ශනාගාර හා විකුණුම් මධ්‍යස්ථාන
xiii. බයිසිකල් හා වාහන අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන
xiv. විදුලි උපකරණ අළුත්වැඩියා කරන ස්ථාන
xv. රථගාල්
xvi. මස් වෙළඳසැල්
xvii. අවමංගල සේවා මධ්‍යස්ථාන
xviii. හෝටල්
xix. අධ්‍යාපන ආයතන
xx. ප්‍රජා සංවර්ධන ආයතන
xxi. දිවා සුරුකුම් මධ්‍යස්ථාන
xxii. නේවාසිකාගාර
xxiii. රාජ්‍ය සේවා මධ්‍යස්ථාන
xxiv. සමාජ සේවා හා සංස්කෘතික මධ්‍යස්ථාන
xxv. උද්‍යාන හා ක්‍රීඩා භූමි

xxvi. ගෘහස්ථ ක්‍රීඩාංගන
xxvii. විනෝද කටයුතු මධ්‍යස්ථාන
xxviii. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන වර්ග මීටර් 100ට නොවැඩි කර්මාන්ත
xxix. ප්‍රදර්ශන මධ්‍යස්ථාන
xxx. විනෝද හා සංචාරක කටයුතුවලට අනුකූල සංවර්ධනයන්
xxxi. තොග වෙළඳ මධ්‍යස්ථාන
xxxii. සුපිරි වෙළඳ සංකීර්ණ
xxxiii. මහල් නිවාස
xxxiv. ගබඩා
xxxv. වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන

3.1.5.3.2 සියළුම සේවා කර්මාන්ත හා අන්තරාදායක ද්‍රව්‍ය සඳහා වූ ගබඩා සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ හා අදාල ආයතනවල නිර්දේශය ලබා ගත යුතුය.

3.1.5.4 මිශ්‍ර සංවර්ධන කලාපය I හා II

3.1.5.4.1 මිශ්‍ර සංවර්ධන කලාප තුළ පහත සඳහන් භාවිතයන් සඳහා අනුමැතිය දෙනු ලැබේ.

i. නේවාසික ගොඩනැගිලි
ii. පාසැල්
iii. අධ්‍යාපන ආයතන
iv. ප්‍රජා සංවර්ධන ආයතන
v. දිවා සුරැකුම් මධ්‍යස්ථාන
vi. වෘත්තීයමය කාර්යාල
vii. වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන
viii. නේවාසිකාගාර
ix. රාජ්‍ය සේවා මධ්‍යස්ථාන
x. සමාජ සේවා හා සංස්කෘතික මධ්‍යස්ථාන
xi. සිනමාශාලා
xii. මුද්‍රණාල (ඊයම් උණු නොකරන)
xiii. බේකරි
xiv. සුසාන භූමි
xv. අවමංගල සේවා මධ්‍යස්ථාන
xvi. උද්‍යාන හා ක්‍රීඩා භූමි
xvii. ගෘහස්ථ ක්‍රීඩාංගන
xviii. විනෝද කටයුතු මධ්‍යස්ථාන
xix. ආගමික සිද්ධස්ථාන
xx. මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන වර්ග මීටර් 100ට නොවැඩි කර්මාන්ත

xxi. ප්‍රදර්ශන භූමි

xxii. හෝටල්

xxiii. නිවාඩු නිකේතන

xxiv. විනෝද හා සංචාරක කටයුතුවලට අනුකූල සංවර්ධනයන්

xxv. බැංකු හා මූල්‍ය ආයතන

xxvi. ආපනශාලා

xxvii. වාණිජ ගොඩනැගිලි

xxviii. තොග වෙළඳාම් කටයුතු

xxix. ඉන්ධන පිරවුම්හල් හා සේවා මධ්‍යස්ථාන

xxx. සුපිරි වෙළඳ සංකීර්ණ

xxxi. මහල් නිවාස

xxxii. ගබඩා (රසායනික හෝ පුපුරණ ද්‍රව්‍ය නොවන)

xxxiii. වාහන අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන

xxxiv. රථගාල්

xxxv. මස් වෙළඳසැල්

xxxvi. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන

xxxvii. ලී මෝල්

3.1.5.4.2 ගබඩා, ලී මෝල්, ඉන්ධන පිරවුම්හල් හා සේවා මධ්‍යස්ථාන සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ හා අදාල ආයතනවල නිර්දේශය ලබා ගත යුතුය.

3.1.5.5 ආයතනික කලාපය

3.1.5.5.1 ආයතනික කලාපය තුළ පහත සඳහන් භාවිතයන් සඳහා අවසර දෙනු ලැබේ.

i. නේවාසික ගොඩනැගිලි

ii. පොදු ගොඩනැගිලි

iii. පරිපාලන සංකීර්ණ

iv. අධ්‍යාපන ආයතන හා පුහුණු කිරීමේ ආයතන

v. මහජන රැස්වීම් ශාලා

vi. සංස්කෘතික මධ්‍යස්ථාන හා සමාජ සේවා මධ්‍යස්ථාන

vii. නිළ නිවාස

viii. විනෝද කටයුතු ප්‍රදේශ

ix. බැංකු හා මූල්‍ය ආයතන

xxi. ප්‍රදර්ශන භූමි

xxii. හෝටල්

xxiii. නිවාඩු නිකේතන

xxiv. විනෝද හා සංචාරක කටයුතුවලට අනුකූල සංවර්ධනයන්

xxv. බැංකු හා මූල්‍ය ආයතන

xxvi. ආපනශාලා

xxvii. වාණිජ ගොඩනැගිලි

xxviii. තොග වෙළඳාම් කටයුතු

xxix. ඉන්ධන පිරවුම්හල් හා සේවා මධ්‍යස්ථාන

xxx. සුපිරි වෙළඳ සංකීර්ණ

xxxi. මහල් නිවාස

xxxii. ගබඩා (රසායනික හෝ පුපුරණ ද්‍රව්‍ය නොවන)

xxxiii. වාහන අළුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථාන

xxxiv. රථගාල්

xxxv. මස් වෙළඳසැල්

xxxvi. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන

xxxvii. ලී මෝල්

3.1.5.4.2 ගබඩා, ලී මෝල්, ඉන්ධන පිරවුම්හල් හා සේවා මධ්‍යස්ථාන සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ හා අදාල ආයතනවල නිර්දේශය ලබා ගත යුතුය.

3.1.5.5 ආයතනික කලාපය

3.1.5.5.1 ආයතනික කලාපය තුළ පහත සඳහන් භාවිතයන් සඳහා අවසර දෙනු ලැබේ.

i. නේවාසික ගොඩනැගිලි

ii. පොදු ගොඩනැගිලි

iii. පරිපාලන සංකීර්ණ

iv. අධ්‍යාපන ආයතන හා පුහුණු කිරීමේ ආයතන

v. මහජන රැස්වීම් ශාලා

vi. සංස්කෘතික මධ්‍යස්ථාන හා සමාජ සේවා මධ්‍යස්ථාන

vii. නිළ නිවාස

viii. විනෝද කටයුතු ප්‍රදේශ

ix. බැංකු හා මූල්‍ය ආයතන

x. වර්ග මීටර් 100ට නොවැඩි හෝටල් හා ආපන ශාලා
xi. වර්ග මීටර් 100ට නොවැඩි වාණිජ ගොඩනැගිලි
xii. වෘත්තීයමය කාර්යාල
xiii. රථගාල්

3.2 සැලසුම් සහ ගොඩනැගිලි රෙගුලාසි

1986 මාර්තු 10 වන දින අංක 392/9 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසිවලට අනුව අත්තනගල්ල නගරයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක විය.

3.3 උපදේශක සැලසුම්

අත්තනගල්ල නාගරික ප්‍රදේශය සඳහා වූ සංවර්ධන දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා අරමුණු හඳුනාගන්නා ලද අතර එම අරමුණු කරා එළඹීම සඳහා උපාය මාර්ග කීපයක් මෙම සැලැස්මේදී යෝජනා කරන ලදී. උපදේශක සැලසුම් පිළියෙල කිරීම එක් උපාය මාර්ගයක් වන අතර පහත සඳහන් උපදේශක සැලසුම් අත්තනගල්ල නාගරික ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලදී.

3.3.1 නේවාසික සංවර්ධන සැලැස්ම
3.3.2 මාර්ග සංවර්ධනය හා රථවාහන කළමණාකරන සැලැස්ම
3.3.3 තෙත් බිම් සංරක්ෂණ සැලැස්ම

මෙම උපදේශක සැලැසුම් වල ප්‍රධාන පරමාර්ථය වන්නේ විශ්ලේෂණයේදී හඳුනා ගන්නා ලද කඩිනමින් සංවර්ධනය විය යුතු අංශ හා ප්‍රදේශ ප්‍රමුඛතාවය මත පෙළගස්වා ඉදිරි වසර 18ක කාල වකවානුව තුල ක්‍රමානුකූල සංවර්ධන ක්‍රියාවලියක් සඳහා නගරය යොමු කිරීමයි.

3.3.1 නේවාසික සංවර්ධන සැලැස්ම

අත්තනගල්ල නාගරික ප්‍රදේශයේ 2008 වර්ෂයට පවතින නිවාස භිගය 585 ක් වන බවට නිවාස පිළිබඳ විශ්ලේෂණයේදී අනාවරණය විය. ජනගහන වර්ධනයත් සමග සැලසුම් කාල සීමාව වන ඉදිරි වර්ෂ 18 තුල නාගරික නිවාස අවශ්‍යතාවය වෙළුම I හි වගුව 10 න් පුරෝකථනය කර ඇති ආකාරයට කාලානුරූපීව සැලසුම් කිරීමට මෙම සැලැස්මෙන් අපේක්ෂා කෙරේ.

මෙම නිවාස වර්ගීකරණය කිරීමේදී අත්තනගල්ල නාගරික ප්‍රදේශයේ ජනතාවට නිවාස සඳහා ඇති ක්‍රයශක්තිය සැලකිල්ලට ගත් අතර මූලික නිර්නායකයන් ලෙස ආදායම් මට්ටම විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගෙන් 37% සමෘධිලාභීන් බව අනාවරණය වූ අතර ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව අනුව නිවාස සැපයිය යුතු බවට තීරණය විය. ඒ අනුව නිවාස අවශ්‍යතාවයෙන් 40% අඩු වියදම් නිවාස ලෙසත් ඉතිරි 60% මධ්‍යම පාංතික නිවාස ලෙසත් ඉදිකිරීමට තීරණය කරන ලදී. අඩු වියදම් නිවාසයක උපරිම වර්ග ප්‍රමාණය වර්ග අඩි 500 ට සීමා වන අතර වියදම වර්ග අඩියට රු 2000/- ක උපරිමයකට යටත් ලෙස සැලකේ.

අත්තනගල්ල නාගරික ප්‍රදේශය තුල යෝජිත කලාපීකරණයට අනුකූලවන පරිදි නිවාස සඳහා යෝග්‍ය ඉඩම් පවතින ප්‍රදේශ නිවාස ඉදි කිරීම සඳහා මූලික වශයෙන් හඳුනාගන්නා ලදී. මෙහිදී මෙම ප්‍රදේශ සඳහා නේවාසික අපරව්‍යූහ පහසුකම් සැපයීමට ඇති හැකියාවද සැලකිල්ලට ගන්නා ලදී. මූලික වශයෙන් වර්තමානයේදී පවතින නිවාස හිඟය වන නිවාස 585 ඉදි කිරීම සඳහා යෝග්‍ය ඉඩම් හඳුනාගන්නා ලද අතර ඒ පිළිබඳ විස්තර පහත වගුව 01හි දැක්වේ. ඒ සඳහා පිලියෙල කරන ලද සංකල්ප සැලසුම් රූප 02 හා 03 හි දක්වා ඇත.

වගුව 01

වර්තමාන නිවාස හිඟය සඳහා යෝග්‍ය ඉඩම්

යෝජිත භූමිය	ඉඩම් අයිතිය	පවතින ඉඩම් ප්‍රමාණය		නිවාස ගණන - 2008		ඇස්තමේන්තු වියදම් (රු.මි.)
		ප්‍රමාණය (අක්)	ස්වභාවය	අඩු වියදම්	අනෙකුත්	
ආහාර ගබඩා භූමිය - වේයන්ගොඩ	ආහාර දෙපාර්තමේන්තුව	2	හිස්	-	120	300.00
රන්පොකුණගම B කලාපය	නිවාස සංවර්ධන අධිකාරිය	7	හිස්	-	231	577.50
රන්පොකුණගම D කලාපය	නිවාස සංවර්ධන අධිකාරිය	9	හිස්	234	-	117.00

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2008

මෙම නිවාස 585 ඉහත ඉඩම් තුල කඩිනමින් ඉදි කළ හැකි අතර වර්ෂ 2013 තුලදී ඉදිකිරීම් ආරම්භ කළයුතු ලෙස යෝජනා කෙරේ. මෙහිදී ඉදිකළ යුතු අඩු වියදම් නිවාස රජයේ මැදිහත් වීමෙන් නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස යෝජනා ක්‍රමයක් ලෙස ඉදි කිරීමට යෝජනා කෙරේ. අනෙකුත් නිවාස කඩිනමින් ඉදිකිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය අපේක්ෂා කරන අතර එම නිවාස සංකල්ප සැලසුම් වලට අනුකූලව බද්ධ ව්‍යාපෘති ලෙස ඉදි කිරීම සඳහා හඳුනාගත් ඉඩම් බැහැර කිරීමට යෝජනා කෙරේ.

මෙම සංවර්ධන සැලැස්මේදී අත්තනගල්ල නාගරික ප්‍රදේශය සංවර්ධනය වීමේ ප්‍රවණතාවය සැලකිල්ලට ගනිමින් සැලසුම් කලාප 4කට බෙදා සංවර්ධන යෝජනා ඉදිරිපත් කෙරේ (සිතියම් අංක 02). වර්ෂ 2030 වන විට අත්තනගල්ල නාගරික ප්‍රදේශයේ මුළු නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා යෝග්‍ය ඉඩම් සිතියම් අංක 02හි දැක්වෙන අතර එයට අදාල ඉඩම් හා නිවාස ඉදිවීමේ නැඹුරුතාවයන් ප්‍රමුඛතාවය මත පහත සඳහන් වගු අංක 02 මගින්ද නිරූපනය කෙරේ.

ආදර්ශ නේවාසික අනුබෙදුමක්

රන්පොකුණගම බී කලාපය



භූම ප්‍රමාණය - හෙක්. 2.8

ඉඩම් කට්ටි ගණන - 67

ඉඩම් කට්ටියක ප්‍රමාණය - පර් 10



පරිමාණය :- 1 : 2500

රූපය 02

ආදර්ශ නේවාසික අනුබෙදුමක්

රන්පොකුණගම බී කලාපය



භූමි ප්‍රමාණය - හෙක්. 2.8

ඉඩම් කට්ටි ගණන - 67

ඉඩම් කට්ටියක ප්‍රමාණය - පර් 10

පරිමාණය :- 1 : 2500

රූපය 03

ආදර්ශ නේවාසික අනුබෙදුමක්

රන්පොකුණගම ඩී කලාපය



භූමි ප්‍රමාණය - හෙක්. 0.8

ඉඩම් කට්ටි ගණන - 35

ඉඩම් කට්ටියක ප්‍රමාණය - පර්. 6

පරිමාණය :- 1 : 800

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

සිතියම් අංක 02

අපේක්ෂිත නේවාසික සංවර්ධන ප්‍රදේශ
අත්තනගල්ල නාගරික ප්‍රදේශය



N

පදුනාගත් ඉඩම්

ඉඩම් අංක 1 - හෙක්. 07	
ඉඩම් අංක 2 - හෙක්. 28	
ඉඩම් අංක 3 - හෙක්. 18	
ඉඩම් අංක 4 - හෙක්. 19	
ඉඩම් අංක 5 - හෙක්. 22	
ඉඩම් අංක 6 - හෙක්. 20	
ඉඩම් අංක 7 - හෙක්. 30	

අත්තනගල්ල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය

අත්තනගල්ල නාගරික ප්‍රදේශය

පරිමාණය :- 1 : 100,000

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

වගුව 02

අපේක්ෂිත නේවාසික සංවර්ධනය

සැලසුම් කලාපය	කාල පරාසය	නේවාසික සඳහා පවතින ඉඩම් ප්‍රමාණය (හෙක්.)	නිවාස ගණන	
			අඩු වියදම්	අනෙකුත්
			40%	60%
කලාප 1	2013-2015	15	1880	2820
කලාප 2	2015-2020	18	1096	1645
කලාප 3	2020-2025	61	1260	1892
කලාප 4	2025-2030	30	1450	2175

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2008

ඉහත වගු අංක 2 අනුව සැලසුම් කාල සීමාව තුලදී ඇතිවන නිවාස අවශ්‍යතාවය ක්‍රමානුකූලව ඒ ඒ ප්‍රමුඛතා කලාපය තුල සංවර්ධනය වීමට අවශ්‍ය මූලික නේවාසික යටිතල පහසුකම්ද සැපයීමට යෝජනා කෙරේ. ඒ අනුව මූලික වශයෙන් ජල නල පහසුකම් සඳහා අවධානය යොමු කළ අතර දැනට මෙම ප්‍රදේශයේ පවතින ජල ධාරිතාවට අමතරව ඉදිරි වසර වලදී ඇතිවන අවශ්‍යතාවය නේවාසික සංවර්ධනයට සමගාමීව ඇස්තමේන්තු කර ඇත. එම පහසුකම් ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ඉදිරි සැලසුම්වලට අන්තර්ග්‍රහණය කර ක්‍රියාත්මක විය යුතු බවට යෝජනා කෙරේ.

විදුලිය සැපයීම සැලකීමේදී මෙම ප්‍රදේශ සඳහා ෙනේවාසික සංවර්ධනයට අවශ්‍ය විදුලිය පහසුකම් දැනට පවතින ධාරිතාව තුල සැපයීමට හැකියාවක් ඇති බව අනාවරණය වී ඇත. එහෙත් අපේක්ෂිත සංවර්ධන උද්දීපන ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන විදුලිය ධාරිතාවය අනෙකුත් අපරව්‍යුහ පහසුකම් අවශ්‍යතාවයට සාපේක්ෂව සැපයීමට යෝජනා කෙරේ.

මීට අමතරව නේවාසික සංවර්ධනය සඳහා අවශ්‍ය මූලික පහසුකම් වන සනීපාරක්ෂක කටයුතු තවදුරටත් ගෘහස්ථ මට්ටමින් වෙන් වෙන්ව සපයා ගැනීමට අපේක්ෂා කෙරේ. එනමුදු වාණිජ සංවර්ධනය සඳහා සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සඳහා වන සනීපාරක්ෂක පහසුකම් සහ අපරව්‍යුහ පහසුකම් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතුලත් කිරීමට යෝජිතය.

අදාල නේවාසික සංවර්ධන යෝජනා තුල වැදගත් වන අනෙකුත් ප්‍රධාන අපරව්‍යුහ පහසුකම් ලෙස මාර්ග සංවර්ධනය හා ප්‍රවාහන පහසුකම් සැපයීමට වැදගත් වන බැවින් වගුව 03 හි දැක්වෙන මාර්ග වල සංවර්ධන කටයුතු සිදු කළ යුතු අතර ඒවා අදාල කාල පරාසයන්ට අනුකූල වන පරිදි සිදු කළ යුතු බව යෝජනා කෙරේ.

වගුව 03

අනාගත නිවාස සංවර්ධන ප්‍රදේශ සඳහා සංවර්ධනය කළ යුතු මාර්ග

කාල පරාසය	මාර්ගය	දිග (කි.මී.)	විස්තරය
2012 – 2015	කළගෙඩිහේන - වේයන්ගොඩ පාර	4.1	මංතීරු 2ක් වන පරිදි තාර දමා දෙපස පදික වේදිකා සහිතව සංවර්ධනය කළ යුතුය
2015 – 2020	කටුවස්ගොඩ - වේයන්ගොඩ පාර	2.2	තාර දමා දෙපස පදික ප්‍රදේශ සංවර්ධනය කළ යුතුය
2020 – 2025	නිවිටඹුව - වේයන්ගොඩ පාර	4.3	දෙපස පදික වේදිකා සංවර්ධනය කළ යුතුය

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2008

3.3.2 මාර්ග සංවර්ධනය හා රථවාහන කළමණාකරන සැලැස්ම

අත්තනගල්ල නගරයේ කාර්යක්ෂමතාවය හා තරහකාරිත්වය ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගැනීම සඳහා එහි මාර්ග පද්ධතිය උසස් මට්ටමින් තිබිය යුතු අතර ප්‍රවාහන රටාව ආරක්ෂාකාරී හා ක්‍රමවත්ව පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වේ. එබැවින් නගරය භාවිතා කරන ජනයාට දෛනික කටයුතු පහසුවෙන් ඉටුකර ගැනීම සඳහා මනා සේවයක් සලසා දීමට අවශ්‍ය මාර්ග සංවර්ධනය හා ප්‍රවාහන රටාව තුල සිදුකළ යුතුය.

අත්තනගල්ල නාගරික ප්‍රදේශය සඳහා යෝජිත නේවාසික සංවර්ධන හා අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහා අනාගතයේ ඇතිවන අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මාර්ග පද්ධතිය හා ප්‍රවාහන රටාව සැලසුම් කරනු ලැබේ.

3.3.2.1 මාර්ග සංවර්ධන සැලැස්ම

අත්තනගල්ල නගරයේ සංවර්ධන උද්දීපනයක් ඇති කිරීම සඳහා යෝජනා කර ඇති සංස්කෘතික මධ්‍යස්ථාන ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතියට සහ ජාතික ක්‍රීඩා සංකීර්ණයට අදාලව යෝජනා කර ඇති මාර්ග හා නේවාසික සංවර්ධන සැලැස්මේදී හඳුනාගන්නා ලද ප්‍රධාන මාර්ගද වගුව 04 හි සඳහන් පරිදි සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

වගුව 04

සංවර්ධනය කළ යුතු ප්‍රධාන මාර්ග

මාර්ගය	දිග (කි. මී.)	සංවර්ධනයේ ස්වභාවය	කාල වකවානුව
රුක්ගහවිල - මංගල තිරිය පාර	11.9	මංතීරු 2ක් වන පරිදි තාර දමා පදික වේදිකා සහිතව සංවර්ධනය කිරීම හා දෙපස ගස් සිටුවීම	2009 – 2015
කළගෙඩිහේන - වේයන්ගොඩ පාර	4.1	මංතීරු 2ක් වන පරිදි තාර දමා පදික වේදිකා සහිතව සංවර්ධනය කිරීම හා දෙපස ගස් සිටුවීම	2009 – 2015
කටුවස්ගොඩ - වේයන්ගොඩ පාර	2.2	මංතීරු දෙකක් සහිතව හා මාර්ගය දෙපස අඩි 5ක් පදික ප්‍රදේශයක් සහිතව සංවර්ධනය කිරීම	2010 – 2020
නිවිටඹුව - වේයන්ගොඩ පාර	4.3	මාර්ගය දෙපස අඩි 5ක් පදික ප්‍රදේශයක් සංවර්ධනය කිරීම	2010 - 2020
බණ්ඩාරනායක මාවත, වේයන්ගොඩ	-	පවතින දැමිරිය රක්ෂිත ඉඩම භූ දර්ශනය කිරීම හා මෙම මාර්ගයේ ප්‍රවේශය පුළුල් කිරීම	2015 - 2020

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය - 2010

මීට අමතරව ප්‍රදේශයේ පවතින මාර්ග පිළිබඳව සමීක්ෂණයක් කර සංවර්ධනය විය යුතු මාර්ග හඳුනාගෙන අනාගත අවශ්‍යතාවයන්ට සරිලන පරිදි හා පුළුල් කිරීමට හැකිවන පරිදි ගොඩනැගිලි සීමා යෝජනා කර ඇත. එම පිරිවිතරයන් මෙම සැලැස්මේ ඇමුණුම V හි සඳහන් කර ඇත.

3.3.2.2 රථ වාහන ගමනාගමන කළමණාකරනය

අත්තනගල්ල නාගරික ප්‍රදේශයේ ප්‍රධාන නගර දෙක වන නිට්ටඹුව හා වේයන්ගොඩ නගර මධ්‍යයන්හි රථ වාහන ගමනාගමනයේ හඳුනාගත් ගැටළු වලට විසඳුම් ලබා දීම තුලින් කාර්යක්ෂම නගරයක් බවට පත් කිරීමටත්, මහජනයා හට දෛනික කටයුතු පහසු කරලීමටත්, නගරයේ පවතින භූමීය ප්‍රශස්ථ භාවිතයක් සඳහා යෙදවීමටත්, නගරයේ වාහන තදබදය අවම කරලීමටත් අපේක්ෂා කරන අතර එතුලින් ප්‍රවාහන අංශයේ උපරිම ඵල ජනතාවට ලබා දීමටද බලාපොරොත්තු වේ.

අත්තනගල්ල නාගරික ප්‍රදේශයේ ප්‍රවාහනය පිළිබඳ සලකා බැලීමේදී ප්‍රධාන වශයෙන් පොදු ප්‍රවාහන සේවය පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. මෙම ප්‍රදේශය තුල පොදු ප්‍රවාහන සේවය ලංගම හා මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අයත් බස්රථ ඒකාබද්ධ සේවයක් ලෙස පවත්වා ගෙන යනු ලැබේ. එනමුත් මෙම බස්රථ ධාවනය ක්‍රමවත් රටාවකට අනුව සිදු නොවන බැවින් මහජනයා හට නොයෙකුත් ගැටළු වලට මුහුණ දීමට සිදුවේ. එබැවින් නිට්ටඹුව හා වේයන්ගොඩ බස් නැවතුම්පොලයන්හි බස් රථ ධාවනය ක්‍රමවත් කිරීමට හා කළමණාකරනය කිරීමට සැලසුම් කර ඇත. එනමුත් නිට්ටඹුව හා වේයන්ගොඩ බස් නැවතුම්පල ආශ්‍රිත ප්‍රදේශය සහ වේයන්ගොඩ දුම්රිය හරස් මාර්ගය අසල ප්‍රධාන වශයෙන් කාර්යාල වේලාවන්හිදී පවතින මාර්ග තදබදය සඳහා විසඳුම් ලබා දීම වැදගත් වේ.

3.3.2.3 නිට්ටඹුව නගර මධ්‍ය රථ වාහන ගමනාගමන කළමණාකරනය

නිට්ටඹුව නගර සංවර්ධනය ප්‍රධාන මාර්ගයෙන් ඇතුලත ප්‍රදේශයට ව්‍යාප්ත වී තිබීම නිසා නගරයේ ප්‍රධාන මාර්ග දෙපස පවතින වාහන තදබදය හා ගැටළු වෙනත් නගර හා සසඳන කළ අඩුවේ. එනමුත් බස් නැවතුම්පල ආශ්‍රිතව ප්‍රධාන වශයෙන් ගැටළු පවතින බව හඳුනාගෙන ඇත. මෙම බස් නැවතුමපලට පැමිණෙන හා පිටවී යන බස්රථ සඳහා නිශ්චිත මාර්ගෝපදේශයන් ලබා දී නොතිබීම නිසා එය තුල තදබදයක් ඇතිවී තිබෙන අතර මහජනයා හට අනාරක්ෂිත තත්වයක් මතු වී ඇත. එබැවින් මෙම බස් නැවතුම්පල ආශ්‍රිත ප්‍රදේශය සඳහා මනා සැලසුම්කරණයක් යෝජනා කිරීම හා එය ක්‍රියාත්මක කිරීම තුලින් මහජනයාගේ ආරක්ෂාව මෙම සැලැස්මේදී අපේක්ෂා කෙරේ. මේ අනුව නිට්ටඹුව නගර මධ්‍ය තුල බස්රථ ගමනා ගමනය ක්‍රමවත් හා නිශ්චිත ධාවන රටාවක් ඔස්සේ ගමන් කරවීම සඳහා සැලැසුම් කර ඇත (සිතියම් අංක 03).

නිට්ටඹුව බස් නැවතුම පල නගර මධ්‍යයේ පිහිටා ඇති අතර එය ගොඩනැගිලි දෙකකින් හා වේදිකා 34කින් සමන්විත වේ. නිට්ටඹුව බස් නැවතුම් පලෙහි බස් රථ ධාවන සටහන වගුව 05 හි දක්වා ඇත. බස් නැවතුම් පලෙහි වාහන හා මගී ගමනාගමනය සැලසුම් කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදී.

- ලංගම හා පුද්ගලික බස්රථ සමාන ගමනාන්ත සඳහා වේදිකා ආසන්නයේ ඇති කිරීම.
- බස්රථ පිටවීම හා ඇතුල්වීම ගමනාන්තයට අනුරූපව ස්ථානගත කිරීම
- බස්රථ ගමන් කරන කාල පරතරය සලකා බලා සමාන දිශාවන්ට ගමන් කරන ගමනාන්ත කිහිපයක් එක වේදිකාවකට සීමා කිරීම (වගුව 05).
- බස් නැවතුම්පල තුල බස්රථ ගමන් ගන්නා මාර්ගයේ මගී ගමනාගමනය අවම කිරීම.

- නගර මධ්‍යයේ වාහනවලින් තොර මගීන් සඳහා පමණක් වෙන්වූ ප්‍රදේශ ඇති කිරීම
- බස් රථ ධාවනය නිශ්චිත මාර්ගවලට පමණක් සීමා කිරීම
- බස් නැවතුම් පලට ආසන්නව රථ ගාලක් ඇති කිරීම.

මේ අනුව වේදිකා අංක 1 සිට 10 දක්වා කොළඹ දෙසට ධාවනය වන බස්රථ සඳහාද, වේදිකා අංක 11 සිට 19 දක්වා මහනුවර සහ වේයන්ගොඩ දෙසට ධාවනය වන බස්රථ සඳහාද, වේදිකා අංක 20 සිට 34 දක්වා අත්තනගල්ල දෙසට ධාවනය කරන බස්රථ සඳහා ද වේදිකා තීරණය කරන ලදී. තවද බස් නැවතුම් පලට පැමිණීම සිතියම් අංක 03 හි දක්වා ඇති ආකාරයට එක ස්ථානයකින් ඇතුළු වීමට තීරණය කරන ලදී.

මීට අමතරව බස් නැවතුමට යාබද භූමියේ පොදු රථ ගාලක් ඇති කිරීම තුලින් වාහන අවිධිමත් ලෙස නගරය පුරා නවතා තිබීමද පාලනය කිරීමට හැකිවනු ඇත.

සිතියම් අංක 03

නිට්ටඹුව නගර මධ්‍යයේ යෝජිත ප්‍රවාහන රටාව



- නුවර දෙසින්
- කොළඹ දෙසින්
- වේයන්ගොඩ දෙසින්
- අත්තනගල්ල දෙසින්
- අත්තනගල්ල දෙසින් වේයන්ගොඩ දෙසට
- කොළඹ දෙසට
- නුවර හා වේයන්ගොඩ දෙසට
- අත්තනගල්ල දෙසට

පරිමාණය :- 1 : 1500

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරී

වගුව 05

නිට්ටඹුව බස් නැවතුම් පලෙහි යෝජිත බස් රථ ධාවන සටහන

ගමන් කරන දිශාව	වෙදිකා අංක	මාර්ග අංකය	ගමනාන්තය	කාල පරතරය	අයිතිය	ගමන් කරන දිශාව
					ලංගම	පෞද්ගලික
කොළඹ දෙසට	1	180	කොළඹ	වි. 08		√
	2	180 (සුඛෝපභෝගී)	කොළඹ	වි. 15		√
	3	201	ගම්පහ	වි. 08		√
		201/2	ගම්පහ	වි. 10		√
	4	17/1	පානදුර	වි. -		√
		185/4	ඕගොඩපොළ	වි. 30		√
	5	180	කොළඹ	පැ. 01	√	
	6	181/1	එගොඩපොළ	වි. 20	√	
	7	206/2	ගම්පහ	පැ. 02	√	
	8	201/1	ගම්පහ	වි. 15	√	
	9	201	ජා- ඇල	වි. 15	√	
	10	180 (සුඛෝපභෝගී)	කොළඹ	වි. 60	√	
මහනුවර දෙසට	11	221	ගිරිඋල්ල	වි. 08		√
	12	670,	වරකාපොල	වි. 10		√
		987/1	අල්ගම පස්යාල නාඹුළුව හරහා	පැ. 02	√	
	13	885/1	මල්ලැහැව	පැ. 01	√	
	14	221/3	බාදුරාගොඩ	පැ. 01	√	
		429	මිරිගම	පැ. 04	√	
	15	196/1	හේනෙපොල	පැ. 01	√	
	16	353	වීරසූරිය කන්ද	පැ. 02	√	
	17	6/1	කුරුණෑගල	වි. 15	√	
	18	885	පල්ලෙවෙල	පැ. 01	√	
	19	245/1	ගුවන්තොටුපොළ	වි. 15	√	
අත්තනගල්ල දෙසට	20	182	හංවැල්ල	වි. 15	√	
		189	පස්යාල	පැ. 01	√	
	21	272	ගලපිටමඩ	වි. 20	√	
		272/1	ගලපිටමඩ(මහාකන්ද හරහා)	පැ. 02	√	
	22	987/2	ගලපිටමඩ	පැ. 02	√	
		987/1	අල්ගම	වි. 20	√	
		987	අල්ගම	වි. 20	√	
	23	185/6	රුක්මල්ගොඩ	පැ. 01	√	
		185/4	කිරිදිවැල	වි. 15	√	
	24	182/2	රන්පොකුණුගම	වි. 30	√	
	25	182/3	නඩුවත්ත	පැ. 01	√	
		185/2	වතුරගම	පැ. 01	√	
		185/3	වරපලාන	පැ. 01	√	
	26	189/1	ගොඩගම	පැ. 01	√	
		348/4	නිකහැටිකන්ද	පැ. 01	√	
		348/5	කරස්නාගල	පැ. 02		√
	27	272/1	අල්ගම (කන්දෙගම හරහා)	වි. 20		
		348	රුවන්වැල්ල	පැ. 02		
		348/6	ලෙනගල	පැ. 02		
	28	987	අල්ගම (අත්තනගල්ල හරහා)	වි. 20		✓
		987/1	ගොඩගම	පැ. 04		✓
	29	272/2	ගලපිටමඩ	වි. 20		✓
		182/1	රන්පොකුණුගම	වි. 15		✓
		272	ගලපිටමඩ (මහකන්ද හරහා)	පැ. 02		✓
	30	185/2	රුක්ගහවිල	වි. 15		✓
		292	රුක්ගහ විල	පැ. 01		✓
		185/1	නෙල්ලිගහමුල්ල	වි.		✓
	31	185	කිරිදිවැල	වි. 15		✓
	32	189	පස්යාල	වි12		✓
		272/1	අල්ගම	පැ. 04		✓
	33	182	කිරිදිවැල	වි. 08		✓
		182/3	නඩුවත්ත	පැ. 01		✓
		185/5	වතුරුගම	පැ. 01		✓
	34	348	රුවන්වැල්ල	වි. 15		✓

3.3.2.4 වේයන්ගොඩ නගර මධ්‍ය රථ වාහන ගමනාගමන කළමණාකරනය

වේයන්ගොඩ නගරයේ යෝජිත සංවර්ධන ව්‍යාපෘති වලට අනුගත වන ආකාරයට නගරය තුල බස් රථ ප්‍රවාහන රටාව හා රථවාහන කළමණාකරනය පහත දැක්වෙන කරුණු යටතේ සාකච්ඡා කෙරේ.

- බස්රථ ධාවන රටාව සැලසුම් කිරීම
- බස් හා දුම්රිය පල අතර පදික හිතකර පරිසරයක් ඇති කිරීම.
- ගුවන් පාලම හා විකල්ප මාර්ග සංවර්ධනය කර නගරය තුල රථ වාහන කළමණාකරනය කිරීම

3.3.2.5 බස්රථ ධාවන රටාව සැලසුම් කිරීම

වේයන්ගොඩ බස් නැවතුම් පල දුම්රිය ස්ථානයට ආසන්නව පිහිටා ඇති අතර බස් ධාවන රටාව සැලසුම් කිරීමේදී දුම්රිය ස්ථානය හා බස් නැවතුම්පල භාවිතා කරන ජනතාවගේ සංචලනය ද සැලකිල්ලට ගැනීම වැදගත් වේ. (වගුව 06). මේ අනුව නිවිටඹුව දිශාවට ගමන්කරන බස් රථ සඳහා වේදිකා අංක 1 සිට 4 හා වේදිකා අංක 7 සිට 10 දක්වාත් වෙන් කරන ලද අතර මිනුවන්ගොඩ දිශාවට ගමන් කරන බස්රථ සඳහා වේදිකා අංක 5 සහ 6 වෙන් කර ඇත. ඒ අනුව බස් නැවතුම් හා ආශ්‍රිත ප්‍රදේශයේ බස් රථ ගමනාගමනය සිතියම් අංක 04හි දක්වා ඇත. තවද අතිරික්ත බස්රථ නැවතීම සඳහා යාබද භූමියේ ඉඩකඩ සලසා ඇත.

වගුව 06

වේයන්ගොඩ බස් නැවතුම්පලෙහි යෝජිත බස් රථ ධාවන සටහන

ගමන් කරන දිශාව	වේදිකා අංකය	මාර්ග අංකය	ගමනාන්තය	කාල පරතරය	අයිතිය	
					ලංගම	පෞද්ගලික
අත්තනගල්ල දෙසට	1	987	අල්ගම	වි. 20	✓	
		987/1	ගොඩගම	පැ. 4		
	2	189	පස්යාල	වි. 8	✓	✓
		272/1	අල්ගම(වැලිකඩමුල්ල හරහා)	පැ. 4		
	3	185	කිරිදිවැල	වි. 12	✓	✓
	4	292	රුග්ගහවිල	පැ. 01	✓	✓
		182/1	රන්පොකුණගම	වි. 30		
මිනුවන්ගොඩ දෙසට	5	245/1	ගුවන්තොට්පල	වි. 10	✓	✓
		245	මීගමුව			
	6	242	දිවුලපිටිය(උඩුගම හරහා)		✓	✓
		242/2	දිවුලපිටිය (බල්ලපාන හරහා)			
		985	බාදූරාගොඩ			
		885	පල්ලෙවෙල			
අත්තනගල්ල සදසට	7	980/1	මිරිගම	-	✓	✓
		191	මල්ලැහැව	වි. 30		
		986	මාලිගාතැන්න	පැ. 01		
		980	කීනවල	පැ 01		
	8	188/4	ඔගොඩපොළ	වි. 25	✓	✓
		185/2	මල්වතුකිරිපිටිය	වි. 30		
		185/1	නෙල්ලිගහමුල්ල	පැ.03		
	9	206	ගම්පහ (වීරගුල හරහා)	වි. 30	✓	✓
		181/1	ගම්පහ(බෙම්මුල්ල හරහා)			
		181/2	ගම්පහ(කිහාරිය හරහා)			
	10	348/1	කරස්නාගල	-	✓	✓
		185/4	හංවැල්ල	වි. 25		
		348/5	වතුරගම	-		
		272	ගලපිටමඩ	වි. 30		

වෙයන්ගොඩ නගර මධ්‍යයේ යෝජිත ප්‍රවාහන රටාව

සිතියම් අංක 04



මිනුවන්ගොඩ හා නිට්ටඹුව දෙසට යන බස් රථ

මිනුවන්ගොඩ හා නිට්ටඹුව දෙසින් එන බස් රථ

මිනුවන්ගොඩ හා නිට්ටඹුව දෙසට
සහ දෙසින් එන අනෙකුත් වාහන

පරිමාණය :- 1 : 2000

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

3.3.2.6 බස් හා දුම්රියපල අතර පදික මාරු ඇති කිරීම.

වේයන්ගොඩ නගරය ප්‍රවාහන හුවමාරු මධ්‍යස්ථානයක් වන අතර දුම්රිය ස්ථානය හා බස් නැවතුම් පල යාබදව පිහිටා ඇති නිසා දුම්රිය හා බස් මගීන් හට සංචරණය සඳහා ආරක්ෂාකාරී ප්‍රවේශකත්වයක් ඇති කිරීම වැදගත් වේ. විශේෂයෙන් කාර්යාල සේවය නිමවා නිවෙස් කරා යාමේදී දෛනික අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා ඉඩකඩ සැලසීම මගින් මහජනයා හට පහසුවනවා මෙන්ම, මෙමගින් වාහන තදබදයද අවම කර ගැනීමට හැකිවනු ඇත. එබැවින් දුම්රිය ස්ථානය හා බස් නැවතුම් පල මැදිව පිහිටා ඇති පැරණි බස් නැවතුම් පල භූමිය දුම්රිය හා බස් මගීන්ගේ දෛනික අවශ්‍යතාවයන් ඉටු කරන සේවා මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීමට යෝජිතය. තවද දුම්රිය ස්ථානය වෙත පැමිණෙන මගීන් හට රථ ගාලක් ද මෙම භූමියේ යෝජනා කර ඇත.

3.3.2.7 ගුවන් පාලම හා අතුරු මාර්ගය සංවර්ධනය කර නගරය තුල රථ වාහන ගමනාගමනය කළමණාකරනය කිරීම

දුරස්ථ ගමන් සඳහා ගුවන් පාලම හා අතුරු මාර්ගය බහුල වශයෙන් භාවිතා කළ හැකි අතර නගර මධ්‍යයේ පවතින තදබදය මග හැරීම සිදුවේ. මෙම යෝජිත ගුවන් පාලම හා ඒ හා සබැඳුන අතුරු මාර්ගය වේයන්ගොඩ නගරය සඳහා විකල්ප මාර්ගයක් වන අතර මෙමගින් දුම්රිය හරස් මාර්ගය හේතුවෙන් ඇතිවන බාධකය මග හැරී යයි (රූපය 04). මධ්‍යම, සබරගමුව පලාත් වලින් ගුවන් තොටුපලට පැමිණෙන ජනතාවටද මෙම මාර්ගයෙන් මහත් සේවයක් ඉටුවේ. මීට අමතරව මෙම සැලැස්මෙහි අක්. 53කින් යුත් ආහාර ගබඩා භූමිය සඳහා යෝජනා කර ඇති ජාතික තලයේ ව්‍යාපෘති මෙන්ම අනෙකුත් ව්‍යාපෘති සඳහා වඩා හොඳ ප්‍රවේශකත්වයක් ලැබීම තුලින් මෙම මාර්ගයේ ඵලදායිතාවය තවදුරටත් තීව්‍ර වේ.

මෙම ගුවන් පාලම පහත රූපයේ දැක්වෙන ආකාරයට වේයන්ගොඩ නගරයට ආසන්න අත්තනගල්ල - ගුවන් තොටුපල මාර්ගයේ පිහිටි ඉන්ධන පිරවුම් හලට ආසන්නයෙන් ආරම්භ කර දුම්රිය මාර්ගය උඩින් ආහාර ගබඩා භූමිය සහ පුද්ගලික ඉඩම් කීපයක් හරහා නගරයේ පවතින කුඹුර ඔස්සේ නැවතත් අත්තනගල්ල ගුවන් තොටුපල මාර්ගය හමුවන ලෙස සැලසුම් කර ඇත. මෙම නව මාර්ගය නිසා පුද්ගලික දේපල කිහිපයක් පමණක් ප්‍රතිස්ථාපනය කිරීමට සිදුවන අතර ගෙවල් අහිමි වන්නන් සඳහා ආහාර ගබඩා භූමියෙන් ඉඩම් ලබා දීමට යෝජිතය (සිතියම් අංක 05).

මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 600 ක් පමණ වැය වෙතැයි ඇස්තමේන්තු කර ඇති අතර මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් ලබා දීමටත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීමටත් යෝජිතය.

මෙම ගුවන් පාලම හා අතුරු මාර්ග සංවර්ධනයට සමගාමීව වේයන්ගොඩ නගරයේ පිහිටි පොදු වෙළඳපලට යාබදව දිවෙන රණසිංහ මාවත ඉහත සඳහන් කල යෝජිත අතුරු මාර්ගය තෙක් දීර්ඝ කිරීමට යෝජනා කර ඇති අතර මෙමගින් බස් නැවතුම්පල භාවිතා කරන මගීන් හට ආහාර ගබඩා භූමියේ සිදුවන සංවර්ධන කටයුතු කරා ප්‍රවේශ වීමට පහසුකම් සැලසේ.

රූපය 04

ගුවන් පාලම හා යෝජිත අතුරු මාර්ගය



තවද එම මාර්ගය අතුරු මාර්ගය හමුවන ස්ථානයේ පිහිටා ඇති ආහාර ගබඩා භූමියට අයත් පර්. 30කින් යුත් භූමි භාගය භාවිත කර මගී උමං මාර්ගයක් ඉදි කිරීමට යෝජනා කෙරේ. (සිතියම් අංක 05).

3.3.3 තෙත් බිම් සංරක්ෂණ සැලැස්ම

අත්තනගල්ල නාගරික ප්‍රදේශය පුරා විහිදී ඇති තෙත් බිම් ප්‍රධාන වශයෙන් වී වගා භූමි වශයෙන් පවතින අතර එය නාගරික ප්‍රදේශයේ බිම් ප්‍රමාණයෙන් 15% ක් පමණ වේ. මෙම තෙත් බිම් ප්‍රදේශයේ සමතුලිතතාවය හා ස්වභාවික ජල ගැලීම් වලින් එල්ල විය හැකි තර්ජන වලට සාර්ථකව මුහුණ දීම සඳහා ඒවා ආරක්ෂා කිරීම වැදගත් වේ.

එකිනෙකට සම්බන්ධ වී ගම්පහ දිස්ත්‍රික්කය පුරා ජාලයක් ලෙස විහිදී ඇති මෙම තෙත් බිම් වැසි කාලවලදී ජල රැඳවුම් ප්‍රදේශ ලෙස ක්‍රියා කරන අතර මෙම තෙත් බිම් හා සබැඳුන ඔයවල් හා ඇලවල් අත්තනගල්ල නාගරික ප්‍රදේශය සඳහා ජලාපවහන ප්‍රදේශයක් ලෙස ක්‍රියා කරයි.

තෙත් බිම් තවදුරටත් ආරක්ෂා කිරීම මෙම තෙත් බිම් සංරක්ෂණ සැලැස්මේ ප්‍රධාන අරමුණ වන අතර එමගින් ප්‍රදේශය ස්වභාවික ජල ගැලීම්වලින් ආරක්ෂා කර ගැනීමටද හැකි වනු ඇත.

ඒ අනුව පහත දැක්වෙන පරිදි අත්තනගල්ල නාගරික ප්‍රදේශයේ පවතින තෙත් බිම් කලාප 3කට වෙන් කර ඒ ඒ කලාප සඳහා නිර්දේශිත භාවිතයන් හඳුන්වා දී තෙත් බිම් භාවිතය රෙගුලාසි ගත කිරීමට යෝජිතය (වගුව 07 හා සිතියම් අංක 06).

භූමි පරිහරණ රටාව - 2008

අත්තනගල්ල නාගරික ප්‍රදේශය

යතිසම අංක 03



යතුර

- නේවාසික
- වාණිජ
- කර්මාන්ත
- පොදු කටයුතු
- ආගමික ස්ථාන
- පොල්
- රබර්
- රක්ෂිත
- කෘෂිකාර්මික
- විවෘත ප්‍රදේශ, උද්‍යාන හා ක්‍රීඩා භූමි
- ජල මාර්ග
- මාර්ග
- අත්තනගල්ල නාගරික ප්‍රදේශය



පරිමාණය :- 1 : 50,000

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

සිතියම් අංක 05

යෝජිත ගුවන් පාලම හා ආශ්‍රිත සංවර්ධනය



පරිමාණය :- 1 : 700

තෙත් බිම් සංරක්ෂණ සැලැස්ම (2010 - 2030)
අත්තනගල්ල නාගරික ප්‍රදේශය

සිතියම් අංක 06





යතුර

- විශේෂ කුඹුරු වගා කලාපය
- පනත් බිම් කෘෂිකාර්මික කලාපය
- පනත් බිම් සංවර්ධන විභවතා කලාපය
- ජල මාර්ග
- අත්තනගල්ල නාගරික ප්‍රදේශය

පරිමාණය :- 1 : 50,000

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

3.3.3.1 තෙත් බිම් කලාප

i. තෙත් බිම් කෘෂිකාර්මික කලාපය
ii. විශේෂ කුඹුරු වගා කලාපය
iii. තෙත් බිම් සංවර්ධන විභවතා කලාපය

තවද මෙම සැලැස්මේදී තෙත් බිම් හරහා වැටී ඇති, කෘෂිකාර්මික අංශයට විශාල ලෙස දායක වන ජල මාර්ග (ඇල මාර්ග සහ ඔය මාර්ග) ආරක්ෂා කිරීම පිළිබඳව සැලකිල්ලට භාජනය කරන අතර ඒ සඳහා තැබිය යුතු රක්ෂිත ප්‍රමාණයන් ඇමුණුම III හි දක්වා ඇත.

වගුව 07

තෙත් බිම් සංරක්ෂණ කලාප හා අවසර දෙනු ලබන භාවිතයන්

01	කලාපය හා විස්තර	අවසර දෙනු ලබන භාවිතයන්
	තෙත් බිම් කෘෂිකාර්මික කලාපය	- තෙත් බිම් කෘෂිකාර්මික කටයුතු (ඌරු කොටු, ඉස්සන් වගා කිරීම සහ කුකුලන් 200ට වැඩි කුකුළු වගා ගොවිපලවල් හැර අනෙකුත් සත්ව පාලන කටයුතු ද මෙයට ඇතුලත් වේ) - සම්ප්‍රදායික ධීවර කර්මාන්තය - ලතා මණ්ඩප, කෘෂි වනාන්තර, ඉන්ධන සඳහා වන වගාව සහ ස්වභාවික වන ප්‍රජාවන්ද ඇතුළු සංරක්ෂිත වන වගාව - අදාල ඉඩමේ සිදුකරන නිෂ්පාදන ද්‍රව්‍ය විකිණීමේ මධ්‍යස්ථාන - දෘශ්‍ය කාරක නොවන කෘෂිකාර්මික නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථාන - භූ සමීක්ෂණ හා පතල් හා කැනීම් කාර්යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරියේ රෙගුලාසි හා උපදෙස් මාලාවන්ට අනුකූලව කැනීම් කටයුතු, ප්‍රති සංවර්ධන හා විනෝද කටයුතු (කෘෂිකාර්මික ධීවර හෝ වනාන්තරවලට අදාල ඒවා පමණි) - පොදු උද්‍යාන හා ක්‍රීඩා පිටි - අත්‍යාවශ්‍ය හා වැදගත් වූ පොදු අපරව්‍යුහ පහසුකම් ව්‍යාපෘති - ස්වභාවික උද්‍යාන - වී වගාව, කෘෂි කර්මාන්තය - පරිසර හිතකාමී ෙගාවිපලවල් හා භෝජනාගාර /කෙෂ්ත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන - උස්වූ පා ගමන් මාර්ග - ස්වභාවික පරිසරය සමග ගැලපූ ස්වභාවික මංපෙත්, නැරඹුම් කුටි කුරුල්ලන් නැරඹුම් කුටි - විවෘත කායවර්ධන ස්ථාන, ශරීර සුවතා මධ්‍යස්ථාන - තොරතුරු මධ්‍යස්ථාන - ජල රැඳවුම් මධ්‍යස්ථාන තෙත් බිම් විශ්මිත උද්‍යාන - අනෙකුත් පරිසර හිතකාමී විනෝද ක්‍රියාකාරකම් - ආරක්ෂක කුළුණු, ප්‍රවේශ පත්‍ර නිකුත් කරන ස්ථාන - විවෘත තෘණ භූමි (ක්‍රීඩා පිටි හා පොදු උද්‍යාන) - ස්වභාවික මල් එකතු කිරීමේ මධ්‍යස්ථාන

		- තෙත් බිම් වන වගාව - ජල අපවහන කටයුතු - ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ, මධ්‍යම පරිසර අධිකාරියේ, නාගරික සංවර්ධන අධිකාරියේ, මාර්ග සංවර්ධන අධිකාරියේ, වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ හා අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ කොන්දේසිවලට යටත්වූ පරිසර හිතකාමී ව්‍යාපෘති.
	ඉඩමේ අවම විශාලත්වය	- කෘෂිකාර්මික වගා කටයුතු සඳහා අදාල නොවේ. - අනෙකුත් ව්‍යාපෘති සඳහා හෙක්ටයාර් 2.0 හෝ අඩු හෝ සමාන ඉඩම් අදාල කරගත හැකි නමුත් ගොඩනැගිලි සෑදීමට අවසර දෙනු නොලැබේ.
	වාහන නැවැත්වීමේ අවශ්‍යතාවය	- ව්‍යාපෘතියේ ස්වභාවය අනුව අධිකාරිය විසින් නියම කරනු ලබන වාහන ගාල් ප්‍රමාණය සැපයිය යුතුය.
	ගොඩකිරීමට අවසර දෙනු ලබන භූමි ප්‍රමාණය	- මුළු භූමියෙන් 10% හෝ ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් ගොඩ කිරීම සඳහා නිර්දේශ කරනු ලබන භූමි ප්‍රමාණය යන දෙකින් වඩා අඩු භූමි ප්‍රමාණය
	ගොඩනැගිලි සඳහා යෙදවිය හැකි උපරිම භූමි ප්‍රමාණය	- ගොඩකිරීමට අවසර දෙනු ලබන භූමි ප්‍රමාණයෙන් 30%
	ව්‍යාපෘතියට අදාල වන විදුලිය, ජලය, දුරකථන, වාහන ගාල්, මාර්ග යනාදී අපරව්‍යූහ පහසුකම් සඳහා යෙදවිය හැකි උපරිම භූමි ප්‍රමාණය	- ගොඩකිරීමට අවසර නු ලබන භූමි ප්‍රමාණයෙන් 70%
	අනෙකුත් අවශ්‍යතා	- සියළුම භාවිත සඳහා මූලික සැලසුම් නිරවුල් සහතික නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගත යුතුය. - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ "උපදේශක සැලැස්මට" අනුව ජලය රඳවා ගැනීමේ හැකියාව පවත්වා ගත යුතුය. - සෑම ගොඩනැගිල්ලක්ම තෙත් බිම් මට්ටමට වඩා ඉහලින් ඉදිකළ යුතුය. අදාල සංවර්ධනය නිසා පොදු මාර්ග වල සිට හා පොදු මහජන විවෘත මධ්‍යස්ථානවල සිට බැලීමේදී ස්වභාවික දර්ශනයන් ආවරණය නොවිය යුතුය. - මායිම් තාප්ප ඉදි කිරීමට අවසර දෙනු නොලැබේ. ස්වභාවික දර්ශනයට හා ස්වභාවික ජල බැස යාමට හානියක් නොවන වැටවල යාබද හිස් බිම් සහිත මායිම් සඳහා පමණක් ඉදි කිරීමට අවසර දෙනු ලැබේ. අනෙකුත් මායිම් ලකුණු කිරීම් සඳහා දර්ශණයට හානියක් නොවන සලකුණු භාවිතා කළ හැක.
02	විශේෂිත කුඹුරු වගා කලාපය	- වී වගාව - ප්‍රධාන භාවිතය වන වී වගාව හා ගැලපිය හැකි සම්ප්‍රදායික ධීවර කර්මාන්ත කටයුතු කෘෂි වනාන්තර හා වී වගාව සඳහා අවශ්‍ය නොවන කුඩා බිම් තීරුවල කළ හැක.
03	තෙත් බිම් සංවර්ධන විභවතා කලාපය	- තෙත් බිම් කෘෂිකාර්මික කලාපයේ ඉඩදෙනු ලබන සියළු භාවිතයන් - සංචාරක කර්මාන්තය, ක්‍රීඩා සහ විනෝද කටයුතු

		- නේවාසික, වාණිජ, පරිපාලනමය සහ ආයතනික භාවිත - මධ්‍යම හා අධි දූෂිත කර්මාන්ත හැර අනෙකුත් කර්මාන්ත
	ඉඩමේ අවම විශාලත්වය	- හෙක්ටයාර් 1.0 (2.5 අක්කර ½)
	උපරිම බිම් කැබලි ආවරණ අනුපාතය	- ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලසුමට අනුකූලව තීරණය වේ.
	අනෙකුත් අවශ්‍යතා	- මූලික සැලසුම් නිරවුල් සහතිකය නාගරික සංවර්ධන අධිකාරියෙන් හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් ලබාගත යුතුය. - මායිම් නිර්ණය කිරීම සඳහා යොදාගනු ලබන තාප්ප, වැටවල් ආදී ඉදි කිරීම් ස්වභාවික ජලය බැස යාමේ පද්ධතියට අවහිරයක් නොවන ආකාරයට නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශයන්ට යටත්ව අවසර දෙනු ලැබේ.

3.4 නිර්දේශිත ව්‍යාපෘති

අත්තනගල්ල ප්‍රදේශයේ සංවර්ධන දර්ශනය සාක්ෂාත් කර ගැනීම සහ ප්‍රදේශය අඛණ්ඩ සංවර්ධනයක් කරා යොමු කිරීම පිණිස හඳුනාගන්නා ලද සම්පත් ප්‍රශස්ථ භාවිතයට යොදා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. සංවර්ධන ක්‍රියාදාමයේ හවුල්කරුවන් වශයෙන් දේශීය හා විදේශීය ආයෝජකයින්ට මෙම ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට අවස්ථාව සැලසෙනු ඇත. ඒ අනුව අත්තනගල්ල නගර සංවර්ධන සැලැස්ම තුලින් පහත දැක්වෙන ක්‍රියාකාරී ව්‍යාපෘති නිර්දේශ කර ඇත.

i. අත්තනගල්ල ඓතිහාසික හා සංස්කෘතික සංචාරක කලාපය
ii. ජාතික තලයේ ඒකාබද්ධ ක්‍රීඩා සංකීර්ණය
iii. දේශීය වෛද්‍ය සුවතා මධ්‍යස්ථානය හා ඔසු උයන
iv. නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම
    - නිට්ටඹුව නගරය
    - වේයන්ගොඩ නගරය

3.4.1 අත්තනගල්ල ඓතිහාසික හා සංස්කෘතික සංචාරක කලාප සංවර්ධනය

අත්තනගල්ල ප්‍රදේශය ඓතිහාසික හා සංස්කෘතික වැදගත් කමක් ඇති වෙහෙර විහාර, ස්වභාවික රක්ෂිත ස්ථානගත වී ඇති සුවිශේෂී ප්‍රදේශයක් බැවින් එම ස්ථාන භෞතික වශයෙන් සම්බන්ධ කර සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කර ප්‍රතිලාභ ලබා දීම සඳහා මෙම ව්‍යාපෘතිය නිර්දේශ කර ඇත. ඒ අනුව දැනටමත් සංචාරක ආකර්ෂණය කරන ස්ථානයක් ලෙස බණ්ඩාරණායක සමාධිය කේන්ද්‍රස්ථානය කරගනිමින් අත්තනගල්ල රජ මහා විහාරය, වාරණ රජ මහා විහාරය, දඩගමුව යන රජ මහා විහාරයද, හොරකැලේ යන රක්ෂිත ඒකාබද්ධ වන ලෙස මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නියමිතය (සිතියම් අංක 07). මෙම ව්‍යාපෘතිය පිළිබඳව විස්තර පහත සඳහන් වේ.

(i) තොරතුරු මධ්‍යස්ථානයක් ඇති කිරීම

මේ සඳහා බණ්ඩාරණායක සමාධිය ඉදිරිපිට පිහිටි හිස් භූමිය යෝජනා කෙරේ (රූපය 05). මෙහිදී යෝජිත සංචාරක කලාපයට අයත් සියළු වන්දනා ස්ථාන පිළිබඳව ඓතිහාසික තොරතුරු සැපයීමට නියමිත අතරම මෙම ස්ථානයේ සිට අනෙකුත් ස්ථාන සඳහා මාර්ගෝපදේශ හා උපදෙස් ලබා දීමේ සේවයක්ද ක්‍රියාත්මක වීමට නිර්දේශ කර ඇත. ඒ අනුව පහත සඳහන් අංගෝපාංග සහිත සංකීර්ණයක් යෝජනා කෙරේ.

- අන්තර්ජාල සන්නිවේදන පහසුකම් ලබා ගැනීම සඳහා ශාලාවක්
- වන්දනා ස්ථානයන්හි සවිස්තරාත්මක වාර්තා, වීඩියෝ දර්ශන, ජායාරූප, මාර්ගෝපදේශ තොරතුරු යනාදිය දක්වන ප්‍රදර්ශනාගාරයක්
- භෝජනාගාරයක්
- විසිතුරු භාණ්ඩ මධ්‍යස්ථානයක්
- ප්‍රදේශයේ අනන්‍යතාවය පිළිබිඹු කරන අත්කම් හා කෘෂි නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක්
- නවාතැන් පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම්
- විවේක සුවය සඳහා පවතින වැව ආශ්‍රිත ප්‍රදේශය භූ දර්ශනය කිරීම
- රථ ගාල්

රූපය 05

තොරතුරු මධ්‍යස්ථානය සඳහා යෝජිත ඉඩම



අත්තනගල්ල ඓතිහාසික සංස්කෘතික සංචාරක කලාපය

සිතියම් අංක 07











1. තොරතුරු මධ්‍යස්ථානය
2. අත්තනගල්ල රජමහා විහාරය
3. චාරණ රජමහා විහාරය
4. දඩගමුව රජමහා විහාරය
5. හොරකැලේ වනෝද්‍යානය

යෝජිත සංචාරක ප්‍රවේශ මාර්ගය

අත්තනගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

අත්තනගල්ල නාගරික ප්‍රදේශය

පරිමාණය :- 1 : 100,000

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරී

(ii) ප්‍රවේශ මාර්ග ජාලය සකස් කිරීම

අත්තනගල්ල හා අවට ප්‍රදේශයේ පවතින ඓතිහාසික හා සංස්කෘතික වශයෙන් වැදගත් ස්ථාන එකිනෙක සම්බන්ධ වීමට ප්‍රධාන බාධකය ලෙස ප්‍රමාණවත් පරිදි ප්‍රවේශ මාර්ග නොමැති වීම දැක්විය හැක. එබැවින් සිතියම් අංක 07 හි පෙන්වා ඇති පරිදි දැනටමත් පවතින මාර්ග යොදාගෙන මේ ස්ථාන සියල්ල සම්බන්ධ කරමින් පහසුවෙන් සහ කෙටි කාලයක් තුල ලභා විය හැකි ලෙස මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියෙන් නිර්දේශ කර ඇත. ඒ අනුව පහත සඳහන් පරිදි ගමන් මාර්ගය සකස් කිරීමට බලාපොරොත්තු වේ.

බණ්ඩාරනායක සමාධිය ඉදිරිපිට ඉදිකිරීමට යෝජිත තොරතුරු මධ්‍යස්ථානය වන්දනාකරුවන්ගේ ගමන් මාර්ගයේ ආරම්භය වේ. ඉන් අනතුරුව සිතියම් අංක 07 හි දැක්වෙන ආකාරයට නිට්ටඹුව - අත්තනගල්ල මාර්ගයේ කි. මී. 4ක් පමණ දුරින් පිහිටි අංක 2 න් දැක්වෙන අත්තනගල්ල රජ මහා විහාරය ද, අංක 3න් දැක්වෙන වාරණ රජ මහා විහාරය ද ඉන් අනතුරුව කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගය හමුවන මංසන්ධියෙන් කළගෙඩිහේන මාර්ගයේ අංක 4 න් දැක්වෙන දඩගමුව විහාරයද, ඉන් අනතුරුව වේයන්ගොඩ - නිට්ටඹුව මාර්ගයේ පිහිටි අංක 5 න් දැක්වෙන හොරකැලේ වනෝද්‍යානයටද පිවිස නැවතත් අංක 1 න් දැක්වෙන තොරතුරු මධ්‍යස්ථානයට පැමිණිය හැක. මෙම ගමන් මාර්ගයේ කි. මී. 30ක් පමණ වේ.

මීට අමතරව ප්‍රදේශයට ආසන්නයේ පවතින වැදගත් ඓතිහාසික ස්ථාන වන මාලිගාතැන්න, පිළිකුත්තුව වැනි රජ මහා විහාරත් අස්ගිරිය උද්භිද උද්‍යානයත් නැරඹීමට අවශ්‍ය සංචාරකයින් හට අවශ්‍ය තොරතුරු හා මාර්ගෝපදේශයන්ද තොරතුරු මධ්‍යස්ථානයෙන් ලබා දීමට යෝජිතය.

මෙම කලාපයට ඇතුලත්වන විහාර සියල්ල ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පවතින බැවින් මෙම ව්‍යාපෘතිය ඔවුන්ගේ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

3.4.2 ජාතික තලයේ ඒකාබද්ධ ක්‍රීඩා සංකීර්ණය

අත්තනගල්ල ප්‍රදේශයේ ක්‍රීඩා කටයුතු නැංවීම සඳහා යෝජනා මෙම සැලැස්මේදී ඉදිරිපත් කෙරේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය අදියර දෙකක් යටතේ නිට්ටඹුව හා වේයන්ගොඩ නගර දෙක කේන්ද්‍ර කරගනිමින් සංවර්ධනය කිරීමට යෝජිතය. අදියර 1 යටතේ දැනට ආයෝජන මංඩලය මගින් වතුපිටිවල ආයෝජන ප්‍රවර්ධන කලාපයට ආසන්නයේ මී. 400 කින් යුතු ධාවන පථයක් සහිත ක්‍රීඩා පිටියක් ඉදි කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ඇත (රූපය 06). ආයෝජන මණ්ඩලය සතු මෙම අක්කර 09කින් යුත් භූමිය තුල තවදුරටත් ක්‍රීඩා හා විනෝද කටයුතු සඳහා ඉඩ ප්‍රස්ථා ඇති කිරීමට යෝජිත වන අතර ඒ සඳහා අදාල වන්නාවූ නේවාසිකාගාර, නවාතැන් හා භෝජනාගාර යනාදී පහසුකම් සැපයීමට ඉඩ සලසා ඇත (සිතියම් අංක 08).

තවද මෙම සංකීර්ණයේ දෙවන අදියර ගෘහස්ථ හා ජල ආශ්‍රිත ක්‍රීඩා පහසුකම් ලෙස වේයන්ගොඩ නගරයේ ඉදි කිරීමට යෝජනා කර ඇති අතර ඒ සඳහා වේයන්ගොඩ නගරයේ පිහිටි ආහාර ගබඩා

භූමියේ පවතින ගොඩනැගිලි සංවර්ධනය කිරීමට යෝජිතය. මෙම සංකීර්ණයේ අංග පිළිබඳව සවිස්තරාත්මකව වේයන්ගොඩ නගර මධ්‍ය සැලැස්ම යටතේ සාකච්ජා කෙරේ.

රූපය 06

වතුපිටිවල ක්‍රීඩාංගනය



3.4.3 දේශීය වෛද්‍ය සුවතා මධ්‍යස්ථානය හා ඔසු උයන

ප්‍රදේශයේ වෙසෙන ජනතාවට මෙන්ම සංචාරකයින්ගේ ඉල්ලුමක්ව පවතින දේශීය වෛද්‍ය ක්‍රමය මෙම ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට විභවතාවයක් පවතින බැවින්, අත්තනගල්ල ප්‍රදේශයේ පවතින සම්පත් ද උපයෝගි කරගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ.

අත්තනගල්ල නාගරික ප්‍රදේශයේ යෝජිත මෙම සංවර්ධන ව්‍යාපෘතිය තුළින් ප්‍රදේශයට තව තවත් ජනතාව ආකර්ශනය කර ගැනීමට හැකිවනු ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වඩා සුදුසු ස්ථානය ලෙස, ජාතික තලයේ ක්‍රීඩා සංකීර්ණය පුළුල් කිරීමට යෝජිතව පවතින ඉඩමට යාබදව පිහිටි මනා ප්‍රවේශකත්වයකින් යුතු ආයෝජන මණ්ඩලය සතු හිස් භූමිය යෝජනා කෙරේ (සිතියම් අංක 09).

මෙම ප්‍රදේශයට ආවේනික ස්වාභාවික පරිසරය ප්‍රයෝජනයට ගනිමින් හෙක්ටයාර් 15 කින් යුතු යකඩවල රක්ෂිතය ද මෙම භූමියට යාබදව පිහිටා ඇති බැවින් එයද වඩා ඵලදායි ලෙස යොදා ගැනීම තුළින් මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට හැකිවනු ඇත.

මීට අමතරව මෙම වෛද්‍ය මධ්‍යස්ථානයේ ස්ථාපිත කිරීමට යෝජිත ඔසු උයන ද යකඩවල රක්ෂිතය අදාල කරගනිමින් පවත්වාගෙන යා හැකි විශේෂාංගයක් ලෙස දැක්විය හැකිය.

තවදුරටත් නවීන දේශීය වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම මෙම මධ්‍යස්ථානයේ ඇති කිරීම තුළින් දේශීය මෙන්ම විදේශීය ජනතාවගේද ඉල්ලුමක් ඇති කිරීමට අපේක්ෂිතය.

ජාතික තලයේ ඒකාබද්ධ ක්‍රීඩාංගනය
වතුපිටිවල



1. දැල්පන්දු පිටිය
2. බහුකාර්ය ගෘහස්ථ ක්‍රීඩාගාරය
3. අත්පන්දු ක්‍රීඩාපිටිය
4. මීටර් 400 ක ධාවන පථයක් සහිත ක්‍රීඩාංගනය
5. රථගාල

පරිමාණය :- 1 : 1200

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

දේශීය වෛද්‍ය සුවතා මධ්‍යස්ථානය

උ



1. දේශීය වෛද්‍ය සුවතා මධ්‍යස්ථානය සඳහා යෝජිත භූමිය
2. ක්‍රීඩා සංකීර්ණය පුළුල් කිරීමට යෝජිත භූමිය
3. පවතින ක්‍රීඩාපිටිය
4. යොවුන් සේනාංකය පිහිටි භූමිය

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

පරිමාණය :- 1 : 3000

3.4.4 නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම

අත්තනගල්ල නාගරික ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන නගර දෙක වන නිට්ටඹුව හා වේයන්ගොඩ නගර මධ්‍ය ප්‍රදේශය ප්‍රශස්ථ භාවිතයක් කරා යොමු කිරීම තුලින් නගරයේ ආදායම් ඉපයීමේ හැකියාව වැඩි දියුණු කිරීමත් නගරයේ ක්‍රියාකාරිත්වය කාර්යක්ෂම කිරීමත් මින් අපේක්ෂා කෙරේ.

3.4.4.1 නිට්ටඹුව නගරය

නිට්ටඹුව නගර මධ්‍ය සංවර්ධනය සඳහා වැදගත්වන ව්‍යාපෘති කිහිපයක් සැලසුම් කර ඇත. සැලසුම් කරන ලද ව්‍යාපෘති කිහිපයක් දැනටමත් නිම කර ඇති අතර අනෙකුත් ව්‍යාපෘති ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතය (සිතියම් අංක 10).

(I) **නිමකර ඇති ව්‍යාපෘති**

i. බස් නැවතුම් පල

රූපය 07



ii. සති පොල

iii. මහජන ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩාගාරය

රූපය 08



iv. වාණිජ සංකීර්ණය (අදියර 1)

රූපය 09



සිතියම් අංක 10

නිට්ටඹුව නගර මධ්‍ය සංවර්ධන සැලැස්ම



නිම කළ ව්‍යාපෘති

1. බස් නැවතුම් පල
2. සති පොළ
3. මහජන ක්‍රීඩා පිටිය හා ක්‍රීඩාගාරය
4. වාණිජ සංකීර්ණය පළමු අදියර
5. නාගරික උද්‍යානය
6. පොදු වැසිකිළිය
7. වෙළඳ සංකීර්ණය
8. පදික වෙළඳ පොල

යෝජිත ව්‍යාපෘති

9. වාණිජ සංකීර්ණය දෙවන අදියර
10. ප්‍රාදේශීය සභා සංකීර්ණය
11. නිට්ටඹුව චතුරශ්‍රය
12. පොදු රථ ගාල්
13. රණවිරු ස්මාරකය
14. වාණිජ ගොඩනැගිල්ල

● හඳුනාගත් ස්ථාන භූ දර්ශනය කිරීම

පරිමාණය :- 1 : 2400

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

v. නාගරික උද්‍යානය

රූපය 10



vi. පොදු වැසිකිළිය

(II) යෝජිත ව්‍යාපෘති

i. වාණිජ සංකීර්ණය (දෙවන අදියර) ඉදි කිරීම

රූපය 11



ප්‍රදේශයේ පවතින අධික වාණිජ ඉල්ලුමට සරිලන පරිදි නිට්ටඹුව බස් නැවතුම්පල ඉදිරිපිට පිහිටි පර්. 80 කින් යුත් භූමිය ප්‍රශස්ථ භාවිතයක් සඳහා යෙදවීමටත් ඒ තුලින් මහජනයාට මනා සේවාවක් ඇති කරලීම සඳහා මෙම භූමියේ තෙමහල් වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමට යෝජිතය.

- අයිතිය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
- ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය - ව. අඩි 18000
- ව්‍යාපෘති වියදම - රු. මි. 300
- මූල්‍ය ප්‍රතිපාදන - පෙර විකුණුම් ක්‍රමය මගින්
- ක්‍රියාත්මක කරන ආයතනය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

(ii) ප්‍රාදේශීය සභා ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීම

මේ සඳහා කොළඹ-මහනුවර මහා මාර්ගය හා අත්තනගල්ල මීගමුව මාර්ගය හමුවන සතර මං සංධියේ පිහිටා ඇති පැරණි පොල භූමිය හඳුනාගෙන ඇත. පර්චස් 205 කින් සමන්විත මෙම භූමියේ දැනට දෙමහල් වාණිජ සංකීර්ණයක් පවතින අතර එය ඌන භාවිතයේ පවතී. තවද අත්තනගල්ල - මීගමුව මාර්ගයට යාබදව පවතින බිම් තීරුවේ පුද්ගලික අයිතියක් ඇති අතර ඒවා ප්‍රශස්ථ භාවිතයක් සඳහා යොදා නොමැත.

ඒ අනුව පැරණි පොල භූමිය ඉහත සඳහන් කල පෞද්ගලික අංශය සතු භූමිය හා ඒකාබද්ධ කර ප්‍රාදේශීය සභා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකර ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

- අත්තනගල්ල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල
- ප්‍රජා ශාලාව
- උත්සව ශාලාව
- වෙළඳ සංකීර්ණය
- රථ ගාල

මෙහිදී ඉහත යෝජිත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර කිහිපයක් දැනට එම භූමියේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන වෙළඳුන් සඳහා සාධාරණ ක්‍රමයකට ලබා දීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(iii). නිට්ටඹුව චතුරශ්‍රය

මේ සඳහා පැරණි බස් නැවතුම් පල භූමිය යෝජනා කර ඇත. පර් 79.9 කින් සමන්විත මෙම භූමිය නිට්ටඹුව නගර මධ්‍යයේ අඩි 10ක් පමණ උස් මට්ටමක වඩාත්ම ආකර්ශණීය ස්ථානයක පිහිටා ඇති අතර කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගයට යාබදව පිහිටා ඇත. මෙම භූමියේ දැනට නගරය සඳහා අත්‍යාවශ්‍යව පවතින නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත වාණිජ චතුරශ්‍රයක් ඉදි කිරීමට යෝජනා කෙරේ. ඒ අනුව මෙම භූමියේ මහල් 4කින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීමට යෝජිත අතර එහි බිම් මහලේ සුපිරි වෙළඳ සංකීර්ණයක් ද, භෝජනශාලා පරිශ්‍රයක්ද, පළමු දෙවන හා තෙවන මහල් පුස්තකාලය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්, එනම් අන්තර්ජාල පහසුකම් මධ්‍යස්ථාන, ලිපි ද්‍රව්‍ය වෙළඳසැල්, පොත් වෙළඳ සැල්, පොත් බැඳීමේ ස්ථාන, සංනිවේදන

මධ්‍යස්ථාන යනාදිය සඳහා වෙන්කර ඇත. මෙම සංකීර්ණයට පැමිණෙන ජනතාව හට අනෙකුත් සමාජ අපරව්‍යුහ පහසුකම්ද සැලසීමට යෝජිතය.

මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන දැනට නොමැති අතර මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීමට යෝජිතය.

ස්ථානය - පැරණි බස් නැවතුම්පොල භූමිය
භූමි ප්‍රමාණය - පර්චස් 79.9
ව්‍යාපෘති වියදම- මිලියන 50
ක්‍රියාත්මක කරන ආයතනය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව / නාගරික සංවර්ධන අධිකාරිය.

(iv) රථ ශාල

නිට්ටඹුව නගරයේ මෑත කාලයේදී සිදුවූ සිඝ්‍ර නාගරීකරණය තුලින් නගරයට ඇදී එන රථ වාහන ප්‍රමාණය වර්ධනය වීමත් සමඟ නගර මධ්‍යයේ මෙන්ම මහනුවර - කොළඹ ප්‍රධාන මාර්ගයේ ඇතිවන මාර්ග තදබදය නිසා මහජනතාව දැඩි අපහසුතාවයකට පත් වී ඇත. බස් නැවතුම්පලට යාබදව පිහිටි භූමිය මේ සඳහා යෝජනා කර ඇත (සිතියම් අංක 10). මෙම භූමියේ කොටසක දැනට තාවකාලික ලෙස වොලිබෝල් පිටියක් පවත්වා ගෙන යන අතර ඉතිරි කොටසේ පවතින ගොඩනැගිල්ලේ මාර්ගය පුළුල් වීම නිසා කඩ අහිමි වූ වෙළෙඳුන් තාවකාලිකව ප්‍රතිස්ථාපනය කර ඇත.

මෙම වෙළඳුන් ඉහත සඳහන් කරන ලද වාණිජ සංකීර්ණයේ දෙවන අදියර යටතේ ඉදිවන ගොඩනැගිල්ලේ ස්ථීර ලෙස ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇති අතර දිස්ත්‍රික් ලේකම් තුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුවක් මගින් එම තීරණය ගන්නා ලදී. වාණිජ සංකීර්ණය ඉදිකර අවසන් වූ වහාම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිතය. මෙහි වාහන 50ක් පමණ ගාල් කිරීමට ඉඩ පහසුකම් සලසා ඇත.

- ස්ථානය - බස් නැවතුම්පලට යාබදව
- භූමි ප්‍රමාණය - පර් 100
- අයිතිය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
- ව්‍යාපෘති වියදම - රු. මී. 1.0
- ක්‍රියාත්මක කරන ආයතන - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව/නාගරික සංවර්ධන අධිකාරිය

(v). රණවිරු ස්මාරකය

රට දැය වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන්ට උපහාර පිණිස මෙම රණවිරු ස්මාරකය ඉදි කිරීමට යෝජිතය.

- ස්ථානය - නාගරික උද්‍යාන පරිශ්‍රය
- භූමි ප්‍රමාණය - පර්. 30
- අයිතිය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

- ව්‍යාපෘති වියදම - රු. මි. 1.0
- මූල්‍ය ප්‍රතිපාදන - අත්තනගල්ල රණවිරු සංසදය
- ක්‍රියාත්මක කරන ආයතනය - රණවිරු සංසදය

(vi) වාණිජ ගොඩනැගිල්ල

මාර්ග පුළුල් කිරීම නිසා කඩ අහිමි වූ වෙළඳුන් එකොලොස් දෙනෙකු සඳහා කඩ ලබා දීමේ අධිකරණ තීන්දුවකට අනුව වර්ග අඩි 3000 කින් යුතු වාණිජ ගොඩනැගිල්ල නාගරික උද්‍යානයට යාබදව ඉදි කිරීමට යෝජිතය. මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් සැලසුම් සකස් කර ඇති අතර ව්‍යාපෘති වියදම අදාල වෙළඳුන් විසින්ම දරණු ලැබේ.

- ස්ථානය - ප්‍රාදේශීය සභාව සතු නාගරික උද්‍යානයට යාබදව
- භූමි ප්‍රමාණය - පර් 30
- අයිතිය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
- ව්‍යාපෘති වියදම - රු. මි. 15
- ක්‍රියාත්මක කරන ආයතනය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

(vii). නිවටඹුව නගරයේ ජාතික මට්ටමේ පාසැලක් ඉදිකිරීම

අත්තනගල්ල ප්‍රදේශයේ ගැහැණු හා පිරිමි වශයෙන් වෙන් වූ ජාතික මට්ටමේ පාසලක් නොමැති වීම නිසා එවැනි පාසලක් පිහිටුවීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වේ. මෙහිදී අධ්‍යාපනය උසස් මට්ටමකට ගෙන ඒමත් ක්‍රීඩා හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉහළ නැංවීම තුළින් ශිෂ්‍යයන්ගේ සෞඛ්‍ය හා මානසික දියුණුව වැඩි කිරීමත් අපේක්ෂා කෙරේ. මෙම සංකීර්ණය තුල මීටර් 400 ධාවන පථයක් සහිත ක්‍රීඩා පිටියක්, විද්‍යාගාර පහසුකම් සහ සියළුම අංශ වලින් උසස් පෙළ හැදෑරීමට හැකි වන පරිදි සියලුම පහසුකම් ඇති කිරීමට යෝජිතය.

මේ සඳහා සුදුසු ඉඩමක් දැනටමත් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා ව්‍යාපෘති යෝජනාවක් ද සකස් කර ඇත.

ස්ථානය - නිවටඹුව ඕවර්ඩ් වත්තෙන් කොටසක්
භූමි ප්‍රමාණය - අක්කර 10
අයිතිය - ජනතා වතු සංවර්ධන මණ්ඩලය
ප්‍රවේශකත්වය - කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගය
ගොඩනැගිලි වර්ග ප්‍රමාණය - ව.අ. 100000
ව්‍යාපෘති වියදම - රු මි. 700
මූල්‍ය ප්‍රතිපාදන - මහා භාණ්ඩාගාරය
ක්‍රියාත්මක කරන ආයතනය - අධ්‍යාපන දෙපාර්තමේන්තුව, නා.සං.අ.

(viii). ජලාශ්‍රිත වාණිජ සහ විනෝද කටයුතු කලාප සංවර්ධනය

ආහාර ගබඩා භූමියේ වැව ආශ්‍රිත ප්‍රදේශය මේ සඳහා යෝජනා කෙරේ. දැනට අතහැර දමා තිබෙන එනමුත් භාවිතයට ගත හැකි ගොඩනැගිලි ද මෙම ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට යෝජනා කරන අතර පවතින වැවෙහි සෞන්දර්ය රැක ගත හැකි වන පරිදි නොයෙකුත් ක්‍රියාකාරකම් හඳුන්වාදීමටත් අපේක්ෂා කෙරේ.

ස්ථානය	- වේයන්ගොඩ ආහාර ගබඩාව පිහිටි භූමියෙහි කොටසක්
භූමි ප්‍රමාණය	- අක්කර 10
අයිතිය	- ආහාර දෙපාර්තමේන්තුව
ව්‍යාපෘති වියදම	- රු. මී. 500
මූල්‍ය ප්‍රතිපාදන	- මහා භාණ්ඩාගාරය
ක්‍රියාත්මක කරන ආයතනය	- නාගරික සංවර්ධන අධිකාරිය හා අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

(ix) නිට්ටඹුව නගර අලංකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ හඳුනාගත් ස්ථාන භූ දර්ශනය කිරීම

නගරයේ පවතින අක්‍රමවත් ප්‍රදර්ශන පුවරු, බැනර් හා පෝස්ටර් ඉවත් කර ඒවා ප්‍රදර්ශනය සඳහා නිශ්චිත ස්ථාන ලබා දීමත්, වෙළඳසැල්වල ප්‍රදර්ශන පුවරු ඉදි කිරීම සඳහා මග පෙන්වීම් හා නීති රීති හඳුන්වා දීමත්, හඳුනාගත් ස්ථාන භූ දර්ශනය කිරීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජකයන් යොමු කිරීමත් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට යෝජිතය.

3.4.4.2 වේයන්ගොඩ නගරය

වේයන්ගොඩ නගර මධ්‍ය සැලැස්ම යටතේ නගරයේ සංවර්ධනය සඳහා වැදගත් වන ව්‍යාපෘති කිහිපයක් සැලසුම් කර ඇත. සැලසුම් කරන ලද ව්‍යාපෘති කිහිපයක් දැනටමත් නිම කර ඇති අතර අනෙකුත් ව්‍යාපෘති ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිතය (සිතියම් අංක 11).

(I) **නිමකර ඇති ව්‍යාපෘති**

i. බස් නැවතුම් පොල

රූපය 12



ii. ආර්ථික මධ්‍යස්ථානය

රූපය 13



iii. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

රූපය 14





වේයන්ගොඩ නගර මධ්‍ය සංවර්ධනය



නිමකළ ව්‍යාපෘති

1. බස් නැවතුම්පොළ
2. ආර්ථික මධ්‍යස්ථානය
3. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය

ඉදිකරමින් පවතින ව්‍යාපෘති

4. සංස්කෘතික මධ්‍යස්ථානය
5. පොදු වෙළඳපොළ සංකීර්ණය
6. ප්‍රජා ශාලාව
7. පොදු වැසිකිළිය හා වාණිජ ගොඩනැගිල්ල

යෝජිත ව්‍යාපෘති

8. ගුවන් පාලම හා විකල්ප මාර්ගය
9. සුපිරි වෙළඳ සංකීර්ණය හා රථගාල
10. ප්‍රාදේශීය උප කාර්යාලය හා පුස්තකාලය
11. වාණිජ සංකීර්ණය
12. මාළු වෙළඳසැල
13. අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
14. බස් නැවතුම හා උමං මාර්ගය සංවර්ධනය
15. රණසිංහ මාවත දිර්ඝ කිරීම
16. පොලිස් ස්ථානය ප්‍රතිස්ථාපනය
17. භූ දර්ශනය කිරීම
18. රේඩිය උද්‍යානය හා දුම්රිය රථගාල
19. බණ්ඩාරනායක මාවත පුළුල් කිරීම හා භූ දර්ශනය කිරීම
20. ජලාශ්‍රිත වාණිජ සහ විනෝද කටයුතු සංවර්ධන කලාපය
    - a. ප්‍රවේශ මාර්ගය
    - b. ගෘහෝපකරණ ක්‍රීඩාංගනය
    - c. පිහිනුම් තටාකය
    - d. ආරක්ෂක පාලම
    - e. ආපන ශාලාව හා රථගාල
    - f. ජල ක්‍රීඩාංගනය
    - g. වාණිජ සංවර්ධනය
21. ආහාර ගබඩා කටයුතු සඳහා

ආහාර ගබඩා භූමියේ මායිම

පරිමාණය :- 1 : 10000

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

රූපය 15



රූපය 16



iii ප්‍රජා ශාලාව

රූපය 17



පොදු වැසිකිළිය හා වාණිජ ගොඩනැගිල්ල

රූපය 18



(III) යෝජිත ව්‍යාපෘති

i. සුපිරි වෙළඳ සංකීර්ණය හා රථ ගාල

වේයන්ගොඩ පැරණි බස් නැවතුම්පල භූමිය මේ සඳහා තෝරා ගෙන ඇත. පර්. 170 ක් පමණ ප්‍රමාණයකින් සමන්විත මෙම භූමිය නව බස් නැවතුම්පල හා දුම්රිය ස්ථානයට මැදිව පිහිටා ඇත.

විශේෂයෙන්ම දුම්රිය හා බස් මගීන් ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා මෙම සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට අපේක්ෂා කෙරේ.

මෙම ගොඩනැගිල්ලේ සුපිරි වෙළඳසැල්, බැංකු හා මූල්‍ය ආයතන සඳහා ඉඩකඩ සලසා ඇත.

මෙම භූමියට යාබදව පවතින භූමියේ බස් නැවතුම්පල, දුම්රිය ස්ථානය සහ සුපිරි වෙළඳ සංකීර්ණයට අවශ්‍ය රථ ගාල් සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් සැලසීමට යෝජිතය.

මෙම ගොඩනැගිල්ලේ ව. අඩි 4000 කින් යුත් සුපිරි වෙළඳසැල් 2ක් සඳහා ඉඩකඩ සලසා ඇති අතර බැංකු හා මූල්‍ය ආයතන සඳහා ව. අඩි 2000 ඉඩ ප්‍රමාණයක් වෙන් කර ඇත (රූපය 19).

- ස්ථානය - වේයන්ගොඩ පැරණි බස් නැවතුම් පල භූමිය
- භූමි ප්‍රමාණය - පර්. 170
- අයිතිය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
- ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය - ව. අ. 10,000
- ව්‍යාපෘති වියදම - රු. මි. 100
- මූල්‍ය ප්‍රතිපාදන - පෙර විකුණුම් ක්‍රමය
- ක්‍රියාත්මක කරන ආයතන - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය

(ii). ප්‍රාදේශීය සභා උප කාර්යාලය හා පුස්තකාලය

දැනට, ප්‍රාදේශීය සභා උප කාර්යාලය සහ පුස්තකාලය පිහිටා ඇති පර්. 79.5 ප්‍රමාණයකින් සමන්විත භූමිය දැනට ඌන භාවිතයේ පවතින අතර පවතින ගොඩනැගිලි එම කාර්යය සඳහා ප්‍රමාණවත් නොවන බැවින් නගර මධ්‍යයේ පවතින මෙම භූමිය ප්‍රශස්ථ භාවිතයක් සඳහා යෙදවීම අත්‍යාවශ්‍ය වේ.

මෙම භූමිය සංවර්ධනය සඳහා වින්‍යාස සැලැස්මක් දැනටමත් සකස් කර ඇති අතර එහි මහල් 4කින් යුත් ගොඩනැගිලි සංකීර්ණයේ පොදු වැසිකිලි පද්ධතියක් හා රථ ගාලක් සැලසුම් කර ඇත. මෙම සිවි මහල් සංකීර්ණයේ ප්‍රාදේශීය සභා උප කාර්යාලය හා මහජන පුස්තකාලය ස්ථාපිත කිරීමට යෝජිතය. තවද මෙම සංකීර්ණය තුල වාණිජ හා මූල්‍යායතන සඳහා ද ඉඩකඩ සලසා ඇත (රූපය 20).

පොදු වැසිකිළිය ඉදි කිරීම දැනටමත් ආරම්භ කර ඇත.

- ස්ථානය - වේයන්ගොඩ බස් නැවතුම් පල ඉදිරිපිට
- භූමි ප්‍රමාණය - පර්. 79.5
- අයිතිය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
- ව්‍යාපෘති වියදම - රු. මි. 80
- මූල්‍ය ප්‍රතිපාදන - මහා භාණ්ඩාගාරය
- ක්‍රියාත්මක කරන ආයතන - ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය

iii. වාණිජ සංකීර්ණය

බස් නැවතුම් පලට යාබදව පවතින ත්‍රිකෝණාකාර මෙම භූමියේ පොදු රථ ගාලක් සහ වාණිජ සංකීර්ණයක් ඉදි කිරීමට යෝජිතය. මෙම වාණිජ සංකීර්ණයෙන් කඩ කිහිපයක් මාර්ග පුළුල් කිරීමෙන් කඩ අහිමි වූවන් සඳහා තක්සේරු මුදලට ලබා දෙන අතර ඉතිරි කඩ පෙර විකුණුම් ක්‍රමය යටතේ ලබා දීමට යෝජිතය (රූපය 21).

- ස්ථානය - වේයන්ගොඩ බස් නැවතුම් පල ඉදිරිපිට
- භූමි ප්‍රමාණය - පර්. 49.1
- අයිතිය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
- ගොඩනැගිල්ලේ ප්‍රමාණය - ව. අ. 5000
- ව්‍යාපෘති වියදම - රු. මි. 80
- මූල්‍ය ප්‍රතිපාදන - පෙර විකුණුම් ක්‍රමය
- ක්‍රියාත්මක කරන ආයතන - ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය

iv මාළු වෙළඳ සැල

දැනට ප්‍රජාශාලා ගොඩනැගිල්ලේ ඉදිරිපිට අවධිමත් ලෙස පවත්වා ගෙන යන මාළු වෙළඳ සැල මගින් අවට ප්‍රදේශය ඉතා අපිරිසිදු වී ඇති අතර එමගින් ඉවත ලන අපද්‍රව්‍ය නිසා ඇති වී තිබෙන දුර්ගන්ධය හේතුවෙන් මහජනතාව දැඩි අපහසුතාවයට පත් වී ඇත. එබැවින් මෙය සුදුසු ස්ථානයක ස්ථාන ගත කිරීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා රණසිංහ මාවතේ පිහිටි පොදු වෙළඳ පොල ඉදිරිපිට භූමිය යෝජනා කර ඇත (සිතියම් අංක 11).

- ස්ථානය - රණසිංහ මාවතේ පොදු වෙළඳ පොල ඉදිරිපිට
- භූමි ප්‍රමාණය - පර්. 20
- අයිතිය - පෞද්ගලික
- මාලු වෙළඳ සැල් සංඛ්‍යාව - 08
- මස් වෙළඳ සැල් සංඛ්‍යාව - 04
- ව්‍යාපෘති වියදම - රු. මි. 2
- මූල්‍ය ප්‍රතිපාදන - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
- ක්‍රියාත්මක කරන ආයතන - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

(v). අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය

අතීතයේදී අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සේවය කළ කම්කරුවන් හට ප්‍රාදේශීය සභාව මගින් නිවාස 16ක් ලබාදී තිබුණි. පවුල් ප්‍රසාරණය විමත් සමග දැනට පවුල් 57 ක් මෙම ස්ථානයේ පදිංචි වී සිටිති. මෙම පවුල් සඳහා පවතින නිවාස ප්‍රමාණවත් නොවූ නිසා තාවකාලික ද්‍රව්‍ය වලින්

සුපිරි වෙළඳ සංකීර්ණය හා රථගාල
වේයන්ගොඩ



පරිමාණය :- 1 : 1200

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

ප්‍රාදේශීය සභා උප කාර්යාලය
හා පුස්තකාල ගොඩනැගිල්ල - වේයන්ගොඩ

රූපය 20



පරිමාණය :- 1 : 1200

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

වාණිජ සංකීර්ණය - වෙයන්ගොඩ



පරිමාණය :- 1 : 1200

ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
නාගරික සංවර්ධන අධිකාරිය

නිවාස සඳහා කොටස් එකතු කර ගැනීමත් සමගම වර්තමානයේදී එය පැල්පත් හා මුඩුක්කු නිවාස තත්ත්වයට පත් වී ඇත. මෙම නිවාස සනීපාරක්ෂක පහසුකම් අවම තත්ත්වයෙන් පැවතීම නිසා එහි වෙසෙන මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉතා පහල මට්ටමකට වැටී ඇත.

එබැවින් මෙම සැලැස්ම යටතේ මෙහි පදිංචි වී සිටින පවුල් සඳහා, නිවාස සංවර්ධන අධිකාරියේ යෝජිත ව්‍යාපෘතියක් යටතේ සෞඛ්‍යාරක්ෂිත නිවාස ලබා දීමට යෝජනා කෙරේ.

- ස්ථානය - වේයන්ගොඩ සුසාන භූමියට යාබදව
- භූමි ප්‍රමාණය - පර්. 80
- අයිතිය - අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
- නිවාස සංඛ්‍යාව - 110
- ව්‍යාපෘති වියදම - රු. මි. 55.0
- මූල්‍ය ප්‍රතිපාදන - මහා භාණ්ඩාගාරය

(vi). පොලිස් ස්ථානය ප්‍රතිස්ථාපනය

නිට්ටඹුව - වේයන්ගොඩ මාර්ගයේ පවතින ශාන්තමරියා විද්‍යාලය පුළුල් කිරීම සඳහා එයට යාබදව පවතින පොලිස් ස්ථානය පිහිටි භූමිය යෝජනා කර ඇත. එබැවින් නව පොලිස් ස්ථානය යෝජිත අතුරු මාර්ගයට යාබදව පවතින සිතියම් අංක 11න් දැක්වෙන භූමියේ ප්‍රතිස්ථාපනය කිරීමට යෝජිතය.

(vii) රේඛීය උද්‍යානය හා දුම්රිය ස්ථාන රථගාල

වේයන්ගොඩ දුම්රිය ස්ථානයේ ප්‍රධාන ප්‍රවේශය සඳහා රථගාල් නොමැති බැවින් වාහනවලින් පැමිණෙන ජනතාව සඳහා සිතියම් අංක 23 න් දැක්වෙන ස්ථානයේ රථගාලක් ඉදි කිරීමට යෝජිතය. තවද මෙම භූමිය දීඇල්ලේ ඔයට යාබදව පිහිටා ඇති බැවින් එහි ඇති සෞන්දර්යාත්මක පරිසරය ද උපයෝගී කර ගනිමින් නගරයට අලංකාරයක් ගෙන දෙන පරිදි රේඛීය උද්‍යානයක් ඉදි කිරීමට යෝජනා කෙරේ.

(viii). ජාතික ඒකාබද්ධ ක්‍රීඩා සංකීර්ණය (අදියර 2) - වේයන්ගොඩ

අ) ප්‍රවේශ මාර්ගය

වේයන්ගොඩ මාර්ගයේ යෝජිත අතුරු මාර්ගයේ සිට යෝජිත පොලිස් ස්ථානයට යාබදව අඩි 30ක් තුල මෙම මාර්ගය මෙම ක්‍රීඩා සංකීර්නයේ ප්‍රධාන ප්‍රවේශ මාර්ගය ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය (සිතියම් අංක 11).

ආ) ගෘහස්ථ ක්‍රීඩාංගනය

ආහාර ගබඩා භූමියේ දැනට පවතින අඩි 50ක පමණ උස අඩි 100ක් පළල හා අඩි 300ක් දිග ගොඩනැගිල්ලේ ව්‍යුහය තවමත් ශක්තිමත්ව පවත්නා බැවින් එම ගොඩනැගිලි නවීකරණය කර

ගෘහස්ථ ක්‍රීඩාංගනයක් ලෙස වැඩි දියුණු කළ හැකි අතර ප්‍රදේශයේ ජනතාව මෙන්ම අවට ජනතාව ද ආකර්ෂණය කරගත හැකි පරිදි සංවර්ධනය කිරීමට යෝජිතය (සිතියම් අංක 11).

ඇ) පිහිනුම් තටාකය

ආහාර ගබඩා භූමියේ පවතින හිස් භූමිය පර්. 150 කින් සමන්විතවන අතර අත්තනගල්ල හා අවට ප්‍රදේශය සඳහා පිහිනුම් ක්‍රීඩා සඳහා නියමිත ප්‍රමිතිකරණයට හා ඒ හා සැබෑදුනු වෙනත් ක්‍රියාකාරකම් සඳහා සුදුසු පිහිනුම් තටාකාංගනයක් ඉදි කිරීමට යෝජිතය (සිතියම් අංක 11).

ඈ) ආරුක්කු පාලම හා ජල ක්‍රීඩාංගනය

ආහාර ගබඩා භූමියේ පවතින අතහැර දැමූ වැව හෙක්ටයාර 02කින් යුක්ත වන අතර ප්‍රදේශයට සම්පතක් වන ආකාරයට එය වැඩි දියුණු කිරීමටත් ජල ක්‍රීඩා සඳහා යොදා ගැනීමටත් අපේක්ෂා කෙරේ (සිතියම් අංක 11).

මෙම භූමියට යාබදව පවතින තෙත් බිම සහ වැව සම්බන්ධ වන ස්ථානය හරහා ප්‍රදේශයට අලංකාරයක් ගෙන දෙන පරිදි මෙම ජලාශයේ එගොඩ මෙගොඩ යා කිරීම සඳහා ආරුක්කු පාලමක් නිර්මානය කිරීමටත් ඒ හා යාවන පරිදි වැව වටා මර්ගයක් ඉදි කිරීමටත් එම මාර්ගය හා වැව ඉවුර අතර ප්‍රදේශය රේඛීය උද්‍යානයක් ලෙස නිර්මාණය කිරීමත් මින් යෝජනා කෙරේ (සිතියම් අංක 11).

ඉ) **ආපන ශාලාව හා රථ ගාල**

ඉහත සඳහන් වැවට යාබදව පවතින හෙක්ටයාර් 3 කින් පමණ යුත් භූමිය මෙම ක්‍රීඩා සංකීර්ණය මෙන්ම ආහාර ගබඩා භූමිය පරිශ්‍රය පවතින අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා රථ ගාලක් ලෙස යොදා ගැනීමට යෝජිතය. තවද විවේක සුවය විඳීම සඳහා පැමිණෙන ජනතාව සඳහා අවශ්‍ය භෝජනාගාර පරිශ්‍රයක් මෙන්ම ළමා උද්‍යානයක් ලෙස ද සංවර්ධනය කිරීමටද යෝජිතය. (සිතියම් අංක 11).

ඉහත සඳහන් කරන ලද ආයෝජන මණ්ඩලය මගින් වතුපිටිවල නගරයේ යෝජිත ක්‍රීඩා සංකීර්ණය හා මෙම ආහාර ගබඩා භූමියේ යෝජිත ක්‍රීඩා සංකීර්ණය කි. මී. 5ක් පමණ ආසන්න දුරකින් පිහිටා ඇති නිසා එම සංකීර්ණ දෙක ඒකාබද්ධ කර ජාතික මට්ටමේ ක්‍රීඩා සංකීර්ණයක් ලෙස පවත්වා ගෙන යාමට අපේක්ෂිතය.

ix. ආහාර ගබඩාව සඳහා ඉඩ ප්‍රස්ථා තැබීම

අනාගතයේ ඇතිවිය හැකි කෘෂිකාර්මික නිෂ්පාදන ගබඩා කිරීමේ අවශ්‍යතාවය සඳහා මෙම භූමිය තුළ සිතියම් අංක 11 හි දැක්වෙන අක්කර 15 කින් පමණ සමන්විත භූමිය වෙන් කිරීමට යෝජනා කෙරේ.

ඇමුණුම 1

අවම බිම් ප්‍රමාණය

කලාපය / ප්‍රදේශය	අවම බිම් ප්‍රමාණය	
	නේවාසික හා වාණිජ සංවර්ධනය (පර්චස්)	අනෙකුත් භාවිත (පර්චස්)
1. විශේෂ නේවාසික කලාපය	06.0	12.0
2. ප්‍රාථමික නේවාසික කලාපය I , II හා III	12.0	12.0
3. වාණිජ කලාපය I හා II	06.0	10.0
4. මිශ්‍ර සංවර්ධන කලාපය I හා I I	10.0	10.0
5. ආයතනික කලාපය	06.0	12.0
6. වාණිජ කලාපය (කොළඹ - නුවර ප්‍රධාන මාර්ගයට මුහුණලා පවතින භූමි)	20.0	20.0
7. තෙත් බිම් සංරක්ෂණ කලාපය	වගුව 07ට අනුකූල විය යුතුය	

i. විශේෂ නේවාසික, වාණිජ හා ආයතනික කලාප තුළදී, පොදු නල ජල පහසුකම් නොමැති අවස්ථාවන්හි දී නේවාසික හා වාණිජ භාවිත සඳහා සංවර්ධන භූමියේ අවම භූමි ප්‍රමාණය පර්චස් 10 ක් විය යුතුය.

ඇමුණුම II

ගෙඛිම අනුපාතය

කලාපය	උපරිම ගෙඛිම් අනුපාතය
විශේෂ නේවාසික කලාපය	3.00
ප්‍රාථමික නේවාසික කලාපය I, II, III	3.00
වාණිජ කලාපය I, II	4.00
මිශ්‍ර සංවර්ධන කලාපය I, II	4.00
ආයතනික කලාපය	4.00
තෙත් බිම් සංරක්ෂණ කලාපය	වගුව 07ට අනුකූල විය යුතුය.

ඇමුණුම III

දුම්රිය මාර්ග හා ඇළ රක්ෂිත

1. දුම්රිය මාර්ග රක්ෂිත

දුම්රිය මාර්ගයේ දෙපසටම ආසන්නතම පිල්ලේ සිට මීටර් 09 ක සීමාව වේ.

2. ඇළ රක්ෂිත

අ. අත්තනගලු ඔය හා දී ඇලි ඔය සඳහා රක්ෂිතය ඇළ ඉවුරු මායිමේ සිට මීටර් 10 ක සීමාව වේ.

ආ. මීට අමතරව අනෙකුත් සියළුම ඇල මාර්ග සඳහා පහත පරිදි ඇල ඉවුරු මායිමේ සිට රක්ෂිත තැබිය යුතුයි.

ඇලෙහි මතුපිට පළල (මීටර්)	ඇල ඉවුරේ මායිමේ සිට රක්ෂිතය	
	විවෘත ඇල සඳහා (මීටර්)	මතුපිට ආවරණය කරන ලද ඇල සඳහා (මීටර්)
1.0 – 1.2 දක්වා	1.00	0.3
1.3 - 3.0	2.00	1.0
3.1 – 4.5	2.75	1.0
4.6 – 6.0	3.50	1.5
6.1 – 9.0	4.50	1.5
9.0 ට වැඩි	6.50	2.0

ඇ. ඉහත රක්ෂිත සම්බන්ධව වාරි මාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, මහවැලි අධිකාරිය හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කර ඇති දුර ප්‍රමාණ මෙම රක්ෂිත ප්‍රමාණයන්ට වැඩි වන අවස්ථාවක එම ආයතනය විසින් ප්‍රකාශ කරනු ලබන රක්ෂිත තැබිය යුතුයි.

ඇමුණුම 1V

නේවාසිකාගාර පහසුකම් සඳහා ප්‍රමිතීන්

හැදින්වීම : පුද්ගලයින් 3 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සඳහා නවාතැන් පහසුකම් ලබාදීමේදී අවම අවශ්‍යතාවයන් මෙමගින් නිර්දේශ කරනු ලබයි.

නිදන කාමර : සෑම නේවාසික කාමරයක් සඳහාම අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 12 ක් විය යුතුය. එක් කාමරයක නේවාසිකයන්ගේ උපරිමය 04 ක් විය යුතුය.

පොදු කාමරය : අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 12 ට නොඅඩු විය යුතුය. සෑම 09 දෙනෙකුගෙන් එක් අයකුට ආගන්තුක නවාතැන් පහසුකම් තිබිය යුතු අතර, රෙදි මැදීමේ පහසුකම්, විවේකය ගත කිරීමේ පහසුකම්, ලිවීමේ හා කියවීමේ පහසුකම් සැලසිය යුතුය.

මුළුතැන්ගෙය : ආහාර පිසීමට, ගබඩා කිරීමට ඉඩ පහසුකම් තිබිය යුතු අතර, ආහාර පිසීමට ගන්නා උපකරණ ගබඩා කිරීමට ඉඩ පහසුකම් සැලසිය යුතුය. තවද ආහාර සැකසීමට හා ගැනීමට ඉඩ පහසුකම් සැලසිය යුතුය. අවම විශාලත්ත්වය මීටර් 5.5 ක් විය යුතුය.

වැසිකිළි හා නාන කාමර පහසුකම් : සාමාජිකයන් 06 ක් සඳහා එක් වැසිකිළියක් හා ස්නාන පහසුකම් ලබාදිය යුතුය.

විදුලිය : සෑම ගොඩනැගිල්ලක් සඳහාම විදුලිය ලබා දිය යුතුය.

ජලය : බීමට හා නෑමට සුදුසු ජලය ප්‍රධාන නලයකින් නොලැබෙන්නේ නම් ජලය ලබා ගන්නා ක්‍රමය ගොඩනැගිලි සැලැස්ම අනුමත කර ගන්නා අවස්ථාවේදී අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතුය.

ඉදිකිරීමේ කටයුතු සඳහා භාවිතා කළ යුතු අමුද්‍රව්‍ය :

බිත්ති සහ අත්තිවාරම - ගඩොල්, කළු ගල්, බ්ලොක් ගල්.

වහලය - ඇසබැස්ටෝස්, උළු , ජී .අයි. තහඩු

ගෙබිම - ගඩොල් ඇතිරූ සිමෙන්ති බිම හෝ ඒ හා සමාන

දොර ජනේල් - ලී හෝ ඇලුමිනියම් වලින් නිෂ්පාදනය කළ යුතුය.

ඇමුණුම V

මාර්ගවල පළල සහ යෝජිත ගොඩනැගිලි සීමාව

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	කාර	කොන්.	බොං.	වෙනත්	අඩි
1	නුගගහලන්ද පාර	12					20
2	සපුගස්තැන්න පාර	30	√				25
3	වෙන්දේසිවත්ත පාර	30			√		20
4	කුරුදු වත්ත පාර	12	√	√			20
5	කුරුදුවත්ත හරස් පාර	10	√				20
6	පොදු පාර	30		√	√		20
7	පොදු පාර	30	√		√		20
8	පොදු පාර	20			√		20
9	පොදු පාර	10			√		20
10	පොදු පාර	8			√		20
11	පොදු පාර	8		√			20
12	කිත්තලපිටිය රවුම් පාර	15			√		20
13	පොදු පාර	12			√		20
14	පොදු පාර	12			√		20
15	පොදු පාර	12			√		20
16	පොදු පාර	12			√		20
17	පොදු පාර	12			√		20
18	වලගම්හා විද්‍යාල උඩ පාර	12	√		√		20
19	සමනළ මාවත	12			√		20
20	සමෘද්ධි මාවත	12			√		20
21	පොදු පාර	12			√		20
22	සමගි මාවත	12			√		20
23	පොදු පාර	12		√	√		20
24	පොදු පාර	12			√		20
25	කිත්තලපිටිය පාර	20					20
26	පොදු පාර	30	√				20
27	රනිස්වල පාර	20		√			20
28	සැනසුම් පියස වත්ත පාර	20	√				20
29	සැනසුම් පියස වත්ත පාර	20	√				20
30	සැනසුම් පියස වත්ත පාර	20	√				20
31	අතුරු පාර	20	√				20
32	සැනසුම් පියස පාර	20		√	√		20
33	සැනසුම් පියස පාර	20			√		20
34	සපුගස්තැන්න එස්ටේට් 2 පටුමග	20			√		20
35	සපුගස්තැන්න එස්ටේට් හරස් පාර	20			√		20
36	සපුගස්තැන්න එස්ටේට් 1 පටුමග	20			√		20
37	සපුගස්තැන්න එස්ටේට් හරස් පාර	20			√		20
38	සපුගස්තැන්න එස්ටේට්	20				√	20
39	වනමල් උයන පාර 2	20			√		20

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	කාර	කොන්.	බොං	වෙ	අඩි
40	වනමල් උයන පාර 1	20			√		20
41	වනමල් උයන 5 වන පටුමග	20			√		20
42	වනමල් උයන 4 වන පටුමග	20			√		20
43	වනමල් උයන 2 වන පටුමග	20			√		20
44	වනමල් උයන 3 වන පටුමග	20			√		20
45	සිරිමල්වත්ත 2 වන පටුමග	12	√				20
46	සිරිමල්වත්ත රවුම පාර 1	10	√				20
47	ගෝල්ඩන්ගේට් පෙදෙස පාර	12	√	√	√		25
48	වෙන්දේසිවත්ත පාර	20	√				20
49	වෙන්දේසිවත්ත පාර	15	√				20
50	රෝයල් පාර්ක් පාර	20	√		√		20
51	සිංහ පාර	30	√				20
52	කලගෙඩිහේන වේයන්ගොඩ පාර	30	√				50
53	සුමින්ද ලක්ෂාන් පාර	20			√		20
54	මගලේගොඩ පාර	20	√				30
55	කොළඹ-නුවර පාර	50	√				50
56	පොදු පාර (මගලේගොඩ පාරට)	12			√		20
57	රෝස වත්ත පාර	12		√			20
58	රෝස පාර 2	12	√				20
59	රොබට් පාර	20	√	√	√		20
60	හරස් පාර 3	20		√			20
61	ඔස්ටින් පාර	20	√	√			20
62	කුඹුර අයිනේ ගුරු පාර	10			√		20
63	ගුරු පාර	15			√		20
64	සෙන්පති නාලක අනුරාධ මාවත	20	√				25
65	පොදු පාර	12			√		20
66	පොදු පාර	12	√				20
67	බදුල්ලගහලන්ද පාර	12	√	√	√	√	20
68	අතුරු පාර	12	√				20
69	පොදු පාර	12					20
70	ගුරු පාර	15	√				20
71	ගුරු පාර	15		√	√		20
72	ගුරු පාර	15			√		20
73	ගුරු පාර	15			√		20
74	2 වන වෙස්ටන් පාර්ක් පාර	15			√		20
75	වෙස්ටන් පාර්ක් පාර	30			√		20
76	කළගෙඩිහේන වෙන්දේසිවත්ත පාර	12	√				20
77	කළගෙඩිහේන වෙන්දේසිවත්ත පාර	20	√				20
78	මංගලතිරිය පාර	25	√				30
79	මංගලතිරිය අතුරු පාර 1	20			√		20
80	සමාධි මාවත	12	√				25
81	සමාධි මාවත අතුරු පාර 1	12		√	√		20
82	සමාධි මාවත අතුරු පාර 2	20		√			20
83	ජය මාවත	20	√				20

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	කාර	කොන්.	ඩොං	වෙ	අඩි
84	සුහද මාවත	20	√				20
85	මංගලතිරිය අතුරු පාර 3	12			√		20
86	මංගලතිරිය අතුරු පාර 2	20			√		20
87	හිග්ගහවත්ත පාර	10	√	√			20
88	එගොඩවත්ත පාර	12	√				20
89	මුදලිගම පාර	30			√		20
90	කුමාර මාවත	12	√				25
91	කුරුදුවත්ත උදා කළගම	12	√				20
92	කුරුදුවත්ත i පටුමග	20			√		20
93	කුරුදුවත්ත ii පටුමග	20			√		20
94	කුරුදුවත්ත iii පටුමග	30			√		25
95	කුරුදුවත්ත i රවුම් පාර	20		√			20
96	ගල්වලගොඩ පාර	15	√				25
97	කුරුදුවත්ත ii රවුම් පාර	20			√		20
98	රූපසිංහ උද්‍යාන පාර ii පටුමග	30			√		20
99	රූපසිංහ උද්‍යාන පාර i පටුමග	30			√		20
100	රූපසිංහ උද්‍යාන පාර iii පටුමග	20					20
101	රූපසිංහ උද්‍යාන පාර (පොල්හේන කනත්ත පාර)	12		√			20
102	කුරුදුවත්ත උදා කළගම හරස් පාර	20	√				20
103	අලිජින්නා පාර අතුරු පාර 3	20	√				20
104	පොළ පාර නිහාරිය	20			√		20
105	පොළ පාර අතුරු පාර	30	√				20
106	අලිජින්නා අතුරු පාර 2	30	√				20
107	අලිජින්නා අතුරු පාර 1	30	√				50
108	වාරණ පාර	30	√				20
109	අලිජින්නා මාවත	18	√				20
110	බණ්ඩාරනායක පෙදෙස	12		√			20
111	බණ්ඩාරනායක පෙදෙස අතුරු පාර	12	√				20
112	ඉසිපතනාරාම පාර	12		√			20
113	ඉසිපතනාරාම අතුරු පාර 1	20	√				20
114	ඉසිපතනාරාමඅතුරු පාර 2	10			√		20
115	මෝස් ටූවර්	15	√				25
116	කටුවස්ගොඩ පාර	20			√		20
117	ගුරු පාර	25	√				30
118	මී අඹේවත්ත පාර (අත්කම් නිවාස පාර)	10	√		√		25
119	ගුරු පාර	10			√		20
120	කුඹුර අයින පාර	30	√	√			25
121	වටද්දර පාර	20	√				25
122	කත්තොට පාර	20			√		20
123	කත්තොට අතුරු පාර 1	20		√			20
124	කොරනේලිස් අප්පුහාමි පාර	18			√		20
125	පොදු පාර	12		√			20
126	සහිත් පාර						

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	තාර	කොන්.	බොර	වෙ	අඩි
127	උතුරු කරටුවාව පාර	20	√				20
128	මිහිදු මාවත	30	√				20
129	මිහිදු මාවත 2 වන පටුමග	12			√		20
130	මිහිදු මාවත 3 වන පටුමග	12			√		20
131	මිහිදු මාවත 4 වන පටුමග	12			√		20
132	මිහිදු මාවත 5 වන පටුමග	12			√		20
133	මිහිදු මාවත 6 වන පටුමග	12			√		20
134	මිහිදු මාවත 7 වන පටුමග	12			√		20
135	මිහිදු මාවත 1 වන පටුමග	12	√			√	20
136	සියනෑ පාර / පත්තල ගෙදර පාර	50	√				25
137	මල් මාවත	15		√			20
138	වාසනා මාවත (මල්වත්ත ආදාහනාගාර පාර)	20	√				20
139	වාසනා මාවත අතුරු මාර්ගය	10		√			20
140	සීවලී මාවත	15	√				25
141	රජ මල්වත්ත පාර	30	√				20
142	රජමල්වත්ත අතුරු පාර 1	12				√	20
143	රජමල්වත්ත අතුරු පාර 2	12		√			20
144	රජමල්වත්ත අතුරු පාර 4	12			√		20
145	රජමල්වත්ත අතුරු පාර5	12			√		20
146	රජමල්වත්ත පිටිටනිය අතුරු පාර	12		√			20
147	ගජබා මාවත	20	√				20
148	සඝබෝ මාවත	15	√				20
149	පැරකුම් මාවත	15	√				20
150	ගැමුණු මාවත	15	√	√			20
151	සංඝබෝධි මාවත	30	√				25
152	උඩ රවුම් පාර	20	√				25
153	යටිරවුම් පාර	30	√				25
154	2 හරස් පාර(අතුරු පාර)	20	√			√	20
155	උඩ රවුම් පාර 1 වන හරස් පාර	12				√	20
156	උඩ රවුම් පාර 3 වන පටුමග	12				√	20
157	උඩ රවුම් 5 වන පටු මග	12				√	20
158	යටිරවුම් පාර හරස් පාර 1	20	√				20
159	යටිරවුම් පාර හරස් පාර 2	20	√				20
160	3 වන හරස් පාර	20			√		20
161	උඩ රවුම් පාර 4 වන පටුමග	12			√		20
162	උඩ රවුම් 6 වන පටුමග	12			√		20
163	උඩ රවුම් 7 වන පටුමග	12				√	20
164	උඩ රවුම් 8 වන පටුමග	20			√		20
165	මැංගුස්කොටුව පාර	12				√	20
166	වතුපිටිවල පාර	40	√				30
167	කන්දෙහේන රවුම් මාවත	20		√			20
168	ඕවඩවත්ත පාර	30	√		√		25
169	කන්දෙහේන අතුරු පාර 3	20	√				20
170	ඕවඩවත්ත රවුම් පාර	12	√				20

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	තාර	කොන්.	ඛොා	වෙ	අඩි
171	වලව්වත්ත 1 වන පටුමග	20			√		20
172	වලව්වත්ත පාර	20		√			20
173	වලව්වත්ත 2 වන පටුමග	20			√		20
174	රූප සිංහ මාවත	15		√	√		25
175	ඕවඩවත්ත 1 වන පටුමග	20	√				25
176	වලව්වත්ත 3වන පටුමග	20			√		20
177	වලව්වත්ත 4 වන පටුමග	20			√		20
178	ඕවඩවත්ත 2 වන පටුමග	20		√			20
179	ඕවඩවත්ත 3 වන පටුමග	15	√				20
180	ඕවඩවත්ත 4 වන පටුමග	15		√	√		20
181	ඕවඩවත්ත 6 වන පටුමග	15		√	√		20
182	ඕවඩවත්ත 7 වන පටුමග	15		√	√		20
183	ඕවඩවත්ත 8 වන පටුමග	15		√	√		20
184	ඕවඩවත්ත 9 වන පටුමග	15		√	√		20
185	කත්තොට අතුරු පාර 6	18			√		20
186	කත්තොට අතුරු පාර 4	12			√		20
187	කත්තොට අතුරු පාර 2	18			√		20
188	කත්තොට අතුරු පාර 3	18	√				20
189	කත්තොට අතුරු පාර 5	18			√		20
190	යටියන පාර / ඕවඩවත්ත ජනපදය	20	√				25
191	යටියන රවුම් පාර	20	√				20
192	ආසිරි උයන පාර	10			√		20
193	බෙහෙත්වත්ත පාර 1	12	√				25
194	බෙහෙත්වත්ත 4වන අතුරු පාර	12			√		20
195	බෙහෙත්වත්ත 3 වන අතුරු පාර	10			√		20
196	බෙහෙත්වත්ත 1 වන අතුරු පාර	10			√		20
197	බෙහෙත්වත්ත 2 වන අතුරු පාර	8			√		20
198	බෙහෙත්වත්ත පාර 2	12			√		25
199	බෝගොඩ 1 වන අතුරු පාර	12		√			20
200	බෙහෙත්වත්ත බෝගොඩ පාර	12	√				20
201	බෝගොඩ 2 වන අතුරු පාර	15			√		20
202	යකඩවල රක්ෂිතය 1 වන අතුරු පාර	12			√		20
203	කිත්තම්මහර පාර	30	√				20
204	රණවිරු 1 වන අතුරු පාර	12	√				20
205	රණවිරු 2 වන අතුරු පාර	12	√				20
206	රණවිරු 3 වන අතුරු පාර	12	√			√	20
207	රණ විරු මාවත	12	√				25
208	රණවිරු 4 වන අතුරු පාර	12	√				20
209	BOI වටරවුම් පාර	15	√				25
210	ලී මෝල පාර එගොඩමේ පාර	12	√				20
211	බණ්ඩාරනායක මාවත	20	√				25
212	සිරිමාවෝ බණ්ඩාරනායක මාවත	10	√				20
213	රණ්පොකුණුගම ප්‍රධාන පාර	40	√				30

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	කත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	කාර	කොන්.	බෝ	වෙ	අඩි
214	රණ්පොකුණුගම නව නිවාස මාර්ගය	40					20
215	රණ්පොකුණුගම නව නිවාස I පටුමග	40					20
216	රණ්පොකුණුගම නව නිවාස 2 පටුමග	40					25
217	රණ්පොකුණුගම නව නිවාස 3 පටුමග	40					20
218	රණ්පොකුණුගම E කලාපය I පටුමග	40					25
219	රණ්පොකුණුගම E කලාපය 2 පටුමග	40					25
220	රණ්පොකුණුගම E කලාපය 3 පටුමග	40					25
221	රණ්පොකුණුගම D කලාපය 1 පටුමග	40					25
222	රණ්පොකුණුගම D කලාපය 2 පටුමග	40					25
223	රණ්පොකුණුගම B කලාපය 1 පටුමග	40					25
224	රණ්පොකුණුගම B කලාපය 2 පටුමග	40					25
225	රණ්පොකුණුගම B කලාපය 3 පටුමග	40					20
226	රණ්පොකුණුගම B කලාපය 4 පටුමග	40					25
227	මඩුවේගෙදර පාර (යටියන පාර)	20		√			25
228	මඩුවේගෙදර අතුරු පාර	10			√		20
229	පොදු පාර	15	√				20
230	පතිරණ මාවත	10			√		20
231	පොදු පාර	10			√		20
232	පොදු පාර	20	√				20
233	නිසල මාවත	15		√	√		20
234	සමගි මාවත	25	√				20
235	විවේකාරාම පන්සල පාර	20	√				20
236	ජය මාවත	20	√				20
237	පොදු පාර	25			√		20
238	පොදු පාර	20	√				20
239	පොදු පාර	20			√		20
240	ගුරු පාර	10			√		20
241	ගුරු පාර (දොඹගහලන්ද පාර ඉදිරිපිට)	15			√		20
242	දොඹගහලන්ද පාර	20	√				25
243	මුදලිදූ උයන1වන මාවත	20	√		√		25
244	මුදලිදූ උයන 3 වන අතුරු පාර	20	√		√		20
245	බස්නැවතුම්පල හරස් පාර	12					30
246	පොදු පාර	12					20
247	පොදු පාර	12					20
248	පොදු පාර	12					20
249	පොදු පාර	12					20
250	නාගරික උද්‍යාන පාර	50	√				25
251	සපුමල් පෙ‍ොදස පාර	12	√				20
252	නාමල් වත්ත පාර	18		√			20
253	කන්දෙහේන අතුරු පාර 2	20		√			20
254	කන්දේහේන අතුරු පාර 1(ගල්වල පාර)	20	√	√	√		20
255	කන්දෙහේන පාර	20					25
256	මුදලිදූ පෙදෙස 1 වන මාවත	20					20
257	මුදලිදූ පෙදෙස 2 වන මාවත	20					20

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	තාර	කොන්.	ඛොා	වෙ	අඩි
258	මුදලිදූ පෙදෙස 1 වන රවුම් පාර	20					20
259	මුදලිදූ පෙදෙස 2 වන අතුරු පාර	12					20
260	මුදලිදූ පෙදෙස 1වන අතුරු පාර	20	√		√		20
261	මුදලිදූ උයන රවුම් පාර	20	√				20
262	මුදලිදූ උයන 2 වන අතුරු පාර	20	√				20
263	මුදලිදූ පෙදෙස	12			√		25
264	මුදලිදූ පාර 2 වන අතුරු පාර	20	√		√		20
265	මුදලිදූ රවුම් පාර	12		√	√		20
266	මුදලිදූ උයන පාර	30	√				20
267	ජයසූරිය මාවත	50	√				30
268	පොල්හේන පාර	10					25
269	බස්නැවතුම්පල පාර	50	√				30
270	අත්තනගල්ල ඌරාපොල පාර	40	√				50
271	බටදොලේ පාර	20	√	√	√		20
272	කුමුදූ ෆ්ලවර්ස්	10		125√	√		20
273	විද්‍යාපීඨ පාර/සාරිපුත්ත	18	√	√	100√		25
274	නාපාගොඩ පාර	15	√	√			25
275	කුමාරි මාවත	12					25
276	නවගමුව 2 වන පටුමග	12			√	√	20
277	නවගමුව පාර	12	√	√	√		25
278	නවගමුව 1 වන පටුමග	12	50√	√	√	√	25
279	පන්ගොල්ලවත්ත පාර	12	√	√			25
280	පන්ගොල්ලවත්ත පාර 1 පටුමග	8	√				20
281	ධාතුකන්ද පුරාණ විහාර පාර	8	√				20
282	5 වන පටුමග	8	√				20
283	2 වන අතුරු මාවත	12		√			20
284	ගම්මැද කලල්පිටිය පාර	12	√				25
285	4 වන පටුමග	20			√		20
286	3 වන පටුමග	20			√		20
287	2 වන හරස් පාර	30			√		20
288	1 වන හරස් පාර	12		√	√		20
289	ලක්මල් පෙදෙස	20	√				20
290	වෙදගම පාර	15	√		√		20
291	වෙළබඩ පාර	15	√		√		20
292	මැදලන්දවත්ත පාර	12	√				25
293	කැකිරිකොටුව පාර	10					20
294	මැදලන්දවත්ත අතුරු පාර	12	√				20
295	ෂෙල්ටන් අල්විස් මාවත	20	√				25
296	වෙන්දේසි ඉඩම ඇතුල් පාර	20	√				20
297	වෙන්දේසි ඉඩම් පාර	20	√				20
298	ග්‍රීන් පාර්ක් පාර	30	√				25
299	වෙන්දේසි ඉඩම් පාර	20			√		20
300	වෙන්දේසි ඉඩම් පාර	20			√		20
301	මේජර් රාමනායක පාර	30	√				20

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	තාර	කොන්.	ඛොා	වෙ	අඩි
302	පුද්ගලික පාර	20			√		20
303	පුද්ගලික පාර	15			√		20
304	පොදු පාර	15		90√	110√		20
305	කෝන්ගස්දෙනිය පනාවල පාර	30/20	√				25
306	කෝන්ගස්දෙනිය සමෘද්ධි මාවත	15	√	√			25
307	පරණවේයන්ගොඩ පාර	20	√				25
308	කිඹුල්ගහවත්ත පාර	20	√		√		20
309	නෙළුම්පෙදෙස පාර	20		100√	√		20
310	සල්ගස් තැන්න	30	1000√				20
311	පොදු පාර	15	700√	√	√		20
312	පොදු පාර	10		√	√		25
313	මේජර් කේ.ටී.කරුණාරත්න පාර	15		√			20
314	ප්‍රසන්න රාමනායක පාර (කන්දේ විහාර පාර)	20	√				20
315	තල්ගස්යාය පාර 2	12	√				20
316	තල්ගස්යාය හරස් පාර	10	√				20
317	තල්ගස්යාය පාර	10	√	√			20
318	මල්ලැහැව පාර - හුඹුටියාව පාර	10	√		√		25
319	මංගල පාර	10	√				25
320	මීගමුව පාර	40	√				50
321	හුඹුටියාව පාර	40	√				30
322	බණ්ඩාරනායක මාවත	15	√				20
323	ශාන්ත අන්තෝනි මාවත	12	√				25
324	පොදුජන මාවත	18	√				25
325	1 වන අතුරු මාර්ගය	10			√		20
326	2 වන හරස් පාර	12		√			20
327	3 වන හරස් පාර	15		√			20
328	5 වන හරස් පාර	15	√	√	√		20
329	4 වන හරස් පාර	10	√				20
330	හරස් පාර	10	√				20
331	ඩඩ්ලි සේනානායක අතුරු මාර්ගය	20	√				20
332	ඩඩ්ලි සේනානායක මාවත	15	√				20
333	1 වන හරස් පාර	15	√				20
334	3 වන අතුරු පාර	12			√		20
335	4 වන අතුරු පාර	15		√			20
336	ආයුර්වේද බෙහෙත් ශාලා පාර	15	√				20
337	2 වන අතුරු පාර	15			√		20
338	මහවත්ත පාර	10	√				20
339	පින්නගොල්ල පාර	20	√				25
340	පින්නගොල්ල අතුරු මාර්ගය	8	√				20
341	පින්නගොල්ල අමුණේන හරස් පාර	10	√	√			25
342	අරලිය මාවත	20		√			25
343	රුක්මල් මාවත	10			√		20
344	සල්මල් මාවත	15	√				20
345	සපුමල් මාවත	12		√			20

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	කාර	කොන්.	බෙ	වෙ	අඩි
346	නාමල් මාවත	12		√			20
347	නෙළුම් මාවත	15	√	√	√		25
348	පොදු පාර	8	√	√			20
349	උදම්විට පන්සල පාර 1	15	√				25
350	අමුහේණවත්ත පාර දෙල්ගහවත්ත පාර	12	√				25
351	අමුහේණවත්ත 2 අතුරු පාර	12			√		20
352	කෝලවත්ත 1 වන පටුමග	20	√				25
353	කෝලවත්ත 2 වන පටුමග	20	√	√			20
354	කෝලවත්ත 2 වන පටුමගේ අතුරු පාර	20	√		√		20
355	කෝලවත්ත 2 වන පටුමග හරස් පාර (3වනපටුමගට)	20	√		√		20
356	සුගතදාස සෙනරත් මාවත	12	√	√			20
357	කෝලවත්ත 3 වන පටුමග	20	√	√	√		20
358	පොත්තගල පාර	20	√	√	√		25
359	උදම්විට කණුහැත්ත පාර	15	√	√	√		20
360	කෝලවත්ත 4 වන පටුමග	20	√	√			25
361	කෝලවත්ත 5 වන පටුමග	20	√				20
362	කෝලවත්ත 6 වන පටුමග	20	√		√		20
363	රාමනායක මාවත	12	√	√			25
364	කෝලවත්ත 7වන පටුමග	20	√		√		20
365	කෝලවත්ත 8 වන පටුමග	20	√				20
366	කෝලවත්ත 9 වන පටුමග	10	√		√		20
367	ග්‍රීන්ගාඩන් පාර	30	√				20
368	ෆාම්ග්‍රෝව්වත්ත උඩ රවුම් පාර	10	√	√			20
369	තල්ගස්මොටේ ගම්මැද පාර	15	√	√			25
370	ෆාම්ග්‍රෝව්වත්ත 1වන පටු මග	30	√				25
371	බෝලවත්ත	20	12√				20
372	ෆාම්ග්‍රෝව්වත්ත 2වන මාවත	20	√		√		20
373	ෆාම්ග්‍රෝව්වත්ත 3 වන මාවත	20	12√				20
374	තල්ගස්මොටේ පාසල් පටුමග	10	√	√	√		25
375	ගැමුණු මාවත	15	√	√			25
376	ෆාම්ග්‍රෝව්වත්ත 4 වන පටුමග	20	√		√		20
377	කෝලවත්ත අතුරු පාර 1 පටුමග	12		√			25
378	කෝලවත්ත අතුරු පාර 2 පටුමග	10	√				25
379	කෝලවත්ත 1 පටු මග	10			√		20
380	ෆාම්ග්‍රෝව්වත්ත 5 වන මාවත (දකුණ)	10	√				20
381	පිට්ටනිය යටි රවුම් පාර	15			√		20
382	නිවසිටි මාවත	30			√		25
383	නිවසිටි මාවත හරස් පාර -1	20			√		20
384	නිවසිටි මාවත හරස් පාර -11	20			√		20
385	සමගි මාවත (උදම්විට ක්‍රීඩාපිටිය හරහා)	20			√		20
386	නිවසිටි රවුම් මාවත 11	20			√		20
387	නිවසිටි රවුම් මාවත 1	20			√		20

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	කාර	කොන්.	බෙ	වෙ	අඩි
388	නිව්සිටි වත්ත -මැද පාර	20			√		25
389	නිව්සිටිවත්ත -පහළ මාවත	20			√		20
390	නිව්සිටිවත්ත පාර	20			√		25
391	පොදු පාර	10					25
392	පොදු පාර	10					20
393	මොරටුවත්ත රවුම් පාර	15		√	√		25
394	රසාරා කේක් කර්මාන්ත ශාලා පාර	20			√		20
395	මොරටුවත්ත පාර	20		√			25
396	අධ්‍යාපන විද්‍යාපීඨ පාර	30	√				20
397	තේක්කවත්ත 1 වන පටුමග	50	√				20
398	තේක්කවත්ත පාර	20		√			20
399	13 වන පටුමග	12			√		20
400	12 වන පටුමග	12			√		20
401	11 වන පටුමග	12			√		20
402	10 වන පටුමග	12			√		20
403	9 වන පටුමග	12			√		20
404	8 වන පටුමග	12			√		20
405	6 වන පටුමග	10			√		20
406	7 වන පටුමග	10			√		20
407	5 වන පටුමග	10			√		20
408	4 වන පටුමග	10			√		20
409	3 වන පටුමග	10			√		20
410	2 වන පටුමග	10			√		20
411	1 වන පටුමග	8	√				20
412	ශ්‍රී ධම්මානන්ද මාවත	18	√				25
413	දංවිලාන පාර11 අතුරු පාර	12		√			20
414	දංවිලාන පාර 1 අතුරු පාර	15			√		20
415	වියලේගොඩ පාර	20		√			20
416	වැව පෙදෙස	15			√		20
417	වයිට්වේල්වත්ත පාර	30	√				20
418	පොදු පාර	12		√			20
419	වලව්වත්ත පාර	20	√				20
420	ප්‍රගති මාවත	15		√			20
421	විජයරත්න පාර	12	√				20
422	පත්තලගෙදර රවුම් පාර	12	√	√			25
423	කොට්ටල පාර /මල්ලහැව පාර	30	√				50
424	එම්.ඕ.එච්.පාර	20	√				20
425	සමගි පාර	15			√		20
426	මැදවත්ත පාර	15	10√				25
427	අම්පෙගේවත්ත පාර	15	√		√		20
428	පොදු පාර	8		50√	√		20
429	තල්ගස්මොටේ කුඹල්ඕළුව පාර	30	15√				20
430	තල්ගස්මොටේ අලුත්වත්ත පාර	15	15√				20
431	පොදු පාර	10	√	√	√		20

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැඟිලි සීමාව
		අඩි	කාර	කොන්.	බොා	වෙ	අඩි
432	පොදු පාර	12	√				20
433	බණ්ඩාරනායක මහ විද්‍යාල පාර	30	√				30
434	විදුලිබල මණ්ඩලය/සළුසල පාර	20	√				20
435	ආර්ථික මධ්‍යස්ථාන පාර	30	√				25
436	බණ්ඩාරනායක මහ විද්‍යාල රවුම් පාර	10			√		20
437	පොදු පාර	20	√				20
438	වේටෙක්ස් ප්‍රධාන පාර	40	√				25
439	වේටෙක්ස් අතුරු පාර 2	30	√		√		20
440	වේටෙක්ස් අතුරු පාර	10					20
441	කුරී කොටුව පාර	15	√		√		20
442	නිල්දියලන්ද වත්ත 3 පාර	10			√		20
443	නිල්දියලන්ද වත්ත 2 පාර	15	√	√	√	√	20
444	පොදු පාර	15	√				20
445	නිල්දියලන්ද වත්ත පාර 1	15	√				25
446	රණසිංහ මාවත	12	√	√	√		30
447	සිරිවර්ධන හරස් පාර	40	√				25
448	සිරිවර්ධන මාවත	60	√				30
449	නිදහස් මාවත II අතුරු පාර	15	√				25
450	සිරිවර්ධන මාවත II වන අතුරු පාර	12	√		√		25
451	මිහිදු මාවත අතුරු පාර	12			√		25
452	මිහිදු මාවත	30	20√			√	25
453	පාරමුල්ල පාර (දාරළුව පාර)	20	15√				25
454	මිහිදු මාවත හරස් පාර (වටද්දර පාරට)	10	√	√			25
455	නිදහස් මාවත අතුරු පාර I	15	√				25
456	නිදහස් මාවත2	20	√				25
457	බාදුරාගොඩ පාර	40					50
458	නගර සභා ගෙවල් පාර	10	√				25
459	ජාතික නිවාස පාර	15		√			20
460	ජාතික නිවාස 2 පාර	15		√			20
461	ජාතික නිවාස 3 පාර	15	√				20
462	ආහාර ගබඩා පාර	30	√				25
463	විජය මාවත	10	√		√		25
464	ආසිරි මාවත	15		√	√		20
465	ගැමුණු මාවත /මීකාඩෝවත්ත පාර	30	√				20
466	ශ්‍රියා මාවත	12	√				20
467	නාරංවත්ත 11 වන පටුමග	10	√		√		20
468	දිමුතු මාවත	15	√				20
469	නාරංවත්ත 10 වන පටුමග	12	√				20
470	සරණ මාවත	15	√		√		20
471	නාරංවත්ත 9 වන පටුමග	15	√				20
472	වාසනා මාවත	10	√		√		20
473	මෛත්‍රී මාවත	10	√		√		20
474	නාරංවත්ත 8 වන පටුමග	10	√				20
475	නාරංවත්ත 7 වන පටුමග	15	√				20

අනු අංක	මාර්ගයේ නම	පවතින පළල	තත්ත්වය				යෝජිත ගොඩනැගිලි සීමාව
		අඩි	තාර	කොන්.	ඛොා	වෙ	අඩි
476	ජයශ්‍රී මාවත	20	√		√		20
477	අරුන මාවත	15	√		√		20
478	නාරංවත්ත 6 වන පටුමග	12		√			20
479	වීර මාවත	15	√		√		20
480	වේටෙක්ස් නිවාස පාර	15		√			20
481	කොලණිය පාර	10	√				20
482	වේටෙක්ස් පාර 2	15	√				20
483	වේටෙක්ස් පෙදෙස 1 පටුමග	15	√				20
484	පුබුදු මාවත - වටද්දර	15	√		√		25
485	පොදු පාර	10			√		20
486	ප්‍රජා මණ්ඩල පාර	15		√			25
487	වටද්දර පාර	30	√				25
488	රණවිරු දුමින්ද ගිහාන් මාවත	12			√		20
489	රජ මාවත	30	√				20
490	රජ මාවත අතුරු පාර 1	15	√				20
491	රජ මාවත අතුරු පාර 2	12	√				20
492	එළුවාපිටිය පාර	30	√				25
493	මිරිස්වැල්ලන්ද වත්ත පාර	20	√				25
494	මිරිස්වැල්ලන්ද. අතුරු පාර	15	√				20
495	දෙනිය පාර	12	√				25
496	අතුරු පාර 2	12		√			20
497	අතුරු පාර 3	10	√				20
498	දෙනිය අතුරු පාර	10	√				20
499	යුනිටි පාක් වෙන්දේසි වත්ත පාර	20			√		20
500	පොදු පාර	10		√	√		20

සංවර්ධන රෙගුලාසි

පටුන

වගු ලේඛණය

ඇමුණුම් ලේඛණය

1.0 මූලික අවශ්‍යතා

1.1 භූමියේ සුදුසු බව
1.2 භූමි භාවිතය
1.3 මූලික සැලසුම් නිරාකරණය
1.4 සැලසුම් අනුමැතිය
1.5 තට්ටු නිවාස හා නිවාස ඒකක සඳහා වින්‍යාස සැලසුම්

2.0 ඉඩම් අනුකොටස්වලට බෙදීම හා ඒකාබද්ධ කිරීම

2.1 මූලික අවශ්‍යතා
2.2 බිම් කොටස්වලට අදාල පිරිවිතර
2.3 පොදු විවෘත ප්‍රදේශ

3.0 ප්‍රවේශකත්වය

3.1 ප්‍රවේශය හා හැරවුම් වෘත්තය
3.2 වීථි කොන් රවුම් කිරීම

4.0 රථ වාහන නතර කිරීම හා රථ වාහන ගමනාගමන පාලනය

4.1 රථ වාහන නැවතුම් අවශ්‍යතා
4.2 රථ වාහන ගමනාගමන පාලනය

5.0 භූමි භාවිතය

5.1 භූමි ආවරණය
5.2 ගෙබිම් අනුපාතය

6.0 ගොඩනැගිලි වර්ගීකරණය හා උස

6.1 ගොඩනැගිලි වර්ගීකරණය
6.2 ගොඩනැගිලි උස
6.3 පා මහල හැර මහල් 4කට වඩා වැඩි උස ගොඩනැගිලි සඳහා වූ අමතර අවශ්‍යතා

7.0 ගොඩනැගිලි අවට විවෘත ප්‍රදේශ

7.1 පිටුපස ඉඩකඩ
7.2 පැති ඉඩකඩ
7.3 වීථි රේඛා හා ගොඩනැගිලි රේඛා
7.4 විදුලි රැහැන්වලට ඇති අවම පරතරය

8.0 ගොඩනැගිලි ඇතුලත රෙගුලාසි

8.1 ඇතුලත උස
8.2 ආලෝකය හා වාතාශ්‍රය සැපයීම
8.3 අභ්‍යන්තර මාන
8.4 තරප්පු
8.5 අක්තිවාරම්

9.0 සේවාවන්

9.1 ජල සම්පාදනය
9.2 වැසිජලය රැස් කිරීම හා ජලාපවහනය
9.2.1 සනීපාරක්ෂක පහසුකම්
9.3 ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම
9.4 විදුලි හා ජලනල වැඩ
9.5 ගින්නෙන් ආරක්ෂාව
9.6 විදුලි සෝපාන
9.8 යාන්ත්‍රිකව වාතාශ්‍රය ලබා දීම හා වායු සමීකරණය

10.0 සංවර්ධන කටයුතු සඳහා විශේෂ උපදෙස්

10.1 ගෘහ නිර්මාණ ශිල්පීය උපදෙස්
10.2 ඓතිහාසික හෝ ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කමක් හෝ භූ දර්ශනයේ වැදගත්කමක් ඇති ස්ථාන සංරක්ෂණය කිරීම
10.3 භූ දර්ශනය හා වෘක්ෂ සංරක්ෂණය කිරීම
10.4 ප්‍රවාරක දැන්වීම්
10.5 වෙනත් විශේෂ කලාප
10.6 ආබාධිත පුද්ගලයන් සඳහා පහසුකම්

11.0 අනුමැතිය සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම

11.1 සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා වන මූලික අවශ්‍යතා
11.2 සැලසුමක අඩංගු විය යුතු දේ
11.3 සැලසුමක ගුණාත්මක භාවය
11.4 ගෘහ නිර්මාණ ශිල්පීය, ව්‍යුහ සහ සේවා සැලසුම්
11.5 ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනා

12.0 අනුකූලතා සහතිකය

12.1 අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා වූ අවශ්‍යතා

13.0 අර්ථ නිරූපනය

1.0 මූලික අවශ්‍යතා

1.1 භූමියේ සුදුසු බව

(i) පහත දැක්වෙන අන්දමේ භූමි භාගයක කිසිදු සංවර්ධන කටයුත්තක් නොකළ යුතුය.

අ. අඟුළු, සත්ව හෝ ශාක ද්‍රව්‍ය කිසිවකින් සංයුක්ත වූ යම් ද්‍රව්‍යයකින් පුරවන ලද භූමි භාගයක් වෙතොත්, එකී ද්‍රව්‍ය ඒ භූමි භාගයෙන් සම්පූර්ණයෙන්ම ඉවත් කොට හෝ භූමි භාගයෙන් මතුපිට සම්පූර්ණයෙන් ම වැසෙන සේ පස් තට්ටුවකින් නැතහොත් වෙනත් යම් සුදුසු ද්‍රව්‍යයකින් යටත් පිරිසෙයින් සෙන්ටිමීටර් තිහක් ඝනකමට පුරවා, උපද්‍රව විරහිත බවට පත් කර ඇත්තේ නම් මිස, එවැනි භූමි භාගයක්;

ආ. ජල ගැල්මට යටත්වන භූමි භාගයක් නම්, සංවර්ධන කටයුත්තට හෝ ගොඩනැගිල්ලට හෝ භාවිතාවන භූමියේ මට්ටම සහ එය වටා ඉන් පිටත මීටර් 3ක් දුරට නැතහොත් භූමි භාගයේ මායිම දක්වා, යන මෙයින් වඩා ආසන්න දුර ප්‍රමාණය තෙක් වූ භූමියේ මට්ටම, ඒ භූමි භාගයේ දැනගන්නට ලැබී ඇති ඉහළම ජල ගැලීම් මට්ටමට වඩා සෙන්ටිමීටර් තිහක් උසට සිටින සේ සකස් කොට ඇත්තේ නම් මිස, එවැනි භූමි භාගයක්.

1.2 භූමි භාවිතය

(i) කිසිදු භූමි භාගයක් හෝ එවකට පවත්නා වූ නැතහොත් ඉදි කිරීමට අපේක්ෂා කරන යම් ගොඩනැගිල්ලක් අධිකාරිය විසින් අනුමත කරනු ලබන කාර්යය හැර අන් කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකළ යුතුය.

1.3 මූලික සැලසුම් නිරාකරණය

(i) හෙක්ටයාර් 0.5 ට වඩා නොඅඩු ඉඩම්වල ඕනෑම සංවර්ධන කාර්යයක් සඳහා මූලික සැලසුම් නිරාකරණය නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගත යුතුය.

(ii) මූලික සැලසුම් නිරාකරණය ලිඛිතව ඉල්ලුම් කරනු ලැබිය යුතු අතර, ඇමුණුම I හි දැක්වෙන අයදුම් පත්‍රයෙන් ඉල්ලීම් කළ යුතු අතර පනවනු ලබන සීමා කිරීම් සහ කොන්දේසි ඊට ඇතුලත් කරනු ලැබිය හැකිය.

(iii) මූලික සැලසුම් නිරාකරණය එක් වර්ෂයක කාල පරිච්ඡේදයකට පමණක් වලංගු වේ.

(iv) මූලික සැලසුම් නිරාකරණය අවසර පත්‍රයක් නොවන අතර, සංවර්ධන කටයුත්තක් සඳහා නිර්දේශයක් පමණක් වේ. කවර අන්දමක වුවද සංවර්ධන කටයුත්තක් ආරම්භ කිරීමට හෝ කරගෙන යාමට ඉල්ලුම්කරුට හෝ වෙනත් යම් තැනැත්තෙකුට හිමිකමක් ඉන් නොලැබේ.

1.4 සැලසුම් අනුමැතිය

(i) සැලසුම් අනුමැතිය සංවර්ධන අවසර පත්‍රයකින් නිකුත් කරනු ලබන අතර පනවනු ලබන සීමා කිරීම් සහ කොන්දේසි ඊට ඇතුලත් කරනු ලැබිය හැකිය.

(ii) එය එක් වර්ෂයක කාලපරිච්ඡේදයකට පමණක් සීමා විය යුතුය.

(iii) අධිකාරිය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට සහ එයට අදාල ගාස්තු ගෙවනු ලැබූ විට, සංවර්ධන අවසර පත්‍රයේ සඳහන් සංවර්ධන කටයුත්ත ආරම්භ කර ඇති නමුත් අනපේක්ෂිත පරිවේෂණ හේතුකොට ගෙන එය සම්පූර්ණ කළ නොහැකිව ඇති බවට අධිකාරිය සෑහීමකට පත් වන්නේ නම්, එම සංවර්ධන අවසර පත්‍රයේ වලංගු කාලය වර්ෂ තුනකට නොවැඩි වූ කාලයකට අධිකාරිය විසින් දීර්ඝ කරනු ලැබිය හැකිය.

(iv) සංවර්ධන අවසර පත්‍රය උල්ලංඝනය කරමින් කිසිදු සංවර්ධන කටයුත්තක් ආරම්භ කිරීම හෝ කරගෙන යාම නොකළ යුතුය.

(v) පහත දැක්වෙන කරුණක් හේතුකොට ගෙන අධිකාරිය විසින් සංවර්ධන අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකිය.

අ. අවසර පත්‍රයේ අඩංගු නියමයන් හෝ කොන්දේසි කඩ කිරීම

ආ. මේ නියෝගවල විධිවිධාන කිසිවක් උල්ලංඝනය කිරීම

ඇ. ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි සැලසුම් වල හෝ වෙනත් ලේඛණයක කරුණු වරදවා දක්වා තිබීම

ඈ 11.2 හා11.3 වන නියෝග යටතේ සඳහන් පරිදි සැලසුම්වල සහ අනෙකුත් විස්තර සැපයීමට අසමත් වීම

1.5 කට්ටු නිවාස හා නිවාස ඒකක සඳහා වින්‍යාස සැලසුම්

(i) අදාල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්මට අනුකූල වන්නේ නම්, කට්ටු නිවාස ඉදිකිරීම සඳහා හෝ නිවාස ඒකක ඉදිකිරීම සඳහා හෝ වෙනත් ඒකාබද්ධ යෝජනා ක්‍රම අධිකාරිය විසින් අනුමත කරනු ලැබිය හැකිය.

(ii) සභාධිපත්‍ය ගොඩනැගිලි ගණයට ඇතුළත් වන සංවර්ධන කටයුතු සඳහා පළාත් පාලන ආයතනය වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් නිකුත් කරන ලද නිරාකරණය ඉදිරිපත් කළ යුතුය.

(iii) අදාල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්මට අනුකූල වේ නම්, අඩු ආදායම් නිවාස ලාභීන් සඳහා නිවාස සැපයීම හෝ නැවත නිවාසගත කිරීම සඳහා යම් වින්‍යාස සැලසුම් හෝ යෝජනා ක්‍රම අධිකාරිය විසින් අනුමත කරනු ලැබිය හැකිය.

2.0 ඉඩම් අනු කොටස්වලට බෙදීම හා ඒකාබද්ධ කිරීම

2.1 මූලික අවශ්‍යතා

(i) කෘෂිකර්මය හෝ උද්‍යාන වැවීම නොවන වෙනත් යම් ප්‍රයෝජනයක් සඳහා නියමිත හෝ යෝජිත යම් ඉඩම් කැබැල්ලක් හෝ බිම් කොටසක් අනු කොටස්වලට බෙදීමට අදාල සැලැස්මක් අධිකාරිය විසින් අනුමත කළ යුතුය.

(ii) ඉඩම් අනුබෙදුම් ඇමුණුම II හි දක්වා ඇති ක්‍රියා පටිපාටියට අනුකූලව සිදුකළ යුතුය.

(iii) ඉඩමක් අනුකොටස්වලට බෙදීමට අදහස් කරන කවර වුවද තැනැත්තෙකු විසින් 11.2 (i) වන නියෝගයේ නියමයන්ට අනුකූල වූ ඉල්ලීමක් ඇමුණුම III හි දක්වා ඇති අයදුම් පත්‍රය මඟින් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

(iv) ඉඩමක් අනුකොටස්වලට බෙදීම සඳහා වූ සැලැස්මක් අනුමත කිරීමේදී අවශ්‍යයයි අධිකාරිය විසින් සලකනු ලබන පරිදි එය වෙනස් කරන ලෙස අධිකාරිය විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකිය. භූමි භාගයේ අනු බෙදුම් කළ යුත්තේ අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණකි.

(v) මූලික සැලසුම් අනුමැතිය ලැබෙන තුරු භූමිය පැවතුණු තත්ත්වයෙන් තිබිය යුතු අතර, පවතින ගස් කපා දැමීම,භූමිය පිරවීම හෝ හැරීම ආදී කිසිදු සංවර්ධන කටයුත්තක් නොකළ යුතුය.

(vi) හෙක්ටයාර් 0.5 හෝ ඊට වැඩි විශාලත්වයකින් යුත් ඉඩමක භූමි භාගයේ පැතුරුම් සැලැස්ම සැකසීමේදී හෝ අනුකොටස් වලට බෙදීමේදී වරලත් නගර නිර්මාණ ශිල්පියෙක් සහ බලයලත් මිනින්දෝරුවකු හා මට්ටමකරුවකුද, හෙක්ටයාර් 0.5 කට අඩුවන ඉඩමක භූමි භාගයේ පිරි සැලැස්ම සැකසීමේදී හෝ අනුකොටස් වලට බෙදීමේදී බලයලත් මිනින්දෝරු හා මට්ටමකරුවකු සහතික කළ යුතුය.

(vii) අධිකාරිය සෑහීමකට පත්වන පරිදි වීථි සළකුණු කොට ඒවායේ සම්පූර්ණ පළලට විවෘත කොට පොදු කාර්ය සංවර්ධන සහිතව සංවර්ධනය කර අනුකූලතා සහතිකය ලබා ගන්නා තෙක් අනුබෙදීමක යම් බිම් කොටසක් පාවිච්චි කිරීම හෝ එහි ගොඩනැගිලි ඉදිකිරීම නොකළ යුතුය.

(viii) ඒ භූමි භාගයේ එවකටත් පවතින යම් ගොඩනැගිල්ලක අදාල විවෘත ඉඩකඩ, ආලෝකය, වාතාශ්‍රය සහ වෙනත් අවශ්‍ය දේ මෙම නියෝගවලින් නියම කොට ඇති ප්‍රමාණවලට වඩා අඩුවන සේ අළුත් අනුබෙදීම් නොකළ යුතුය.

2.2 බිම් කොටස් වලට අදාල පිරිවිතර

(i) කලාපිකරණ රෙගුලාසිවල නියම කරනු ලැබ ඇත්තේ නම් මිස සියළු ඉඩම් කට්ටිවල අවම බිම් ප්‍රමාණය සහ අවම පළල වර්ගීකරණය වගුව 01 හි දක්වා ඇති පිරිවිතර වලට අනුකූල විය යුතුය.

(ii) ආවෘත කෙළවරක් ඇති වීථියක කෙළවරට යාබදව පිහිටි සෑම බිම් කොටසක් හෝ භූමි භාගයක් සඳහා වගුව 01 හි දක්වා ඇති පළලට වඩා අඩු පළලකින් යුතු මුහුණතක් තැබිය හැකි නමුත් ඒ මුහුණත වීථි රේඛාවට ලම්බකව ගත් මීටර් 3.0 කට නොඅඩු පළලකින් යුක්ත විය යුතුය.

(iii) යම් පවතින භූමියක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධව අනෙකුත් නියමතාවන් සපුරාලන්නේ නම්, ඉඩමක ප්‍රමාණය හා බිම් කට්ටියක පළල පිළිබඳව අවශ්‍යතා අධිකාරිය මගින් ලිහිල් කළ හැකිය.

වගුව 01

බිම් කොටස් සඳහා වන විශේෂ නියමතා

අවම බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	බිම් කොටස	ඉදිකිරීමට පිළිගත හැකි ඉහළම පළල (මීටර්)	ඉදිකිරීමට පිළිගත හැකි උපරිම උස (මීටර්)	පිටුපස අඩු ප්‍රමාණය (මීටර්)	නිසැකකාලීන අවශ්‍යතා සඳහා වාහනය ලබා ගැනීම සඳහා ඉඩ	ඉදි ඉඩකඩ (මීටර්) (ගොඩනැඟිල්ලේ ඉදිරිපස මෙන් පිටුපස නොවේ)		උපරිම භූමි ආවරණය (%)	උපරිම භූමි ආවරණය (%)	අවශ්‍යතා නියමතා
						එක් පැත්තක සඳහා	අනෙක් පැත්තේ සඳහා	තෝරාගත්	තෝරාගත්	
150	G	6	3.0	2.3	2.25	-		65	80	අධ්‍යාම වායු සමීකරණ හා කෘතිම ආලෝකය ලබාගන්නා ගොඩනැඟිලිවල විදුලි ජනක යන්ත්‍ර යවි කිරීම සඳහා ඉඩ පහසුකම් සැලසිය යුතුය
150	G+1	6	4.5	2.3	3.0	-		65	80	
150	G+2	6	6.0	3.0	4.5	-		65	80	
150	G+3	6	6.0	3.0	6.0	-		65	80	
250	G+4	8	9.0	4.5	7.5	2.0	2.0	65	80	• අධ්‍යාම වායු සමීකරණ හා කෘතිම ආලෝකය ලබාගන්නා ගොඩනැඟිලිවල විදුලි ජනක යන්ත්‍ර යවි කිරීම සඳහා ඉඩ පහසුකම් සැලසිය යුතුය • තෝරා, වාහන ක්‍රියාත්මක වීම විදුලි ජනක යන්ත්‍ර සහ පරිණාමක සඳහා ඉඩ පහසුකම් සැලසිය යුතුය.
400	G+5	10	9.0	4.5	9.0			65	80	
750	G+6	12	9.0	4.5	10.5			65	80	
750	G+7	15	9.0	4.5	12.0			65	80	
1000	G+8	18	12.0	6.0	13.5	3.0	6.0	65	80	
1000	G+9	22	12.0	6.0	15.0					
1500	G+10	26	12.0	6.0	16.5					
1500	G+11	30	12.0	6.0	18.0					
2000	G+12 සිට G+19දක්වා	40	12.0	10.0	19.5	3.0	8.0	50	50	
2000	G+20 සහ ඉන් ඉහළට	40	12.0	12.0	21.0	4.0	10.0	50	50	

•ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගැනීම සඳහා වූ දැර ප්‍රමාණය, එක් මහලක සාමාන්‍ය උස මීටර් 3ක් ලෙස සලකා ගණනය කර ඇත.

•පාසැල් සඳහා ඉදි කරනු ලබන ගොඩනැඟිලි වලට අදාල පිරිවිතරයන් ඇමිණුම IV හා V ට අනුකූල විය යුතුය.

•අධ්‍යාපනික අමතර පංති සඳහා ඉදි කරනු ලබන ගොඩනැඟිලි වලට අදාල පිරිවිතර ඇමිණුම VI ට අනුකූල විය යුතුය.

•රෝහල්, අධ්‍යාපන, මහජනයා රැස්වන ගොඩනැඟිලි සහ ආගමික ස්ථාන සඳහා ගෙබිම ආවරණය 50% ක් විය යුතුය.

2.3 පොදු විවෘත ප්‍රදේශ

(i) අනුකොටස්වලට බෙදීමට ඇති ඉඩම හෝ බිම් කොටස හෙක්ටයාර් 1.0 කට හෝ ඊට වැඩිවන අවස්ථාවකදී වීථි අත්හැරීමෙන් පසු, ඉඩමේ හෝ බිම් කොටසෙන් 10% ට නොඅඩු බිම් ප්‍රමාණයක්, ප්‍රජා හා විනෝද කටයුතු සහ එළිමහන් ප්‍රදේශ වශයෙන් භාවිතා කිරීම සඳහා සුදුසු ස්ථානවලින් වෙන් කරනු ලැබිය යුතු අතර එසේ වෙන් කරනු ලබන ප්‍රදේශ සියළු ගාස්තුවලින් තොරව පළාත් පාලන ආයතනය වෙත පවරා දෙනු ලැබිය යුතුය.

(ii) සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමට යෝජිත, බදු පදනම මත ලබා ගන්නා ඉඩම් කොටස හෙක්ටයාර් 1.0 ට නොඅඩු ඉඩමකින් අනුබෙදුම් වන අවස්ථාවලදී පහත සඳහන් කොන්දේසිවලට යටත්ව 10% විවෘත ප්‍රදේශය සඳහා වූ රෙගුලාසි බල නොපැවැත්වෙන පරිදි අනුබෙදුම් සිදුකළ හැකිය.

අ. සංවර්ධනය, සම්ප්‍රේෂණ කුළුණු හා ඊට අදාල ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා පමණක් සීමාවිය යුතුය.

ආ. සම්ප්‍රේෂණ කුළුණු සඳහා යෝජිත ඉඩම් කොටස හැර ඉතිරි ඉඩම් නැවතත් අනුබෙදුම් කරන්නේ නම් මුළු ඉඩමෙන් 10% ක විවෘත ප්‍රදේශය වෙන් කළ යුතුය.

ඇ. කුළුණු සඳහා වෙන්කරන ඉඩම් කොටස පසුව වෙනත් සංවර්ධන කාර්යයක් සඳහා යොදාගනු ලබන අවස්ථාවන් වලදී නව අනුබෙදුම් සැලැස්මක් නැවත අනුමත කරවා ගත යුතු අතර එහිදී සාමාන්‍ය ලෙස අනුබෙදුම් සඳහා වන රෙගුලාසි බලපැවැත්වේ.

3.0 ප්‍රවේශකත්වය

(i) නේවාසික ගොඩනැගිලි සඳහා ප්‍රවේශය

අ. පදිංචිය සඳහා වූ ඒකකවලට යාම ඊම පිණිස අදහස් කෙරෙන සෑම විටියක්ම මෙහි වගු අංක 02 හි දක්වා ඇති පිරිවිතරවලට අනුකූල විය යුතුය.

වගු 02

බිම් කට්ටි සඳහා ප්‍රවේශය

බිම් කට්ටි ගණන	බිම් කට්ටියක අනුමත උපරිම ඒකක ගණන	පාරේ අවම පළල (මීටර්)	පාරේ උපරිම දිග (මීටර්)
4 දක්වා	2	3.0	50
5 – 8	2	4.5	100
9 – 20	2	6.0	-
20ට වැඩි	2	9.0	-

ආ. වගු 02 හි දක්වා ඇති පරිදි පදිංචිය සඳහා වූ නිවාසයක ප්‍රවේශය අවම අවශ්‍යතාවලට අනුකූල විය නොහැකි බැව්, අත්තනගල්ල ප්‍රාදේශීය සභාපතිවරයා අදහස් කරන අවස්ථාවකදී, පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව සැලසුම් කමිටුවේ නිර්දේශය මත අවම ප්‍රවේශය මීටර් 2.0 කට නොවැඩි ප්‍රමාණයකින් අඩු කරනු ලැබිය හැකිය.

- ප්‍රවේශය සඳහා මීටර් 3.0 අවම පළලක් ලබාගත හැකි විය යුතුය.
- අළුත් අනුබෙදීමකට එකී අඩු කිරීම අදාල නොවිය යුතුය.

ඇ. එවැනි සෑම විටියක්ම මීටර් 9.0ට නොඅඩු පළලකින් යුත් පොදු විටියකට හෝ පෞද්ගලික විටියකට සම්බන්ධ විය යුතුය. එවැනි පෞද්ගලික විටියක අයිතිකරුට, පළලින් මීටර් 9.0 ට නොඅඩු පොදු විටියක් හා සම්බන්ධ වන මාර්ග අයිතියක් තිබිය යුතුය.

ඇ. මීටර් 9.0 ට වඩා අඩු පළලකින් සහ මීටර් 30.0 ට වඩා වැඩි දිගකින් යුත් සෑම විටියක්ම අවසන් වන කෙළවරේ හෝ අධිකාරිය විසින් සැහීමකට පත්වන ස්ථානයක වාහනය ආරක්ෂාකාරී ලෙස හරවා ගැනීම සඳහා විෂ්කම්භය මීටර් 9.0 ට නොඅඩු හැරවුම් වෘත්තයක් හෝ අධිකාරිය සැහීමකට පත්වන ආකාරයේ ඉඩ කඩක් මාර්ගයේ සැකසිය යුතුය.

(ii) නේවාසික නොවන ගොඩනැගිලි සඳහා ප්‍රවේශය

අ. විටියේ පළල මීටර් 9.0 ක් හා ආවෘත කෙළවරකින් යුත් මාර්ගයක මීටර් 15ක හැරවුම් වෘත්තයක් හෝ අධිකාරිය සැහීමකට පත්වන ආකාරයේ ඉඩකඩක් මාර්ගයේ කෙළවර හෝ සුදුසු ස්ථානයක සැපයිය යුතුය.

ආ. වගු අංක 03 හි සඳහන් පිරිවිතර වලට අනුකූල නොවන සෑම අවස්ථාවකදීම නේවාසික නොවන ගොඩනැගිලි සඳහා අවම ප්‍රවේශය මීටර් 9ක් විය යුතුය.

වගු 03

නේවාසික නොවන බිම් කට්ටි සඳහා ප්‍රවේශය

උපරිම බිම් කට්ටි සංඛ්‍යාව	සේවා සලසන බිම් කට්ටියක උපරිම විශාලත්වය (වර්ග මීටර්)	ප්‍රවේශයේ අවම පළල (මීටර්)	ප්‍රවේශයේ උපරිම දිග (මීටර්)
4	500	6.0	50
1	2500	6.0	150

(iii) ප්‍රවේශය ලබා දීමේ විශේෂ අවස්ථා

සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීමේදී සංවර්ධනය සඳහා ලබා ගත හැකි පාරේ පළල වශයෙන් පාරේ භෞතික පළල හෝ යෝජිත විටි රේඛාව යන දෙකෙන් වඩා අඩු මිනුම යොදාගත යුතුය. සංවර්ධන භූමියේ ඇති ප්‍රවේශ මාර්ගය අනුමත විටි රේඛාවක් මගින් ලකුණු කර ඇති අවස්ථාවක, ඉඩමේ අයිතිකරු විසින්

ඔප්පුවක් මගින් වීථි රේඛාව තුළ ඇති ඉඩම, අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන ආයතනයට හෝ මාර්ග සංවර්ධන අධිකාරියට, ඒ අධිකාරියට අතිරේක වියදමක් නොමැතිව ප්‍රදානය කරන්නේ නම්, වීථි රේඛාවේ සම්පූර්ණ පළල මාර්ගයේ නියම පළල වශයෙන් යෙදීම, අධිකාරිය විසින් සැළකිල්ලට ගත හැකිය.

3.1 වීථි කොන් රවුම් කිරීම

(i) ඉඩම් අනුබෙදුම් කිරීමේදී හෝ ගොඩනැගිලි / මායිම් තාප්ප / වැටවල් ඉදි කිරීමේදී වීථි දෙකක් හමුවන මුල්ලක පිහිටි ඉඩම් කොටස් වීථි පරිහරණය කරන්නන්ගේ ආරක්ෂාව සැලසීමට අවශ්‍ය වන පරිදි රවුම් කළ යුතු අතර, අධිකාරිය විසින් නියම කරනු ලබන අවස්ථාවන්හිදී හැර අන් සියළු අවස්ථාවන්හිදී මායිම් ඡේදනය වන ලක්ෂ්‍යයේ සිට වීථියේ පළලින් අඩක් දුරින් පිහිටි ලක්ෂ්‍යවල සිට සුදුසු පරිදි රවුම් කරන ලෙස හෝ ගාන ලෙස අධිකාරිය විසින් නියම කරනු ලැබිය යුතුය.

4.0 රථ වාහන නතර කිරීම හා රථ වාහන ගමනාගමන පාලනය

4.1 රථ වාහන නැවතුම් අවශ්‍යතා

(i) වාහන නැවතුම් ඉඩකඩ සඳහා ප්‍රමිතීන්

සංවර්ධන අවසර පත්‍රයක් ලබා ගැනීම පිණිස වූ අයදුම් පත්‍ර සමඟ ඉදිරිපත් කරනු ලබන සෑම සැලැස්මකම වගු 04 හි දැක්වෙන ප්‍රමිතීන්වලට අනුකූලව, වාහන නැවතුම් පෙදෙස් අවම සංඛ්‍යාවක් සඳහා ඉඩකඩ දක්වා තිබිය යුතුය.

භාවිතය	වාහන නැවතුම් පොලවල් සංඛ්‍යාව				වර්ගය අනුව අවම ශාල් සංඛ්‍යාව
	කාර් හෝ ඒ හා සමාන (S)	ඇක්සල 2 වාණිජ වාහන (ලොරි/බස්රථ) (C)	බහු ඇක්සල වාණිජ වාහන (ට්‍රක්රථ) (T)	මෝටර් සයිකල් තිරෝදරථ (M)	
v. හෝටල්, ආගන්තුක නිවාස සහ සමාජ ශාලා	මුළු වර්ග ප්‍රමාණයෙන් සෑම වර්ග මී. 50 ක් සඳහාම එක් ඉඩක් හෝ කාමර 2ක් සඳහා එක් ඉඩක් සහ නේවාසික කට්ටලයක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මී. 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් දෙකක් සහ M වර්ගයෙන් දෙකක්
vi. ආහාර විකිණීමේ ස්ථාන	ව. මී. 20ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මී. 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් දෙකක් සහ M වර්ගයෙන් දෙකක්
vii. ආහාර ගැනීමේ ස්ථාන	ව. මී. 10ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මී. 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් දෙකක් සහ M වර්ගයෙන් දෙකක්
3. විනෝද කටයුතු		-	-	වර්ග මී. 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් දෙකක් සහ M වර්ගයෙන් දෙකක්
i. සිනමාශාලා, රඟහල් ශ්‍රවනාගාර සහ වෙනත් එවැනි භාවිත	ආසන 20ක් සඳහා එක් ඉඩක් හෝ ව.මී.10ක් සඳහා එක් ඉඩක් යන මින් වැඩි අගය				
ii. බහුකාර්ය ගොඩනැගිලි	ව. මී. 5ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මී. 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් දෙකක් සහ M වර්ගයෙන් දෙකක්
4. කර්මාන්ත			-	වර්ග මී. 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් දෙකක් සහ M වර්ගයෙන් දෙකක්
i. කර්මාන්ත ශාලා, කාර්මික ආයතන හා ගුදම්	ව. මී. 100ක් සඳහා එක් ඉඩක්	ව. මී. 100ක් සඳහා එක් ඉඩක්			
5. ආයතන		-	-	වර්ග මී. 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් තුනක් සහ M වර්ගයෙන් දෙකක්
i. ඝාත්තු නිවාස හා පෞද්ගලික රෝහල්	ව. මී. 20ක් සඳහා එක් ඉඩක්				
ii. වෛද්‍ය උපදේශක කාමර	ව. මී.10ක් සඳහා ඉඩකඩ 6ක්	-	-	වර්ග මී. 10ක් සඳහා ඉඩකඩ තුනක්	S වර්ගයෙන් තුනක් සහ M වර්ගයෙන් තුනක්
iii. වෛද්‍ය පර්යේෂණායතන	ව. මී. 10 ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මීටර් 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් දෙකක්
iv. බාහිර ප්‍රතිකාර මධ්‍යස්ථාන	ව. මී. 5ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මීටර් 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් දෙකක් සහ M වර්ගයෙන් තුනක්

වගු 04
වාහන නැවතුම් ඉඩකඩ සඳහා ප්‍රමිතීන්

භාවිතය	වාහන නැවතුම් පොලවල් සංඛ්‍යාව				වර්ගය අනුව අවම ගාල් සංඛ්‍යාව
	කාර් හෝ ඒ හා සමාන (S)	ඇක්සල 2 වාණිජ වාහන (ලොරි/බස්රථ) (C)	බහු ඇක්සල වාණිජ වාහන (ට්‍රක්රථ) (T)	මෝටර් සයිකල් ත්‍රීරෝදරථ (M)	
1.නේවාසික i.දළ ගෙබිම ප්‍රමාණය ව. මී. 200ට වැඩි පදිංචිය සඳහා වූ ඒකක	එක් ඒකකයක් සඳහා එක් ඉඩකඩක්	-	-	-	S වර්ගයෙන් එකක්
ii. ඒකකයක දළ ගෙබිම ප්‍රමාණය ව. මී. 100ට වැඩි තට්ටු නිවාස	එක් ඒකකයක් සඳහා එක් ඉඩකඩක්	-	-	-	S වර්ගයෙන් එකක්
iii. ඒකකයක දළ ගෙබිම ප්‍රමාණය ව.මී. 75-100 දක්වා තට්ටු නිවාස	එක් ඒකකයක් සඳහා එක් ඉඩකඩක්	-	-	-	S වර්ගයෙන් එකක්
iv. ඒකකයක දළ ගෙබිම ප්‍රමාණය ව.මී. 50-75 දක්වා තට්ටු නිවාස	එක් ඒකකයක් සඳහා එක් ඉඩකඩක්	-	-	-	S වර්ගයෙන් එකක්
v. ඒකකයක දළ ගෙබිම ප්‍රමාණය ව.මී. 50ට අඩු තට්ටු නිවාස	ඒකක පහක් සඳහා එක් ඉඩක්	-	-	-	S වර්ගයෙන් එකක්
2. වාණිජ i. සාප්පු හෝ වෙනත් වාණිජ ගොඩනැගිලි	වර්ග මීටර් 100ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මීටර් 20ක් සඳහා එක් ඉඩක් සහ උපරිම වශයෙන් එක් සංවර්ධනයක් සඳහා ඉඩකඩ 25ක්	M වර්ගයෙන් එකක්
ii. සුපිරි වෙළඳ සැලක් සහ දෙපාර්තමේන්තු ගබඩා	වර්ග මීටර් 10ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මීටර් 20ක් සඳහා එක් ඉඩක් සහ උපරිම වශයෙන් එක් සංවර්ධනයක් සඳහා ඉඩකඩ 25ක්	S වර්ගයෙන් හතරක්
iii. නිමි ඇඳුම් වෙළඳ සැල්	වර්ග මීටර් 10ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මීටර් 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් හතරක් සහ M වර්ගයෙන් දෙකක්
iv. ආපනශාලා සහ රාත්‍රී සමාජශාලා	වර්ග මීටර් 10 ක් සඳහා එක් ඉඩක් (සියළු සේවා ප්‍රදේශ ඇතුලත්ව)	වර්ග මීටර් 500ක් සඳහා එක් ඉඩක්	-	වර්ග මීටර් 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් එකක් හා M වර්ගයෙන් දෙකක්

v. රජයේ පාසල්	ව. මී. 100 ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මීටර් 100ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් පහක්
භාවිතය	වාහන නැවතුම් පොලවල් සංඛ්‍යාව				වර්ගය අනුව අවම ගාල් සංඛ්‍යාව
	කාර් හෝ ඒ හා සමාන (S)	ඇක්සල 2 වාණිජ වාහන (ලොරි/බස්) (C)	බහු ඇක්සල වාණිජ වාහන (ට්‍රක්ස්) (T)	මෝටර් සයිකල් තිරෝදරථ (M)	
vi. පුද්ගලික පාසල්	සිසුන් 30ක් සඳහා එක් ඉඩක්	-	-	වර්ග මීටර් 100ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් පහක්
vii. ජාත්‍යන්තර පාසල්	සිසුන් 20ක් සඳහා එක් ඉඩක්			වර්ග මීටර් 100ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් අටක්
viii. වෘත්තීය අධ්‍යාපන ආයතන	ව. මී. 10 ක් සඳහා එක් ඉඩක්			වර්ග මීටර් 50ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් තුනක්
ix. ළදරු පාසල් හා ළමා සුරැකුම් මධ්‍යස්ථාන	ව. මී. 50 ක් සඳහා එක් ඉඩක්	-	-	-	S වර්ගයෙන් එකක්
x. තාක්ෂණික සෞන්දර්ය ක්‍රීඩා හා උපකාරක පංති වැනි අධ්‍යාපන ආයතන	ව. මී. 20 ක් සඳහා එක් ඉඩක්			වර්ග මීටර් 10ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් එකක් සහ M වර්ගයෙන් තුනක්
xi. පුස්තකාල	ව. මී. 50 ක් සඳහා එක් ඉඩක්			වර්ග මීටර් 20ක් සඳහා එක් ඉඩක්	S වර්ගයෙන් එකක් සහ M වර්ගයෙන් දෙකක්
6. වෙනත්	ව. මී. 100කට එක් ඉඩකඩකට නොඅඩු වන සේ එවන් භාවිතාවන් සඳහා කැබිය යුතු ඉඩකඩ අධිකාරිය මගින් නිශ්චය කරනු ලැබිය හැකිය.				

සටහන:-

1. ඉහත සඳහන් ප්‍රමිති අනුව ගණන් බැලීමේදී මෝටර් රථ නවතා තැබීමේදී ලැබෙන ඉඩකඩ සංඛ්‍යාවට භාගයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක කොටසක් වන විට එය එක් ඉඩකඩක් ලෙස සළකනු ලැබිය යුතුය.
2. ඉහත අංක 5 (v), 5(vi) සහ5 (vii) හි සඳහන් භාවිතයන් සඳහා සිසුන් බැස්සවීම සහ නැග්ගවීම සඳහා මාර්ගයේ වාහන නැවතීම තහනම් වන අතර, ඒ සඳහා සුදුසු ප්‍රදේශයක් සංවර්ධන භූමිය තුළින් සැපයිය යුතුය.

(iii) වාහන ගාල්වල කොටසක මානයන් වාහන ගාල්වල කොටසක මානයන් වගු අංක 05 හි පිරිවිතරවලට අනුකූල විය යුතුය.

(iv)

වගු අංක 05

වාහන ගාල්වල කොටසක මානයන්

වාහන වර්ගය	කොටසක පළල (මීටර්) (ආනත හෝ සමාන්තර ගාල්)	කොටසක දිග (මීටර්)	
		(ආනත ගාල්)	(සමාන්තර ගාල්)
කාර් හෝ ඒ හා සමාන	2.4	4.8	5.5
වාණිජ වාහන (ඇක්සල 2)	3.6	10	12
වාණිජ වාහන (බහු ඇක්සල)	3.6	18	20
මෝටර් බයිසිකල් හෝ ත්‍රිරෝද රථ	2.1	2.4	2.5
බයිසිකල්	0.6	2.25	2.25

(iii) කුළු මංවල පළල

රථ වාහන නැවතුම් ස්ථානවල තබන කුළුමංවල පළල වගුව 06ට අනුකූල විය යුතුය.

වගු අංක 06

රථ වාහන නැවතුම් ස්ථානවල කුළුමංවල පළල

රථ නවතා තබන කෝණ කුළුමංවලට සාපේක්ෂව	එක දිශාවකට පමණක් ධාවනය		දෙදිශාවටම ධාවනය	
	එක් පැත්තකට පමණක් නැවතුම් ස්ථාන (මීටර්)	දෙපැත්තේම නැවතුම් ස්ථාන (මීටර්)	එක් පැත්තක පමණක් නැවතුම් ස්ථාන (මීටර්)	දෙපැත්තේම නැවතුම් ස්ථාන (මීටර්)
සමාන්තර	3.6	3.6	6.0	6.0
30^0 ට	3.6	4.2	6.0	6.0
45^0 ට	4.2	4.8	6.0	6.0
60^0 ට	4.8	4.8	6.0	6.0
90^0 ට	6.0	6.0	6.0	6.0

(iv) වාහන ගාලකට ඇතුල්වීම සහ පිටවීමේ දොරකඩෙහි පළල

වාහන නැවතුම්පලට ඇතුළු වීම හා පිටවීම සඳහා වන දොරකඩෙහි පළල සියළු පදික වේදිකා හා අවහිරතාවලින් තොරව වගු අංක 07 හි සඳහන් පරිදි විය යුතුය.

වගු අංක 07

රථ වාහන නැවතුම්පලවල ඇතුල්වීම සහ පිටවීමේ ප්‍රවේශයේ පළල

	කාර් හෝ ඒ හා සමාන රථ (මීටර්)	වාණිජ වාහන (මීටර්)
ඇතුළුවීම සහ පිටවීම වෙන වෙනම සපයා ඇති විට	3.0	4.5
ඇතුළුවීම සහ පිටවීම එකට සපයා ඇති විට	5.5	6.5

(v) බෑවුම් මග

අ. වාහන නැවතුම්පලට ඇතුළුවීම සහ පිටවීම සඳහා වූ ප්‍රවේශය බෑවුම් මගකින් සලසන විට බෑවුම් දිග මීටර් 12 ක් හෝ ඊට අඩු අවස්ථාවලදී බෑවුම් මගෙහි උපරිම බෑවුම 1:8 හා මීටර් 12ට වැඩි අවස්ථාවලදී 1:10ට නොඅඩු විය යුතුය.

ආ. එවැනි සෑම බෑවුමක්ම වීථියේ දාරයේ සිට අවම වශයෙන් මීටර් 6.0 කට ඇතින් හෝ ගොඩනැගිලි සීමාව/වීථි රේඛාව යන දුරවල්වලින් වැඩි දුරින් ආරම්භ විය යුතුය.

ඇ. වාහන නැවතුම්පලට ඇතුළුවීම සහ පිටවීම සඳහා වූ ප්‍රවේශය බැවුම් මගකින් වෙන වෙනම සපයා ඇති විට සියළු පදික වේදිකා හා අනෙකුත් බාධක හැර, බැවුම් මගේ පළල මීටර් 3.5 කට නොඅඩු විය යුතු අතර, ඇතුළුවීම හා පිටවීම එකට සපයා ඇති අවස්ථාවන්හිදී සියළු පදික වේදිකා හා අනෙකුත් බාධක හැර බැවුම් මගේ පළල මීටර් 6.0 ක් විය යුතු අතර, මාර්ග මධ්‍ය බෙදුමකින් තොර විය යුතුය.

ඈ. මහල් කීපයකින් යුතු රථ ගාල්වල බැවුම් මග සඳහා අවම උස මීටර් 2.1ක් විය යුතුය.

(vi) නියමිත වාහන නැවතුම්පලවල් භූමිය තුළ සැපයීමට නොහැකි අවස්ථා

අ. නියමිත වාහන නැවතුම්පලවල් සංඛ්‍යාව සැපයීමට අයිතිකරුට නොහැකි වන හෝ සතුටුදායක අන්දමට වාහන නැවතුම් පහසුකම්, ඒ භූමි භාගයේ සැපයිය නොහැකි යැයි අධිකාරිය අදහස් කරන අවස්ථාවකදී, භූමි භාගයෙහි සපයා නොමැති එක් එක් වාහන නැවතුම්පල සම්බන්ධයෙන්, වගු අංක 21 හි දක්වා ඇති සේවා ගාස්තුවක් පළාත් පාලන ආයතනය වෙත ගෙවිය යුතුය.

ආ. රථ නැවැත්වීම සඳහා අනුමත කර ඇති ඉඩකඩ රථ නැවැත්වීම හැර වෙනත් යම් කටයුත්තකට යොදා ඇතැයි දැන ගනු ලබන අවස්ථාවක අනුමත රථ නැවැත්වීමේ ඉඩකඩ ප්‍රමාණයන් අඩු වී ඇති එක් එක් රථ නැවැත්වීමේ ඉඩකඩ සඳහා මාසයකට රු5000 ක සේවා ගාස්තුවක් අධිකාරිය අයකළ යුතුය. එම ගාස්තු එම කාර්යය සඳහා යොදාගෙන ඇති ඉඩ ප්‍රමාණ සංවර්ධනය අවසර පත්‍රයේ අනුමත කර ඇති පරිදි වාහන නැවැත්වීමේ ඉඩකඩ බවට නැවත පත් කෙරෙන තෙක් දිගටම අය කළ යුතුය.

4.2 රථවාහන ගමනාගමන පාලනය

(i) රථවාහන ගමනාගමනය කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා යම් සංවර්ධන සැලැස්මක පහත දැක්වෙන දේ සඳහා විධි විධාන සලස්වා තිබිය යුතුය.

අ. පාර මුහුණත මීටර් 12.0 ට අඩු පළලින් යුත් බිම් කට්ටි සඳහා ප්‍රවේශ සහ බැහැර දොරටු එකක් පමණක් තිබිය යුතුය. එසේ වුවද, පාර මුහුණත පළල මීටර් 12.0 ට වැඩි වන්නේ නම්, එවැනි බිම්කට්ටි සඳහා ප්‍රවේශ හා බැහැර දොරටු එකකට නොවැඩි ස්ථාන ගණනක් සඳහා අවසර දීම ගැන අධිකාරිය විසින් සලකා බැලිය හැක.

ආ. සංවර්ධන භූමිය ඇතුලත රථ නවතා තැබීමේ අවශ්‍යතාවය නේවාසික සංවර්ධනය සඳහා නැවතුම් ඉඩකඩ 100ට වැඩිවන සහ නේවාසික නොවන සංවර්ධනය සඳහා නැවතුම් ඉඩකඩ 50ට වැඩිවන අවස්ථාවකදී, අවස්ථානුකූලව අවශ්‍ය විය හැකි පරිදි සහ සංවර්ධන භූමියට ප්‍රවේශ වන මාර්ගයේ රථ වාහන ගමනාගමනයට අවම බලපෑමක් ඇති වන පරිදි සැලසුම් කළ රිය හැසිරවිය හැකි මීටර් 30 නොඅඩු මංතීරුවක් හෝ රිය රැඳවුම් අතුරු ඉඩක් සැලැස්විය යුතුය.

ඇ. මාර්ග දෙකක් ඡේදනය වන අවස්ථාවේදී එක් එක් මාර්ගයේ සාමාන්‍ය වාහන ගලනය දිනකට වාහන 10,000 ක් වේ නම්, එවැනි මංසන්ධියක සිට මීටර් 25 ක අරයකින් යුත් ප්‍රදේශයක් ඇතුලත රථ වාහන නවත්වන ඉඩකඩ අවශ්‍යතාව 50කට වඩා වැඩිවන සංවර්ධනයන් සඳහා අවසර දිය නොහැක.

ඈ. පාරට මුහුණලා ඇති යම් ගොඩනැගිල්ලක බිම් මහලට, පළමු මහලට හා දෙවන මහලට පරාවර්තක විදුරු භාවිත නොකළ යුතුය.

(ii) අනුමත සංවර්ධනය සඳහා අවසරදී ඇති, අනුමත රථ නැවැත්වීමේ සහ රථ වාහන ගමනාගමන පාලන නියමයන්ට වෙනස්ව කටයුතු කරන බවට සැක කෙරෙන, යම් ගොඩනැගිල්ලකට ඇතුළු වී පරීක්ෂා කරන ලෙස අධිකාරිය විසින් පොලිසියෙන් ඉල්ලා සිටිය හැකිය.

(iii) අධිකාරිය විසින් යම් ප්‍රදේශයක් හෝ මාර්ගයක් වාහන සීමා කිරීමේ ප්‍රදේශයක් හෝ මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවන්හිදී, එම ප්‍රදේශයන්හි සංවර්ධන කටයුතු සඳහා උපරිම වාහන ගාල් ගණන නියම කළ හැක.

(iv) වාහන නැවතුම් ඉඩකඩ දෙකකට වැඩි ප්‍රමාණයක් සැපයිය යුතු යයි නියම කරන ලද ගොඩනැගිලිවල රථ වාහන නැවැත්වීමේ හා පසු පසට ගැනීමේ හැකියාව සම්පූර්ණයෙන් එම ප්‍රදේශය තුලම පිහිටිය යුතුය. එසේ නොමැතිව වීථිවලට වාහන පිටුපසට ගැනීම සඳහා අවසර නොමැත.

(v) වාහන නැවැත්වීමේ ඉඩකඩ සඳහා අවශ්‍යතාවය වාහන දෙකක් හෝ ඊට අඩු ප්‍රමාණයක් වන අවස්ථාවලදී පහත සඳහන් කොන්දේසිවලට යටත්ව කෝණික රථ වාහන ගාලක් සඳහා සෘජුවම වීථියෙන් ප්‍රවේශකත්වයක් ලබා ගැනීම අනුමත කළ හැක.

අ. වාහන ගාල් කිරීමේ කෝණය 45^0 හෝ ඊට අඩු විය යුතුය. සහ

ආ. බස් නැවතුම් ස්ථාන, ආවරණය කරන ලද බස් නැවතුම් හෝ ඇතුලට නෙරා පිහිටි බස් නැවතුම් ස්ථානයන්හි සිට රථ වාහන නැවතුම් ස්ථාන හෝ ඊට ප්‍රවේශ වන ස්ථාන හෝ ඉන් කොටසක් මීටර් 15 ට වඩා වැඩි දුරකින් පිහිටිය යුතුය. සහ

ඇ. එම රථ වාහන නැවතුම් ස්ථාන හෝ ඊට ප්‍රවේශ වන ස්ථාන මගීන් පාර හරහා මාරුවන ස්ථානයන්හි සිට මීටර් 25කට වඩා වැඩි දුරකින් පිහිටිය යුතුය. සහ

ඈ. එම රථ වාහන නැවතුම් ස්ථාන හෝ ඊට ප්‍රවේශ වන ස්ථානයන්හි සිට මීටර් 25 ක දුර සීමාවක් තුල වෙනත් හරස් මාර්ගයකට සම්බන්ධවී නොතිබිය යුතුය. සහ

ඉ. වාහන දෙකක් සඳහා වාහන නැවැත්වීමේ ඉඩකඩ සපයා ඇති විටක ඊට වඩා වැඩි වාහන ප්‍රමාණයක් නැවැත්වීම වළක්වා ලීම සඳහා අදාල භෞතික සීමාවන් අධිකාරියේ එකඟතාවය මත පැනවිය යුතුය. සහ

ඊ. වාණිජ රථවාහන නැවත්වීම සඳහා අවශ්‍යතාවයක් නොවිය යුතුය.

උ. මෙම වීථිය අධිවේගි මාර්ගයක් නොවිය යුතුය.

(vi) මෙම රථ වාහන නැවැත්වීමේ ප්‍රදේශය තුලට ප්‍රවේශ වීමේ හෝ පිටවීමේ ස්ථාන හරහා පැති මාර්ගයක් වැටෙන විටෙක අධිකාරියේ නියමයන්ට අනුකූලව සංවර්ධනකරුගේ වියදමෙන් මගීන්ට බාධාවක් නොවන පරිදි විශේෂයෙන් ආබාධිත පුද්ගලයන් කෙරෙහි සැලකිලිමත්ව එම පැති මාර්ගය ඉදි කළ යුතුය. එමෙන්ම, එම ඇතුළු වීමේ සහ පිටවීමේ ස්ථාන හරහා මගීන් මාරුවීමේ ස්ථාන සංවර්ධනකරුගේ වියදමින් පාට කර දැක්විය යුතු බවට හා එය නඩත්තු කළ යුතු බවට අධිකාරිය විසින් නියම කළ හැකිය.

(vii) වීථියට ප්‍රවේශ වීමේ හා පිටවීමේදී ඇතුලට හා පිටට වාහන හැරවීමේ අරයේ අවමය වගුව 08 හි දැක්වෙන නියමයන්ට අනුකූල විය යුතුය.

වගු අංක 08

අවම හැරවුම් අරය

	මගී කාර්	ඇක්සල් දෙකෙහි වාණිජ වාහන	බහු ඇක්සල වාණිජ වාහන
ඇතුලත හැරවුම් අරය (මීටර්)	7.3	12.8	13.8
පිටත හැරවුම් අරය (මීටර්)	4.7	8.7	6.9

(viii) ආරක්ෂක වැටලීම් හා රථ වාහන නැවතුම් පාලනය කිරීමේ කාර්යයන්හිදී එනම් මාර්ග බාධක, ආරක්ෂක කුටි ඉදි කිරීමේදී විජියේ මායිම් සීමාවේ සිට අවම වශයෙන් මීටර් 6ක දුරකින් ඉදි කළ යුතුය. සෑම වාහන නැවතුම් ස්ථාන 25කට හෝ ඉන් කොටසකට එකී අනුමත දුර ප්‍රමාණය වන මීටර් 6ට අමතරව තවත් මීටර් 6ක දුරක් තැබිය යුතු අතර, එය එම පටු මාර්ගයේම හෝ පටු මාර්ග කිහිපයක තැබිය හැක.

යම් අවස්ථාවකදී වගු අංක 08 හි සඳහන් වාහන හැරවුම් අරයේ අවමය සංවර්ධනයේදී සැපයිය නොහැකි බැව් අධිකාරියට ඒත්තු ගන්වා ඇති විට, අදාල ප්‍රදේශය තුලම මීටර් 3කට නොඅඩු පටු මාවතක් විජියේ රථ වාහන තදබදය අවම වන ලෙස නිර්මාණය කළ යුතු අතර, ඒ සඳහා අධිකාරියේ අනුමැතිය ලබා ගත යුතුය.

(ix) බර කිරීමේ ස්ථාන අවම වශයෙන් විජි සීමාවේ සිට මීටර් 20 ක් දුරින් පිහිටා තිබිය යුතුය. සෑම වාණිජ වාහන ගාල් 15කට හෝ ඉන් කොටසක් සඳහා මෙම දුර ප්‍රමාණය තවත් මීටර් 15 කින් වැඩි කළ යුතු අතර, එය එකම පටු මාවතේ හෝ පටු මාවත් කිහිපයක සැපයිය හැක.

(x) වාහන නැවතුම් පලවල් සඳහා බෑවුම් උපරිම වශයෙන් 1:20 ක් නොඉක්ම විය යුතුය.

5.0 භූමි භාවිතය

5.1 භූමි ආවරණය

දක්වා ඇති කවර වුවද, කාර්යයක් සඳහා යම් භූමි භාගයක ඉඩ දෙනු ලැබිය හැකි උපරිම බිම් ආවරණය වගු අංක 01හි දක්වා ඇති නියමයන්ට අනුකූල විය යුතුය.

5.2 ගෙබිම් අනුපාතය

(i) ගෙබිම් අනුපාතය = $\frac{\text{භූමියේ පවතින සියළුම ගොඩනැගිලිවල වර්ගඵලය}}{\text{භූමියේ වර්ග ඵලය}}$

(ii) යම් භූමි භාගයක් සඳහා ගෙබිම් අනුපාතය අදාල ප්‍රදේශය සඳහා පිලියෙල කරන ලද සංවර්ධන සැලැස්මෙහි කලාපිකරණ සැලසුමට අනුකූල විය යුතුය.

(iii) ගෙබිම් අනුපාතය ගණනය කිරීමේදී පහත සඳහන් ගොඩනැගිලි කොටස් අත්හැරිය හැක.

අ. රථ වාහන ගාල් සඳහා භාවිතා කරන පා මහල්

ආ. වායු සම්කරණ යන්ත්‍ර තැබීමට භාවිතා කරන ඉඩකඩ

ඇ. වෙනත් සේවා සැපයීමේ යන්ත්‍ර සඳහා භාවිතා කරන ඉඩකඩ

ඈ. ගොඩනැගිල්ලක යම් ගෙබිම් මට්ටමක පිහිටි වාහන නැවැත්වීමේ ස්ථීර ඉඩකඩ

6.0 ගොඩනැගිලි වර්ගීකරණය හා උස

6.1 ගොඩනැගිලි වර්ගීකරණය

ගොඩනැගිලි වර්ගීකරණය වගු අංක 09 හි ආකාරයට දැක්විය හැක.

වගුව 09
ගොඩනැගිලි වර්ගීකරණය

ගොඩනැගිලි වර්ගය	විස්තරය	අනිකුත් අවශ්‍යතා
A	අ. බිම් මහල ඇතුළුව මහල් පහක් හෝ ඊට වැඩි මහල් සංඛ්‍යාවකින් යුත් ගොඩනැගිලි හෝ ආ. යාබද විදී මට්ටමේ සිට මීටර් 15කට වඩා උස ගොඩනැගිලි	- ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී වගුව 22 (III) තීරයේ සඳහන් විශේෂ කාර්යයන් සඳහා වගුව 22 (IV) තීරුවේ සඳහන් සුදුසුකම්ලත් තැනැත්තකු විසින් හෝ සේවාවේ යෙදවීමට සුදුසු යැයි රජය විසින් පිලිගනු ලබන තැනැත්තකු විසින් සහතික කල යුතුය.
B	අ. අයි උස ගොඩනැගිල්ලක් නොවන්නා වුද පහත දැක්වෙන අංගවලින් යුක්ත වූද යම් ගොඩනැගිල්ලකින් සමන්විත වේ. i. බිම් මහලද ඇතුළුව මහල් හතරකට වැඩි නොවන මහල් ගණනකින් සමන්විත බිත්තියක් හෝ කුළුණක් ඉඩමේ මායිමේ පිහිටියා වූද යම් ගොඩනැගිල්ලක්; ii. පා මහල - ගොඩනැගිල්ලක වහල, අත්තිවාරම, බාල්ක හා අනෙකුත් කොටස්; iii. ටැම් අත්තිවාරමක් හෝ පහුරු අත්තිවාරමක්; iv. දිග මීටර් 10 ට වඩා විසිරි ඇති වහලයක්; v. මහජනයා රැස්වන ස්ථානයක් හෝ පොදු ගොඩනැගිල්ලක්; vi. ගබඩා සහ කර්මාන්තශාලා වැනි සුළං සංවේදිත ගොඩනැගිල්ලක්; සහ vii. "ඒ"හා "සී " වර්ග යටතට අයත් නොවන වෙනත් යම් වර්ගයක ගොඩනැගිල්ලක්;	

ගොඩනැගිලි වර්ගය	විස්තරය	අවශ්‍යතා
C	අ. සී I - පදිංචිය සඳහා භාවිතා කරනු ලබන්නා වූද, ප්‍රමාණයෙන් වර්ග මීටර් පන්සීයක් (500 m^2) නොඉක්මවන්නා වූද, බිම් මහල තවත් මහල් දෙකකින් සමන්විත වූද, "බී" වර්ගයට අයත් නොවන යම් ගොඩනැගිල්ලක් ආ. සීII - පදිංචිය සඳහා නොවන වෙනත් කාර්යයන් සඳහා භාවිතා කරණු ලබන ප්‍රමාණයෙන් වර්ග මීටර් තුන්සියයක් (300m^2) නොඉක්මවන්නා වුද බිම් මහල තවත් මහල් දෙකකින් සමන්විත වූද, "බී" වර්ගයට අයත් නොවන්නා වූද යම් ගොඩනැගිල්ලක් සහ ඇ. සීIII- (i) පදිංචිය සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයෙන් වර්ග මීටර් තුන්සීයයක් (300 m^2) නොඉක්මවන සහ බිම් මහල සහ තවත් එක් මහලකින් සමන්විත "බී" වර්ගයට අයත් නොවන යම් ගෙඟඩනැගිල්ලක් (i) පදිංචිය සඳහා නොවන වෙනත් කාර්යය සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයෙන් වර්ග මීටර් සියයක්(100m^2) නොඉක්මවන සහ බිම් මහල තවත් එක් මහලකින් සමන්විත "බී" වර්ගයට අයත් නොවන යම් ගොඩනැගිල්ලක්;	

6.2 ගොඩනැගිලි උස

(i) පළලින් මීටර් 6ක් හෝ ඊට අඩු වූ හෝ විශාලත්වය වර්ග මීටර් 150ට අඩු, එවකටත් පවත්නා යම් බිම් කොටසක ඉදි කිරීමක් අධිකාරිය විසින් නියම කරනු ලබන අවස්ථාවන්හිදී හැර උපරිම උස මීටර් 7.5 ක් හෝ මහල් දෙකකට නොවැඩි විය යුතුය.

(ii) ගොඩනැගිල්ලේ උපරිම උස, ඒ ගොඩනැගිල්ලේ යම් මහලක සහ යාබද වීථියේ දුරස්ථ අයිනද අතර ඇති තිරස් දුර ප්‍රමාණය මෙන් දෙගුණයකට වඩා වැඩි නොවිය යුතුය.

(iii) ගොඩනැගිලි උස ගණනය කිරීමේදී පහත සඳහන් ගොඩනැගිලි කොටස් අත් හැරිය හැක.

අ. මීටර් 6කට වඩා උස් නොවුවද, විශාලත්වයෙන් වර්ග මීටර් 55ට වැඩි නොවුවද විදුලි සෝපානයක් හෝ මෝටරයක් සවි කළ කාමරයක්

ආ. මීටර් 5කට වඩා උස් නොවුද, විශාලත්වයෙන් වර්ග මීටර් 25කට වැඩි නොවුද, තරප්පු කාමරයක්

ඇ. මීටර් 1.5 කට වඩා උස් නොවූ ජල ටැංකියක්

6.3 පා මහල හැර මහල් 4කට වැඩි උස ගොඩනැගිලි සඳහා වූ අමතර අවශ්‍යතා

(i) අවට ප්‍රදේශයට සපයා ඇති පහසුකම්වලට බාධාවක් හෝ ප්‍රදේශයේ අනුකූලතාවයට හානියක් හෝ එකී ගොඩනැගිල්ල නිසා සිදු නොවිය යුතුය.

(ii) ගොඩනැගිල්ල නිසා රථවාහන ගමනාගමනය පිළිබඳ ප්‍රශ්න හෝ දුෂ්කරතා ඇති නොවිය යුතුය.

(iii) ජල සම්පාදනය, කසල අපවහනය සහ විදුලි බලය සැපයීම සඳහා ගින්නෙන් සහ අනෙකුත් විපත්වලින් ආරක්ෂාව සැලසීම සහ රථ වාහන නවතා තැබීම සඳහාත් ප්‍රමාණවත් වැඩ පිළිවෙලවල් යෙදිය යුතුය.

7.0 ගොඩනැගිලි අවට විවෘත ප්‍රදේශ

7.1 පිටුපස ඉඩකඩ

(i) සෑම ගොඩනැගිල්ලකම පිටුපස තනිකරම, ඊට අයත් විවෘත ඉඩකඩක් වශයෙන් ගොඩනැගිල්ලේ හා ඉඩමේ පිටුපස මායිමත් අතර වගු අංක **01**ට අනුකූල වන පරිදි විවෘත ඉඩකඩක් තැබිය යුතුය.

(ii) ගොඩනැගිල්ලේ පිටුපස සම්පූර්ණ දිග ප්‍රමාණයටම යාබදව විහිදෙන පහත සඳහන් විවෘත ප්‍රදේශ පිහිටා ඇති විට පිටුපස ඉඩ ප්‍රමාණය තැබීම පිළිබඳව නීතිය අධිකාරිය විසින් ලිහිල් කළ හැක.

අ. පළල මීටර් **6**කට නොඅඩු පොදු මාර්ගයක්

ආ. පළලින් මීටර් **3**කට නොඅඩු රක්ෂිත බිම් තීරුවක්

(iii) මීටර් **1**කට නොවැඩි පහත සඳහන් ගොඩනැගිලි කොටස් පමණක් පිටුපස විවෘත ඉඩකඩෙහි ඉදි කිරීම සඳහා අවසර දෙනු ලැබේ.

අ. කැන්ටිලිවර කරන ලද තිරු ආවරණ

ආ. නෙරාගිය සඳළුතල

ඇ. අඟ හා වෙනත් නෙරාගිය ගොඩනැගිලි කොටස්

(iv) **අක්‍රමවත් හැඩයෙන් යුක්ත භූමි සඳහා පිටුපස ඉඩකඩ**

අ. වගුව **01** හි දැක්වෙන අදාල විවෘත ඉඩකඩක් ගොඩනැගිල්ලේ පිටුපස පැත්තෙන් ඉඩමේ මුළු පළලටම වෙන් කිරීම නොකළ හැකි පරිදි අක්‍රමවත් හැඩවලින් යුත් භූමි භාග සම්බන්ධයෙන් වන විට, එක් එක් අවස්ථාවට අදාල පරිවේෂණ සැලකිල්ලට ගැනීමෙන් පසු සුදුසු යයි අධිකාරිය විසින් සලකණු ලබන ආකාරයට පිටුපස විවෘත ඉඩකඩ තබන ලෙස අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකිය.

7.2 පැති ඉඩකඩ

(i) ගොඩනැගිල්ලක පැත්තෙන් තැබිය යුතු ඉඩ ප්‍රමාණය වගු අංක 01ට අනුකූල විය යුතුය.

(ii) ගොඩනැගිල්ලේ පැත්තකින් විවෘත ඉඩකඩ තබන්නේ නම් එහි අවම පළල මීටර් 1 කට අඩු නොවිය යුතුය.

7.3 වීථි රේඛා සහ ගොඩනැගිලි රේඛා

(i) වීථි රේඛා නියම කර නොමැති අවස්ථාවන්හිදී සංවර්ධනයේ ස්වභාවය හා බලාපොරොත්තු වන රථ වාහන ගණන සැලකිල්ලට ගෙන එම වීදියේ වීථි රේඛාව නියම කිරීමට අධිකාරියට බලය ඇත්තේය.

(ii) පොදු මාර්ගයකට යාබදව පවතින සියළුම බිම් කට්ටි සඳහා ගොඩනැගිලි රේඛාව වගු අංක 10 හි දී ඇති පිරිවිතරවලට අනුකූල විය යුතුවේ.

වගු අංක 10

ගොඩනැගිලි රේඛා සඳහා පිරිවිතර

පොදු මාර්ග වර්ගීකරණය	පොදු මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට දුර (මීටර්)
'A' සහ 'B' වර්ගයේ මාර්ග	15.0
අනෙකුත් මාර්ග	සංවර්ධන සැලැස්මෙහි මාර්ග සඳහා වූ පිරිවිතරයන්ට අනුකූල විය යුතුය.

(iii) පලාත් පාලන ආයතනය විසින් අනුමත කරන ලද හෝ කැමැත්ත දෙන ලද යම් ගොඩනැගිලි රේඛාවක් අධිකාරියේ පූර්ව අනුමැතිය නොමැතිව වෙනස් නොකළ යුතුයි.

(iv) ඕනෑම ඉදිකිරීමක් හෝ ගොඩනැගිලි කොටසක්, ගොඩනැගිලි රේඛාවෙන් ඔබ්බට නෙරා නොතිබිය යුතුය. එනමුත් පළලින් මීටර් 1කට නොවැඩි සඳළුතල හා හිරු ආවරණ/අඟු, ගොඩනැගිලි රේඛාව හා වීථි රේඛාව අතර ප්‍රදේශයේ ඉදිකළ හැකිය.

(v) මාර්ගවලට යාබදව පිහිටි ඉඩම් වලදී මීටර් 2.0 ට වඩා නොවැඩි උසකින් යුත් වැටක් හෝ තාප්පයක් ගොඩනැගිලි සීමාව හා මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට වගු අංක 11 ට අනුකූලව ඇති දුරකින් අඳින ලද මන:කල්පිත රේඛාව අතරතුරදී වන්දි රහිත ගිවිසුමකට යටත්ව ඉදිකරනු ලැබිය හැක.

වගු අංක 11

මායිම් තාප්පයක් ඉදිකිරීම සඳහා අවසර දෙනු ලබන දුර

මාර්ගයේ පවත්නා පළල (මීටර්)	මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට මායිම් තාප්පයක් ඉදිකිරීමට අවසර දෙනු ලබන දුර ප්‍රමාණය (මීටර්)
3.0 හෝ ඊට අඩු	3.0
4.5	3.75
6.0	4.5
9.0	6.0
12.0	7.5
15.0 හෝ ඊට වැඩි	9.0

7.4 විදුලි රැහැන්වලට ඇති අවම පරතරය

(i) උඩින් ඇඳ ඇති විදුලි රැහැන් සහ සියළු ගොඩනැගිලි අතර පරතරය, වගු අංක 12 හි පරිදි විය යුතුය.

වගු අංක 12

විදුලි රැහැන්වලට ඇති අවම පරතරය

විදුලි රැහැන් වර්ගය	විදුලි රැහැන්වලට ඇති පරතරය	
	(සිරස් මීටර්)	(තිරස් මීටර්)
අඩු බලැති විදුලි රැහැන්	2.5	1.5
අධි බලැති විදුලි රැහැන්	4.5	2.5

8.0 ගොඩනැගිලි රෙගුලාසි

8.1 ඇතුලත උස

(i) ගොඩනැගිලි ඇතුලත උස වගු අංක 13 හි දැක්වෙන ලෙස විය යුතුය.

වගු අංක 13

කාමරවල ඇතුලත උස

වර්ගය		භාවිතය	අවම උස (මීටර්)
නේවාසික	අ.	වැසිකිළි, නාන කාමර, කොරිඩෝ, ජල මුද්‍රිත වැසිකිළි, ආලින්ද, සඳළුතල, ගරාජ සහ අවෘත වතු	2.2
	ආ.	විසිත්ත කාමර, නිදන කාමර, කුස්සි සහ වෙනත්	2.8
	ඇ.	මධ්‍ය වායු සමීකරණය මගින් වායු සමීකරණය කරන ලද කාමර	2.4
	ඈ.	වහල මට්ටමෙන් ඔබ්බට නෙරා ගිය බරාඳ හෝ ඒ හා සමාන ව්‍යුහ	2.4
නේවාසික නොවන	අ.	බිම් මහලේ පිහිටි සාප්පු	3.0
	ආ.	සාප්පුවල උඩු මහලේ පිහිටි කාමර	2.8
	ඇ.	පාසල් පන්ති කාමර	3.5
	ඈ.	රෝහල්වල රෝගීන් සිටින කාමර	3.5
	ඉ.	කර්මාන්තශාලාවල වැඩ කරන කාමර	3.5
	ඊ.	මහජනයා රැස්වන ගොඩනැගිලි	3.5
	උ.	මධ්‍යම වායු සමීකරණය මගින් වායු සමීකරණය කරන ලද කාමර	2.4
	ඌ.	වහල මට්ටමෙන් ඔබ්බට නෙරා ගිය බරාඳ හෝ ඒ හා සමාන ව්‍යුහ	2.4
	එ.	ආවෘත ගෙවතු හා වාහන නැවතුම්පල	2.6
	ඒ.	වෙනත්	3.0

ආ. ගුදම් සහ කර්මාන්තශාලා සම්බන්ධයෙන් වන විට ආලෝක මූලාශ්‍රයේ සිට උපරිම දුර ආලෝකය සහ වාතාශ්‍රය සපයන කවුළුවල තලයට ලම්බකව විහිදෙන දිශාවෙන් මීටර් 12 කට වැඩි දුරකින් ඒ කාමරයේ කිසිදු කොටසක් පිහිටා නොතිබිය යුතුය. තවද කවුළුවේ දාරයේ සිට කවුළුවේ තලයට සමාන්තරව විහිදෙන දිශාවෙන් මීටර් 3කට වඩා ඇතින් එවැනි කාමරයක කිසිදු කොටසක් පිහිටා නොතිබිය යුතුය.

ඇ. වහලයෙන් ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබා ගන්නා විට දී කවුළුවේ තලයට ලම්බකව විහිදෙන දිශාවෙන් කවුළුවේ දාරයේ සිට උපරිම සිරස් දුර මීටර් 9ක් විය යුතුය.

(iv) නිර්බාධිත කවුළුවල ප්‍රමාණය

අ. යම් ගොඩනැගිල්ලක සෑම කාමරයකටම එක් මාර්ගයකින් හෝ මාර්ග කිහිපයකින් ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය සපයනු ලැබිය යුතු අතර කවුළුවල වර්ග ප්‍රමාණයේ එකතුව වගු අංක 14හි සඳහන් පිරිවිතරවලට අනුකූල විය යුතුය.

වගු අංක 14

කවුළුවල නිර්බාධිත මුළු වර්ග ප්‍රමාණය

වර්ගය	ස්වාභාවික ආලෝකය සහ වාතාශ්‍රය ලබා ගැනීම සඳහා නිර්බාධිත කවුළුවල අවම ප්‍රමාණයන් (කාමරයක භූමියේ වර්ග ප්‍රමාණයෙන් ප්‍රතිශතය)	කවුළුවේ විවෘත ප්‍රදේශ ප්‍රතිශතය
1. නේවාසික භාවිතය සඳහා කාමර	15%	70%
2. ව්‍යාපාර කටයුතු හා පොදු නවාතැන්පොලවල්	15%	50%
3. ජල මුද්‍රිත වැසිකිළි, වැසිකිළි, මූත්‍රා බඳුන්, රෙදි සෝදන කාමර, නාන කාමර	අවමය 10% හෝ වර්ග මීටර් 0.2 යන දෙකෙන් වැඩි අගය	100%
4. නේවාසික ගොඩනැගිලිවල පිහිටි ගබඩා, ගරාජ්	10%	50%
වර්ගය	ස්වාභාවික ආලෝකය සහ වාතාශ්‍රය	කවුළුවේ

වර්ගය	ස්වාභාවික ආලෝකය සහ වාතාශ්‍රය ලබා ගැනීම සඳහා නිර්බාධිත කවුළුවල අවම ප්‍රමාණයන් (කාමරයක භූමියේ වර්ග ප්‍රමාණයෙන් ප්‍රතිශතය)	කවුළුවේ විවෘත ප්‍රදේශ ප්‍රතිශතය
5. පාසැල්	20%	50%
6. රෝහල්, රෝහල් කාමර, සාත්තු නිවාස සහ රෝගීන් සඳහා වූ ගොඩනැගිලි	20%	100%
7. තරප්පු, කොරිඩෝ සහ ආලින්ද (ගිනි ආරක්ෂණයෙන් නියම නොකරන ලද ගොඩනැගිලි)	10%	50%
8. රථගාල්	10%	50%
9. කර්මාන්තශාලා, ගබඩා සහ ගුදම්	10%	50%

.ආ. කොරිඩෝවලට සහ ගෙතුල් මංවලට ආලෝකය සහ වාතාශ්‍රය ඒවාට යාබදව පිහිටි කාමරවල අන්තර් බිත්තිවල කවුළු ඉදි කිරීමෙන් සපයනු ලැබිය හැකිය. එසේ වුවද, ඒ කවුළුවල වර්ග ප්‍රමාණය වගු අංක 14 හි දක්වා ඇති පිරිවිතර වලට අනුකූල විය යුතුය.

ඇ. මෝටර් වාහන 5කට වැඩි ගණනක් නවතා තබන, ගරාජයක් වශයෙන් පාවිච්චි කරනු ලබන යම් කාමරයක් සඳහා හරස් වාතාශ්‍රය ලැබෙන පරිදි ඒ කාමරයේ පැති දෙකක හෝ ඊට වැඩි ගණනක් යටත් පිරිසෙයින් 50% කට නොඅඩු ප්‍රමාණයක් කවුළු සපයා තිබිය යුතුය.

ඈ. ආලෝක සහ වාතාශ්‍ර අවශ්‍යතා තීරණය කිරීමේදී යම් කාමර දෙකක් අතර වූ පොදු බිත්තියේ වර්ග ප්‍රමාණයෙන් භාගයක් විවෘතව සහ නිර්බාධිතව තිබේ නම්, ඒ එක් කාමරයක් යාබද කාමරයේ කොටසක් ලෙසද සලකනු ලැබිය හැකිය.

(v) ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය සඳහා ඉඩකඩ

අ. වැසිකිළි හා නාන කාමර හැර ගොඩනැගිල්ලක සෑම කාමරයකම පිහිටා ඇති ජනේල හෝ ඕනෑම කවුළුවක්, සම්මත ආලෝක තලයකට විවෘත විය යුතු අතර මීටර් 1.0ට නොවැඩි දුරකට විහිදෙන අගු හා භිරු ආවරණ හැර එකී තලයට උඩින් ඇති සම්පූර්ණ අවකාශය කිසිදු බාධාවකින් තොරව අහස දෙසට විවෘතව තිබිය යුතුය.

හැර එකී තලයට උඩින් ඇති සම්පූර්ණ අවකාශය කිසිදු බාධාවකින් තොරව අහස දෙසට විවෘතව තිබිය යුතුය.

මේ නියෝගයේ කාර්යය සඳහා සම්මත ආලෝක තලය යන්නෙන්, ගොඩනැගිල්ලේ පිට පැත්තේ මුහුණතෙහි සිට, කාමරයේ පහලතම බිම් මට්ටමෙන්, එනම් වාහන නැවැත්වීම සඳහා වූ හෝ වායු සමීකරණ යන්ත්‍රයක් නැතහොත් වෙනත් සේවා යන්ත්‍රෝපකරණයක් පමණක් සඳහා වූ පා මහලක් නොවන බිම් මට්ටමෙන් ආරම්භව තිරස් රේඛාවට අංශක 63 ½ ක කෝණයක් සිටින සේ ඉහලට විහිදෙන පරිදි අඳිනු ලබන තලය අදහස් වේ. එහෙත් ඒ තලය යම් ගොඩනැගිල්ලක බිත්තියක හෝ වෙනත් බාධකයක් සමග සම්මිතික නොවිය යුතුය. අවසර දෙන ලද බාධකයක් නොවන වෙනත් යම් බාධකයක් එසේ අඳින ලද යම් තලයක් හරහා පිහිටා ඇති අවස්ථාවකදී බිම් මට්ටමේ තලය එකී බාධකයේ දුරස්තම දාරයේ සිරස් තලය හමුවී කැපෙන රේඛාවේ සිට එකී තලය අඳිනු ලැබිය හැකිය.

ආ. වැසිකිළි සහ නාන කාමර සම්බන්ධයෙන් වන විට කවුළුවට යාබදව ඒ භූමි භාගය තුල අවම වශයෙන් මීටර් එකක් පළල නිර්බාධිත එළිමහන් ප්‍රදේශයක් තිබිය යුතුය.

ඇ. යම් කාමරයක් පා මහලෙහි පිහිටා ඇති විට සහ ස්වාභාවික ආලෝකය හා වාතාශ්‍රය ඊට සපයනු ලබන විට, ඒ කාමරයේ බාහිර බිත්තිවල උසෙන් යටත් පිරිසෙයින් තුනෙන් පංගුවක් පිට පැත්තේ බිම් මට්ටමට ඉහළින් ලබා දිය යුතු අතර ඊට අවශ්‍යය සම්පූර්ණ ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය පිට පැත්තේ භූමි මට්ටමට ඉහලින් ලබා දිය යුතුය.

ඈ. ඡායාරූප ශිල්පී අඳුරු කාමරයක් හෝ ශීත කාමරයක් වන අවස්ථාවකදී, ඒ කාමරය පාවිච්චි කෙරෙන ස්වභාවයට අනුව බාහිර ආලෝකයට සහ වාතාශ්‍රයට කෙළින්ම විවෘත වන කවුළු තැබීම නොකළ හැකි විටක, අධිකාරිය සෑහීමකට පත්වන පරිදි ඒ කාමරයට කෘතිම ආලෝකය සහ යාන්ත්‍රික වාතාශ්‍රය ලබා දී ඇති තාක් 8.2 (iv) නියෝගයේ විධි විධාන එවැනි කාමරයකට අදාල නොවන්නේය.

යාන්ත්‍රික වාතාශ්‍රය ලබා දී ඇති තාක් 8.2 (iv) නියෝගයේ විධි විධාන එවැනි කාමරයකට අදාල නොවන්නේය.

8.3 අභ්‍යන්තර මාන

(i) පදිංචිය සඳහා වූ කාමර

ගොඩනැගිල්ලක පිහිටි පදිංචිය සඳහා වූ කාමරවල අභ්‍යන්තර ශුද්ධ මානයන් වගු අංක 15 හි දැක්වෙන පිරිවිතරවලට අනුකූල විය යුතුය.

වගු අංක 15

කාමරවල අභ්‍යන්තර ශුද්ධ මානයන්

කාමරය	අවම විශාලත්වය (වර්ග මීටර්)	අවම පළල (මීටර්)
1. පදිංචිය සඳහා වූ ඒකකයක එක් කාමරයක් පමණක් ඇති විට	11.0	3.0
2. පදිංචිය සඳහා ඒකකයක කාමර එකකට වැඩි ගණනක් ඇති විට		
- පළමු කාමරය	8.5	2.4
- අතිරේක කාමරය	8.0	2.4
3. පදිංචිය සඳහා නොවන ගොඩනැගිල්ලක කාමර	8.0	2.4
4. කුස්සිය	5.5	1.8
5. කුස්සියේ ඇල්කෝව	0.36	0.4

(ii) නාන කාමර සහ වැසිකිළි

ගොඩනැගිල්ලක පිහිටි අනෙකුත් කාමරවල අභ්‍යන්තර ශුද්ධ මානයන් වගු අංක 16 හි දැක්වෙන පිරිවිතරවලට අනුකූල විය යුතුය.

වගු අංක 16

නාන කාමරවල සහ වැසිකිළි සඳහා අභ්‍යන්තර ශුද්ධ මානයන්

කාමරය	අවම පළල (මීටර්)	අවම දිග (මීටර්)
නාන කාමරය	0.9	1.2
වැසිකිළිය	0.9	1.2
නාන කාමරය සහ වැසිකිළිය ඒකාබද්ධව	0.9	1.7

(iii) නීත්‍යානුකූල වාතාශ්‍රය අවශ්‍ය නොවන ගබඩා කාමර

අ. ගබඩාවේ උපරිම ගෙබිම් ප්‍රමාණය - වර්ග මීටර් 2.25

ආ. ගබඩාවේ උපරිම දිග හෝ පළල - මීටර් 1.5

ඇ. ඉහත සඳහන් මානයන්ගෙන් යුත් සියළු ගබඩා කාමරවල මුළු බිම් ප්‍රමාණය ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණයෙන් 5% ට වැඩි නොවිය යුතුය.

8.4 තරප්පු

(i) ගොඩනැගිල්ලක තරප්පුවක අවම පිරිවිතරයන් වගු අංක 17 හි සඳහන් පරිදි විය යුතුය.

වගු අංක 17

තරප්පු සඳහා පිරිවිතර

වර්ගය	තරප්පුවේ අවම පළල (සෙ.මී.)	අවම හිස් උස (මීටර්)	පඩියක උපරිම උස (සෙ.මී.)	පඩියක අවම පළල (සෙ.මී.)
මහල් 3 කට නොවැඩි එක් නිවාස ඒකකයක් සඳහා භාවිත කෙරෙන අභ්‍යන්තර තරප්පුවක්	90	2.1	15.0	22.5
අනෙකුත් ඕනෑම ගොඩනැගිල්ලක තරප්පුවක්	120	2.1	15.0	30.0

(ii) රවුම් හෝ ජ්‍යාමිතික තරප්පු සම්බන්ධයෙන් වන විට මධ්‍ය මානයන් ගණනය කරන අතර, එම අගයන් වගු අංක 17හි දක්වා ඇති පිරිවිතරවලට අනුකූල විය යුතුය.

(iii) මහලෙන් මහලට යන කවර වුවද තරප්පුවක පඩි දෙකක් අතර උස සහ පඩියක පළල එක් නියත ප්‍රමාණයක් විය යුතුය.

(iv) යම් තරප්පුවක ඉහළම තරප්පු තට්ටුවේ සිට බිම් මහලේ ඇති පිටවන දොරටුව දක්වා කිසිදු බාධකයක් නොතිබිය යුතුය.

(v) සෑම තරප්පුවකම, තරප්පු තට්ටුවක, සඳළුතලයක හෝ බරාඳයකට පැත්තක්, අංගනයක් හෝ අවකාශයක්, බාහිර විවෘත ප්‍රදේශයක් දෙසට විවෘතව ඇත්තේ නම්, එවැනි සෑම තරප්පුවක්, තරප්පු තට්ටුවක්, සඳළුතලයක් හෝ බරාඳයකම, මීටර් 0.9 කට නොඅඩු උසකින් යුක්ත වූද ඒ තරප්පුවේ තරප්පු තට්ටුවේ සඳළුතලයේ හෝ බරාදියේ පැත්තකින් යම් තැනැත්තකු නොවැටෙන අන්දමේ සුදුසු සැලැස්මකට අනුකූල වූ සහ සුදුසු ක්‍රමයකට සකස් කරන ලද්දා වූද. අත්වැලකින්, අත්වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා කරනු ලැබිය යුතුය.

8.5 අත්තිවාරම

(i) සම්පූර්ණ ගොඩනැගිල්ලේ හෝ ඉන් යම් කොටසක ස්ථායීත්වයට හානි සිදුවන පරිදි හෝ සම්පූර්ණ ගොඩනැගිල්ලට හෝ ඉන් යම් කොටසකට නැතහොත් යාබද යම් ගොඩනැගිල්ලකට හෝ කර්මාන්ත ශාලාවකට හානි සිදුවන පරිදි යම් තැන්පත් වීමක් හෝ වලනයක් සිදු නොවන ආකාරයට ගොඩනැගිල්ලේ තනි බර සහ ඒ මත පැටවුණු බර සුරක්ෂිතව දැරිය හැකි අත්තිවාරම් සෑම ගොඩනැගිල්ලකම තිබිය යුතුය.

(ii) යම් ගොඩනැගිල්ලක් දරා සිටින හෝ දරා සිටීමට උපකාරී වන භූමිය නැතහොත් ඉන් යම් කොටසක්, ඒ ගොඩනැගිල්ලේ පදිංචිකරුවන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම පෙරදැරි කරගෙන අධිකාරිය විසින් පිළිගනු ලැබිය හැකි පීඩාවක් නොවන යම් පීඩනයකට (ගොඩනැගිල්ලේම යම් කොටසක් නිසා වුවද අන්‍යාකාරයකින් ඇති වුවද) භාජනය නොකරනු ලැබිය යුතුය.

(iii) යෝජිත යම් ගොඩනැගිල්ලකට යාබද භූමිය මගින් ඒ ගොඩනැගිල්ලේ යම් කොටසක විෂයෙහි පීඩනයක් ඇති කෙරේ නම් ඒ මත අයථා බරක් යෙදවීමට හේතුකාරක වේ නම්, අනුදත් ප්‍රත්‍යාබලය ඉක්මවා යා නොදී ඒ පීඩනය හෝ බර උපද්‍රවයක් නොමැතිව දරා සිටීමට හෝ සම්ප්‍රේෂණය කිරීමට හැකිවන සේ ඒ ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි කොටස ඉදි කරනු ලැබිය යුතුය.

(iv) මායිම් කාප්පයක් පිහිටන භූමි භාගවල අයිතිකරුවන්ගේ අන්‍යෝන්‍ය කැමැත්ත ඇතිව ඉදි කරනු ලබන මායිම් කාප්පයක් සම්බන්ධයෙන් වන විට හැර, කිසිදු ගොඩනැගිල්ලක අත්තිවාරම් ඒ ගොඩනැගිලි ඉදි කෙරෙන භූමි භාගයේ මායිම් රේඛාවලින් පිටතට ව්‍යාප්ත නොවිය යුතුය.

(v) යාබද දේපල විෂයෙහි බරක් ඇති කරනු ලැබිය හැකි හෝ භූමියෙහි වලන ඇති කරනු ලැබිය හැකි හෝ යාබද දේපලෙහි කවර වුවද කොටසක ස්ථායීත්වය කෙරෙහි මොනම අන්දමේ හෝ අහිතකර බලපෑමක් ඇති කරනු ලැබිය හැකි පයිල් ගැසීම, පස් තද කිරීම සහ බිම් කැණීම් වැනි අත්තිවාරම් වැඩ හෝ පොළව ආශ්‍රිත පස්වැඩ කිසිවක් වැඩ බිමෙහි ආරම්භ කිරීමට පෙර මේ නියෝග යටතේ

නියම කර ඇති පරිදි සැලැස්මවල් සහ සැලසුම් නිර්මාණ පිළියෙල කරනු ලබන අවස්ථාවේදී සුදුසුකම් ලත් තැනැත්තා විසින් සුපරික්ෂාකාරී ලෙස ඒවා ගැන සලකා බැලිය යුතුය.

(vi) යාබද කිසියම් ගොඩනැගිල්ලකට හෝ දේපලකට යම් හානියක් සිදුවීම සෑම වේලේම තම වියදමින්ම වලක්වාලීම් සුදුසුකම්ලත් තැනැත්තකුගේ සහ අයිතිකරු ගේ වගකීම වන්නේය.

(vii) අත්තිවාරම් හැරීම සහ තාවකාලික රැඳවුම් වැඩ ඇතුළුව සම්පූර්ණ වැඩබිම, අධිකාරිය විසින් නියම කරනු ලබන ආකාරයට සුදුසු වැටක් හෝ කොටු කිරීමක් මගින් යාබද පාරකින් හෝ දේපලකින් වෙන් කරනු ලැබිය යුතුය.

9.0 සේවාවන්

9.1 ජල සම්පාදනය

(i) පවත්නා පොදු ජල සැපයුම් ක්‍රමයකට සම්බන්ධ කරන ලද සුරක්ෂිත ජලසම්පාදන ක්‍රමයක් සෑම ගොඩනැගිල්ලක් සඳහාම සැපයිය යුතුය.

(ii) පොදු ජල සැපයුම් ක්‍රමයකට සම්බන්ධ කිරීමට නොහැකි වන අවස්ථාවකදී, පෞද්ගලික ජල සැපයුම් ක්‍රමයකට සම්බන්ධ කරන ලද ජල සැපයුම් ක්‍රමයක් සැලසිය යුතුය.

(iii) ගොඩනැගිල්ලේ පිහිටීම සහ ඒ ප්‍රදේශයේ අනෙකුත් භූමි ලක්ෂණ සැලකිල්ලට ගනිමින් ජලය සැපයීම අඛණ්ඩව සිදු නොවේ යයි විශ්වාස කිරීමට අධිකාරියට හේතු ඇති විටෙක ඒ එක් එක් අවස්ථාවේදී අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ධාරිතාවකින් යුතු ජල ටැංකි සහ පොම්ප ඒ සෑම ගොඩනැගිල්ලක් සඳහාම සපයනු ලැබිය යුතුය.

(iv) බීම සඳහා ජලය සපයන කිසිදු ළිඳක්, ගවර වළක සිට හෝ දිය උරණ වළක සිට හෝ පූතිකවළක සිට මීටර් 15.0 කට වඩා ආසන්නව පිහිටා නොතිබිය යුතුය.

9.2 වැසිජලය රැස් කිරීම හා ජලාපවහනය

(i) (අ). සෑම අයිතිකරුවකුම හෝ සංවර්ධනය කරන්නකු විසින් යම් සංවර්ධන කටයුත්තක් අනුමත කර ගැනීම සඳහා වූ ගොඩනැගිලි සැලැස්මක් ඉදිරිපත් කරනු ලබන සෑම අවස්ථාවකදීම, එකී සැලැස්ම සමග වගු අංක 18 (I වන කොටසේ, II වන කොටසේ සහ III වන කොටසේ) දක්වා ඇති නිශ්චිත සඳහන් කිරීම් සහ වෙනත් නියම කිරීම් සැලකිල්ලට ගෙන සකස් කරන ලද පිළිවෙලින් සඳහන් සහ යාබද දේපල වලට හා ගොඩනැගිලිවලට හානි නොවන ආකාරයට අධිකාරිය විසින් අනුමත කරන ලද වීථියේ ඇති කාණුවකට හෝ වෙනත් අනුකූල පිටාරයකට යෝජිත ගොඩනැගිල්ලේ වහලයේ සිට වැසි ජලය බැස යන පරිදි අදහස් කර ඇති ජලාපවහන පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය වන්නා වූ දළ සටහනක් ද ඇතුළත් වන්නා වූ සැලැස්මක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

එසේ වුවද පවත්නා ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් ඇතුලත මේ නියෝගවල විධිවිධාන සමග එකඟව ක්‍රියා කරන ලෙසට එම ගොඩනැගිලි වල අයිතිකරුවන්ට දැනුම් දීම සඳහා ප්‍රමාණවත් නිවේදනයක් කරනු ලැබිය යුතු නමුත් එකී දිනය මෙම නියෝග බලාත්මක වන දින සිට වසර තුනකට (03) වැඩි නොවන්නා වූ කාලසීමාවක් විය යුතුය.

(ආ) සාදනු ලබන සෑම සැලැස්මක්ම අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන සුදුසුකම්ලත් තැනැත්තකු විසින් සකස් කරනු ලැබිය යුතුය.

(ඇ) පනතේ 2 වන වගන්තිය ප්‍රකාර ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් නාගරික සංවර්ධන ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ සම්බන්ධයෙන් මෙම නියෝග වල විධි විධාන අදාළ විය යුතුය.

(ඈ) ඉඩමේ අනුබෙදීම හා සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති විවෘත තිස් අවකාශ රක්ෂිතයන්ට මෙම විධිවිධාන අදාළ කර ගැනීමේදී එකී රක්ෂිතයෙන් සියයට අනූවකට (90%) නොඅඩු බිම් ආවරණ රුක් රෝපණයක් තිබිය යුතුය.

(ii) සංවර්ධන අවසර පත්‍රයක් ලබාගැනීමේ කාර්යය සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම සැලැස්මක් සමග

(අ) ගොඩනැගිලි ඉදිකිරීමකින් තොරව ඉඩම් සංවර්ධන කාර්යයකට සීමා වී ඇති විට

- පිහිටීමේ විස්තර සහ පවත්නා ජලාපවහන පද්ධතියේ මානයන්
- සියළු මානයන් සහ ගලායාමේ දිශාවන්ද ඇතුළත්ව යෝජිත වැසි ජලය එකතු කිරීමේ වැඩ පිළිවෙල

(ආ) යම් සංවර්ධන කටයුත්තකදී ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයක් යෙදී ඇති අවස්ථාවක

- පවතින ජලය ගලායාමේ කාණු ස්ථානගත කිරීම ඇතුළත්ව අවට ප්‍රදේශය දැක්වෙන දළ සැලැස්මක්
- යම් ගොඩනැගිල්ලක සෑම වහලක් සහ පැතලි වහලක් තිබේ නම් ඒවාද ඇතුළුව (එක් මහලකට වඩා වැඩිවන අවස්ථාවකදී එක් එක් මහලේ බිම් සැලැස්මද ඇතුළුව) වැසි ජලය ගලා යන දිශාව ගොඩනැගිල්ලේ සිට වැසි ජලය ගලා බසින නල, ඒවායේ ප්‍රමාණ සහ එම ජලය පිටවන ස්ථාන, ගබඩා කරන ස්ථාන , ජලය පොළවට උරා ගන්නා ස්ථාන ගෙබිම් සැලසුම් වල දැක්විය යුතුය.

- ගබඩා ටැංකි,වැසිදිය බස්නා නල සහ වෙනත් ආශ්‍රිත අංගෝපාංග ඇතුළුව ගොඩනැගිල්ලේ හරස්කඩ හා දික්කඩකින් සමන්විත විය යුතුය.

(ඇ) ඉහත (ii) හි (අ) සහ (ආ) උප ෙඡ්ද වල පෙන්වා ඇති මාර්ගෝපදේශ වගු අංක 18 (I වන කොටසේ) නිශ්චිතව පෙන්වා ඇති ගොඩනැගිලි භාවිතයන් සඳහා අදාල විය යුතු අතර එකී එක් එක් වර්ගවලට අදාල සමතුලාය වැසි ජලය රඳවා තබා ගැනීමේ විධිවිධාන නියමයන් එම වගුවේ (II වන කොටසේ) නිශ්චිතව දක්වා ඇති ආකාරයට විය යුතුය.

එසේ වුවද යම් ගොඩනැගිලි භාවිතයන් සහ අදාල වර්ෂාපතන ප්‍රමාණය පැහැදිලිව හඳුනාගත නොහැකි අවස්ථාවකදී, අධිකාරිය/ පලාත් පාලන ආයතනය විසින් සියළු තත්වයන් සැලකිල්ලට ගෙන නියමිත හඳුනාගැනීම කරනු ලැබිය යුතුය.

තවදුරටත්, වැසිජලය රැස්කිරීම් දරා සිටීමේ සැපයුම් වල යෝජිත බෙදාහැරීම් වගු අංක 18 හි III වන කොටසේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට පරිශ්‍රයේ ගබඩා සහ භූගත ජලය කාන්දුවීම් ප්‍රකාරව ගණනය කරනු ලැබිය යුතුය.

(iii) පොදු වැසි ජල ගබඩා පහසුකම් යාබද දේපලක එක් අයිතිකරුවකු හෝ අයිතිකරුවන් කිහිපදෙනෙකු විසින් යෝජනා කර ඇති අවස්ථාවකදී, එකී හවුල් පහසුකම් සම්බන්ධව අධිකාරිය/පළාත් පාලන ආයතනය විසින් තීරණය කරනු ලබන ස්ථානයක පිහිටුවිය යුතුය.

එසේ වුවද අදාල සියලු අයිතිකරුවන් එම හවුල් පහසුකමට එකඟ වී ඇති බවට සහ ඔවුන්ගේ ලිඛිත කැමැත්ත ලබා දී ඇති බවට අධිකාරිය සෑහීමකට පත් විය යුතුය.

යම් පරිශ්‍රයක සමතුල්‍යය වැසි ජලය රඳවා තැබීමේ ප්‍රමාණය තක්සේරු කිරීමේදී ,

(අ) පහත දැක්වෙන කරුණු සැළකිල්ලට ගනු ලැබිය යුතුය.

- ගිනි ආරක්ෂණ අවශ්‍යතා සඳහා ඇති ජලය රැස්කිරීමේ හිස් අවකාශ සෑම අවස්ථාවකම ගිනි නිවාරණ අවශ්‍යතා සපුරා ලීම සඳහා සපයන ලද පියවරයන්
- ඝන මීටර් 0.5 සඳහා ප්‍රමාණවත් වර්ග මීටර් 100 ක ආවරණය නොකරන ලද බිම් ප්‍රදේශයක්
- විශේෂයෙන්ම වැසි ජලය කාන්දු වීමේ අගල් වල පිහිටීම සහ
- වැසි ජලය ගලා යාම සඳහා යාබද පරිශ්‍රයේ ඇති යම් පහසුකම් ලබාගැනීමට අත්‍යවශ්‍ය වන අවස්ථාවක පරිශ්‍රයේ අයිතිකරුගෙන් ලිඛිත අවසරය

(ආ) වැසි ජලය එක් රැස් කිරීමේදී පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගනු නොලැබිය යුතුය

- පොදු ජල සැපයුම් ගබඩා කිරීමේ ස්ථාන
- වැසිකිලි අපද්‍රව්‍ය වලක් හෝ පවතින අපද්‍රව්‍යය ගලා යන අගලක්, අපද්‍රව්‍ය උරාගැනීමේ වලක්, අපද්‍රව්‍යය පිටට ගලා යන ගොහොරු සහිත වලක් හෝ අගලක්

වගු අංක 18

1 වන කොටස

ගොඩනැගිලිවල භාවිතයන් හා ගොඩනැගිලි විස්තරය	
භාවිතයන්	**ගොඩනැගිලි වර්ගය**
ගෘහස්ත	නිවාස, බහුවිධ පදිංචිය, මහල් නිවාස, වැඩිහිටි නිවාස
වාණිජ	කාර්යාල ගොඩනැගිලි, හෝටල්, සංචාරක නවාතැන්, තානායම්, පොදු නවාතැන්, සාප්පු සංකීර්ණ, සුපිරි වෙළඳ සැල්, අවන්හල්, වාහන නැවතුම් පළවල්
කාර්මික	කර්මාන්තශාලා, වැඩපළවල්, ගබඩා, කාර්මික ආයතන, යටිතල පහසුකම් සැපයුම් මධ්‍යස්ථාන
ආයතනික	රජයේ ගොඩනැගිලි, අර්ධ රාජ්‍ය ගොඩනැගිලි හා වෙනත් පොදු ගොඩනැගිලි

II වන කොටස

**සමතුල්‍යය අවම වැසි ජලය රදවා ගැනීමේ විධිවිධාන නියමයන්						
*වාර්ෂික වර්ෂාපතන ප්‍රමාණය(මි.මී.)		පදිංචිය				
		ගෘහස්ථ	මහල්/නිවාසසහාධිපත්‍ය	වාණිජ	කාර්මික	ආයතනික
1.	750-1000	1.5	2.5	5	8	10
2.	1000-1500	1.5	2.5	3	8	10
3.	1500-2000	1.5	2.5	3	5	10
4.	2000-2500	1.5	2.5	3	3	5
5.	2500-3000	1.5	2.5	2	2	3
6.	3000-4000	1.5	2.5	1	1	2
7.	4000-5000	1.5	2.5	0.5	1	1
8.	5000-6000	1.5	2.5	0.5	0.5	0.5

* මිනින්දෝරු දෙපාර්තුමේන්තුව විසින් පළ කරන ලද ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහයේ වර්ෂාපතන ප්‍රමාණය සැලකිල්ලට ගන්නා ලදී.

**අවශ්‍ය සමතුල්‍ය වැසි ජලය රඳවා ගැනීමේ නියමය = $\frac{\text{අවම පරිමාව}}{100}$ X සමස්ථ වහල සැලසුම් ප්‍රදේශය හා දැඩි ඇතිරුම් (සිමෙන්ති කොන්ක්‍රීට්) ප්‍රදේශය

සටහන - අවශ්‍ය සමතුල්‍ය වැසි ජලය රඳවා ගැනීමේ,ගබඩා කිරීම සහ කාන්දු වීම යන සැපයුම් දෙකම මගින් ලබාගත් ප්‍රමාණයේ අනුපාතය පිහිටීමේ ස්වභාවය, භූගත ජල වගු උච්චාවචනය, පවත්නා ඉඩම් ප්‍රමාණය හු විෂමතාවය, උරා ගැනීමේ හැකියාව, පසේ ස්වාභාවය යන කරුණු සැලකිල්ලට ගෙන අදාල පළාත් පාලන ආයතනය විසින් තීරණය කරනු ලැබිය යුතුය.

III වන කොටස

වැසි ජලය ගබඩා කිරීම බෙදා හැරීම සඳහා යෝජිත විධිවිධාන										
ධාරිතාව (m^3)				භූගත ජලය කාන්දු වීම. (m^3)						සමස්ථ (m^3)
පොළව මට්ටමට ඉහළ	පොළව මට්ටම	පොළව මට්ටමට පහළ	වෙනත්	අපතේ යන ජලය උරා ගැනීමේ වල	ඇඩි ඇතිරුම් නොමැති පොළව	ධට නොකරන ලද පොකුණු	භාරන ලද ළිඳ	ඩිදමන් සිදුර	වෙනත්	

(iv) භූ ගත ජලය රැස්කිරීම හා සම්බන්ධයෙන් පහත දැක්වෙන නිර්මාණ සහ ඉදිකිරීම් කරුණු අදාල විය යුතුය.

(අ) අධිකාරිය විසින් කලින් කළ නිශ්චිතව දක්වනු ලබන අවශ්‍ය සුදුසුකම් සතු තැනැත්තන් විසින් වැසි ජලය පද්ධතිය සහ සැලසුම් කරනු ලැබිය යුතු අතර, එය

- සැලැස්මේ දක්වා ඇති ආකාරයට ඉදි කරනු ලැබිය යුතුය.
- ප්‍රථම වැසි පතනය ඉවතලන සුදුසු ප්‍රමාණයන්ගෙන් යුත් උපකරණ වලින් සමන්විත විය යුතුය.
- ගෙවතු වගාවන්ට හා භූමි දර්ශන කාර්යයන් සඳහා ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් භාවිතා කරන බවට සහතික වෙමින් අපතේ යන (ජලය සහිත ගොහොරු වලක්, භාරන ලද හෝ කනින ලද ළිඳක්, විලක් හෝ වෙනත් සමාන ක්‍රමයක් මගින් උචිත ව්‍යුහයක් මත) ජලය ගබඩා කල යුතු අතර පොළවට ජලය කාන්දු වන ආකාරයට සාදන ලද සුදුසු ජල ගබඩා ඇති කල යුතුය.

(ආ) වැසි ජල ගබඩා බාහිර අනතුරු වලින් ආවරණය වන පරිදි ශක්තිමත්ව සකස් කල යුතු අතර,

- අනුමත ප්‍රමිතියකට අනුව ඉදිකරනු ලැබිය යුතුය.
- දුවිලි, පණුවන් ආදී සතුන් සහ වෙනත් දූෂක ද්‍රව්‍ය රදා නොපවතින ආකාරයට අවශ්‍ය විධි විධාන සලසා තිබිය යුතුය.
- යම් පළාත් පාලන ආයතනයක් විසින් පනවන ලද වෙනත් යම් ගොඩනැගිලි සැලසුම් විධි විධාන හෝ සෞන්දර්යාත්මක කරුණු සමඟ පරස්පර විරෝධී තත්වයක් ඇති නොකල යුතුය.
- ගබඩා කර ඇති ජලය උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා වූ පහසුකම් සැලැස්විය හැකි ආකාරයට පොළව මට්ටමට ඉහලින්, පොළව මට්ටමට පහලින් හෝ පොළව මට්ටමේ උචිත ස්ථාන වල පිහිටූ වනු ලැබිය යුතුය.

(ඇ) රැස් කරගන්නා ජලය ගෙවතු වගාවන්ට හෝ වෙනත් භාවිතයන්ට නොගන්නේ නම් පොළවට නිසි පරිදි උරා ගැනීමේ වැඩ පිළිවෙලක් දැක්විය යුතු අතර, එසේ ජලය උරා ගැනීමේ උපකරණ නියමිත ප්‍රමිතීන්ට හා දිගින් පළලින් සමන්විය යුතු ය.

(ඈ) පොදු ජල ගබඩා ව්‍යුහයන් සම්බන්ධ වන විට පොදු නල පද්ධතිවලට වැසි ජලය කාන්දු වීම වැලැක්වෙන පරිදි, යෝග්‍ය උපකරණවලින් සමන්විතව ඉදි කරනු ලැබිය යුතුය.

(ඉ) වැසි ජලය හා පොදු ජලනල පද්ධති අතර සෘජු හරස් ගැලීම් සම්බන්ධතා අන්තර්ගත නොවිය යුතුය.

(ඊ) වැසි ජලය ප්‍රයෝජනයට ගැනීමේදී පළාත් පාලන ආයතන විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ජල පිරිසිදු කිරීමේ උපක්‍රම උපයෝගී කර ගත යුතුය.

(උ) වැසි ජලය රැස් කිරීම හා ප්‍රයෝජනයට ගැනීම සඳහා භාවිතා කරනු ලබන සියලුම නල හා ඒ හා සම්බන්ධිත උපකරණ වර්ණ සහ සලකුණු මගින් පැහැදිලිව වෙන් කොට හඳුනා ගැනීමට හැකි විය යුතුය.

9.3 සනීපාරක්ෂක පහසුකම්

(i) පදිංචිය සඳහා වූ සෑම ඒකකයකටම යටත් පිරිසෙයින් එක් වැසිකිළියක් තිබිය යුතු අතර, අනෙක් සෑම වර්ගයකම ගොඩනැගිලි සඳහා ජල වැසිකිළි, මුත්‍රා බඳුන්, මුහුණ සෝදන බේසම් සහ වෙනත් සනීපාරක්ෂක පහසුකම් වගු අංක 19 හි දැක්වෙන පිරිවිතරවලට අනුකූල විය යුතුය.

වගුව 19

සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ප්‍රමිතීන්

භාවිතය	ජල වැසිකිළි	මුත්‍රා බඳුන්	මුහුණ සෝදන බේසම් සහ වෙනත් සනීපාරක්ෂක පහසුකම්
(i)සිනමාහල්, රඟහල්, ශ්‍රවනාගාර	▪ ආසන 400 දක්වා ආසන 100ට එකක් බැගින් සහ ඊට වැඩිවන ආසන සඳහා ආසන 250ට හෝ ඉන් කොටසකට එකක් බැගින් ▪ ස්ත්‍රීන් සහ පුරුෂයන් සඳහා වෙන වෙනම පහසුකම් සැපයිය යුතුය.	ආසන 25 හෝ ඉන් කොටසක් සඳහා එකක් බැගින්	ආසන 25 හෝ ඉන් කොටසක් සඳහා එකක් බැගින්
(ii) ආපන ශාලා	▪ ආසන 200 දක්වා ආසන 50කට එකක් බැගින් සහ ඊට වැඩිවන ආසන 100ට හෝ ඉන් කොටසක් සඳහා එකක් බැගින් ▪ ස්ත්‍රීන් සහ පුරුෂයින් සඳහා වෙන වෙනම පහසුකම් සැපයිය යුතුය	ආසන 50 ට හෝ ඉන් කොටසක් සඳහා එක බැගින්	ආසන 50ට හෝ ඉන් කොටසකට එක බැගින්
(iii) කාර්යාල, කඩකාමර, පාසල්, අධ්‍යාපන ආයතන, සෞඛ්‍ය හා පොදු කටයුතු	▪ ගෙබිම ප්‍රමාණය ව.මී. 200 ට හෝ කොටසකට 1 බැගින් ▪ ස්ත්‍රීන් සහ පුරුෂයින් සඳහා වෙන වෙනම පහසුකම් සැපයිය යුතු අතර, අවම වශයෙන් ස්ත්‍රීන් හා පුරුෂයින් සඳහා වෙන වෙනම එක බැගින් සැපයිය යුතුය.	ගෙබිම ප්‍රමාණය සෑම ව.මී. 200ට හෝ කොටසකට 1 බැගින්	ගෙබිම ප්‍රමාණය සෑම ව. මී. 200ට හෝ කොටසකට 1 බැගින්

(ii) කසල සහ අපවිත්‍ර ජලය බැහැර කරන සියළු පිටාර එවකට පවත්නා පොදු කසල අපවහන ක්‍රමයකට සම්බන්ධ කරනු ලැබිය යුතු අතර ඒවා පොදු කසල අපවහන

(ii) කසල සහ අපවිත්‍ර ජලය බැහැර කරන සියළු පිටාර එවකට පවත්නා පොදු කසල අපවහන ක්‍රමයකට සම්බන්ධ කරනු ලැබිය යුතු අතර ඒවා පොදු කසල අපවහන ක්‍රමයකට සම්බන්ධ කිරීමට පෙර පිළිගනු ලබන ප්‍රමිතිවලට අනුකූල වන පරිදි ඒ කසලවලට සහ අපවිත්‍ර ජලයට රසායනික ද්‍රව්‍ය යෙදිය යුතු යයි යම් විශේෂ අවස්ථාවකදී අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකිය.

(iii) පොදු කසල අපවහන ක්‍රමයක් නොමැති අවස්ථාවකදී හෝ එකී පිටාර පොදු කසල අපවහන ක්‍රමයකට සම්බන්ධ කිරීම අපහසු යයි අධිකාරිය විසින් සලකනු ලබන අවස්ථාවකදී, ඒ කසල පූතික වලකට යැවිය යුතුය.

(iv) අපවිත්‍ර ජලය සුදුසු පරිදි දිය බස්නා වළකට යැවිය යුතුය.

9.4 සන අපද්‍රව්‍ය බැහැර කිරීම

(i) යම් ස්ථානයක් තුල ජනනය වන අපද්‍රව්‍ය එකතු කොට ඒ ස්ථානයේ නිවැසියන්ගේ සෞඛ්‍ය ආරක්ෂා වන පරිදි අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන ආකාරයට ඒවා බැහැර කරනු ලැබිය යුතුය.

(ii) අධිකාරිය විසින් නියම කරනු ලබන පිරිවිතර වලට අනුව සෑම නිවසකටම අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා කොම්පෝස්ට් බැරලයක් සැපයිය යුතුය.

(iii) යම් පරිශ්‍රයක් ඇතුළත හෝ යම් ප්‍රසිද්ධ ස්ථානයක පොලිතින් ද්‍රව්‍ය මඟින් උත්පාදනය වන අපද්‍රව්‍ය මහජනතාවගේ සෞඛ්‍යයට හෝ පරිසරයට අනතුරුදායක වන ආකාරයට එකතු කිරීම සහ බැහැර කිරීම නොකළ යුතුය.

(iv) iii ඡේදයේ හඳුනාගෙන ඇති පරිදි කිසිදු අපද්‍රව්‍යයක් මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා අදහස් කරනු ලබන යම් ප්‍රදේශයකට හෝ යම් තෙත් බිමකට හෝ පාරිසරික වශයෙන් සංවේදී වෙනත් ප්‍රදේශයකට බැහැර නොකල යුතුය.

(v) මේ නියෝගවල iii හෝ iv ඡේද උල්ලංඝනය කරමින් ක්‍රියාකරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතුය.

9.5 විදුලි සහ ජල නල වැඩ

(i) යම් ගොඩනැගිල්ලක හෝ ස්ථානයක සියළු විදුලි සහ ජල නල වැඩ, අදාල පරිදි ලියාපදිංචි වූ විදුලි කාර්මිකයෙකු සහ ලියාපදිංචි වූ ජල නල කාර්මිකයෙකු විසින් සිදු කරනු ලැබිය යුතු අතර, ඒ ගොඩනැගිල්ල හෝ ස්ථානය තුල උපරිම ආරක්ෂා සහ සනීපාරක්ෂක තත්ත්වයන් රැකෙන පරිදි අධිකාරිය විසින් නියම කරනු ලබන ප්‍රමිතිවලට සහ පිරිවිතරවලට එකී වැඩ අනුකූල විය යුතුය.

9.6 ගින්නෙන් ආරක්ෂාව

(i) සෑම ගොඩනැගිල්ලක්ම, ඒ ප්‍රදේශයට අදාල වන හෝ ඒ ගොඩනැගිල්ලට යෝග්‍ය වන හෝ ඒ ගොඩනැගිලිවල පදිංචිකරුවන්ගේ ආරක්ෂාව වඩා හොඳින් සැලසෙන පරිදි අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට ගින්නෙන් ආරක්ෂා වීමේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

(ii) මහල් 04 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි හා වර්ග මීටර් 400කට වඩා විශාලත්වයක් ඇති මහජනයා රැස්වන ගොඩනැගිලි, කර්මාන්තශාලා සහ ගුදම් සම්බන්ධයෙන් වන විට ඒවායේ සවිකොට ඇති උපකරණ ගිනි නිවන හමුදාවේ ප්‍රධාන නිලධාරියා විසින් නිර්දේශ කරනු ලබන අතිරේක ආරක්ෂක අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

(iii) මහල් දෙකකට හෝ ඊට වැඩි ගණනකින් සහ වර්ග මීටර් 300 ක් හෝ ඊට වැඩි විශාලත්වයකින් යුක්ත වූද, නල මගින් ජල සම්පාදනය සපයා ඇති ප්‍රදේශයක පිහිටියා වූද, සියළු ගොඩනැගිලි සඳහා ගින්නක් ඇතිවූ විටකදී ප්‍රයෝජනයට ගැනීම පිණිස ජලය රැස්කර තැබීමට ජල තටාකයක් ඉදි කොට තිබිය යුතුය. එවැනි ජල තටාකයක මැනුම්, ගොඩනැගිලිවල විශාලත්වය සහ ඒවා භාවිතා කරනු ලබන කාර්යවලට අනුකූලව, සැලසුම් අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය යුතුය.

9.7 විදුලි සෝපාන

(i) යම් ගොඩනැගිල්ලක මගීන් සඳහා, බඩු ගෙනයාම සඳහා සවි කරනු ලැබිය යුතු විදුලි සෝපාන සංඛ්‍යාව සහ ඒවායේ නිර්මාණ සැලැස්ම, ඒවා ඉදි කිරීම, සවි කිරීම, අත්හදා බැලීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම පහත පරිදි විය යුතුය.

අ. මහල් පහකින් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වන ගොඩනැගිලි සඳහා අවම වශයෙන් ප්‍රධාන ද්වාරය අසල සහ අනෙකුත් සුදුසු ස්ථානවල විදුලි සෝපාන සවි කළ යුතුය. ප්‍රධාන සෝපාන මගින් මිනිසුන් 12 – 16 දක්වාත්, අනෙක් සෝපාන මගින් මිනිසුන් 8 – 12 දක්වාත් ගෙන යා හැකි ධාරිතාවකින් යුක්ත විය යුතුය

ආ. මහල් 5 – 10 කින් යුත් ගොඩනැගිලි සඳහා මධ්‍යම වේගයේ විදුලි සෝපාන යෙදිය යුතුය.

ඇ. මහල් 10ට වඩා උස ගොඩනැගිලි සඳහා අධිවේගි විදුලි සෝපාන යෙදිය යුතුය.

9.8 යාන්ත්‍රිකව වාතාශ්‍රය ලබා දීම සහ වායු සමීකරණය

(i) ගොඩනැගිල්ලේ වර්ගය සහ විශාලත්වය සැලකිල්ලට ගනිමින් ඒ ගොඩනැගිල්ල සඳහා මධ්‍යම වායු සමීකරණ පිරියතක් සවි කිරීම අවශ්‍යයයි අධිකාරිය විසින් සලකනු ලබන අවස්ථාවකදී පනතේ 8(ඒ) වන වගන්තිය යටතේ සංවර්ධන අවසර පත්‍රය නිකුත් කරන විටම අධිකාරිය විසින් නියම කරනු ලබන කොන්දේසිවලට අනුකූලව වාතාශ්‍රය සහ ආලෝකය සැපයීමේ ක්‍රමයක් සැලසුම් කොට පවත්වාගෙන යාමට අවශ්‍ය වන පවත්නා පරිවේෂණවලට ගැලපෙන පරිදි, ස්වභාවික ආලෝකය, වාතාශ්‍රය සහ කාමරවල උස සම්බන්ධයෙන් වූ මේ නියෝගවල විධිවිධාන මද වශයෙන් වෙනස් කරනු ලැබිය හැකිය. එවැනි අවස්ථාවකදී, තපාදූ විදුලි බලය සැපයීමේ යම් ඇනහිටීමක් ඇති වුවහොත් උපයෝගී කර ගැනීම සඳහා අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ධාරිතාවකින් යුත් උපස්ථ විදුලිය ජනක යන්ත්‍රයක් සවිකොට තබා ගෙන එය ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ධාරිතාවකින් යුත් උපස්ථ විදුලිය ජනක යන්ත්‍රයක් සවිකොට තබා ගෙන එය ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

(ii) වැසිකිළිවල සහ නාන කාමරවල ජනේල හෝ කවුළු නියමිත පළලකින් යුත් බාහිර හෝ අන්තර් එළිමහන් ප්‍රදේශයකට විවෘත කළ නොහැකි වන අවස්ථාවකදී, ඒවා සංවාතන වායු මාර්ගයකට විවෘත වන සේ තැනිය හැකිය. එවැනි වායු මාර්ගයක මුහුණතෙහි විශාලත්වය මීටර් 15ක් දක්වා උස ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට වර්ග මීටර් 1කට නොඅඩු ඒ මුහුණතෙහි එක් පැත්තක අවම පළල මීටර් 1කට නොඅඩු ද විය යුතු අතර, මීටර් 15කට වඩා උස්වූ ගොඩනැගිලි සම්බන්ධයෙන් වන විට මුහුණතෙහි විශාලත්වය වර්ග මීටර් 3කට නොඅඩු ද එක් පැත්තක අවම පළල මීටර් 1.5කට නොඅඩුද විය යුතුය. එසේ වුවද මහල් දෙකකින් යුතු ගොඩනැගිලි සම්බන්ධයෙන් වන විට, එවැනි ගොඩනැගිල්ලක පිහිටි වැසිකිළි සහ නාන කාමරවලට වාතාශ්‍රය ජනේලවල විවෘත ඉඩකඩෙහි සහ වායු මාර්ගයේ මුදුනෙහි සවි කරනු ලබන සුදුසු ධාරිතාවකින් යුතු ශූන්‍යාකාරක පංකා මඟින් යාන්ත්‍රිකව ලබා දිය යුතුය.

(iii) යාන්ත්‍රික උපාංග උපයෝගී කරගෙන වාතාශ්‍රය ලබා ගැනීමට අදහස් කරන්නේ නම්, අවම වශයෙන් පැයකට තුන්වරක්වත් වායුව මාරු කළ යුතු අතර වගු අංක 14 හි පිරිවිතර දක්වා ඇති පරිදි ස්වභාවික වාතාශ්‍රය ලබා ගැනීම සඳහා ඇති විවර එහි අඩක් දක්වා අඩු කළ හැක. එහෙත් වර්ග මීටර් 0.5 ට වඩා අඩු විය නොහැක.

(iv) යාන්ත්‍රික ලෙස වාතාශ්‍රය සලස්වා ඇති සහ වායු සමීකරණය කර ඇති ගොඩනැගිල්ලක ඒ වායු සමීකරණ හෝ යාන්ත්‍රිකව ලබා දීමේ ක්‍රමය නැතහොත් කෘතිම ආලෝක ක්‍රමය තවදුරටත් භාවිතා නොකරනු ලබන විට, ඒ ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් මේ නියෝගවල ඊට අදාළ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන බවට සහතිකයක් දිය යුතුය. එකී අදාල නියෝගවලට අනුකූලව ඒ අයිතිකරු විසින් කටයුතු කරනු ලබන තෙක් ඒ ගොඩනැගිල්ලේ පදිංචිය සඳහා නුසුදුසු යයි සලකනු ලබන අතර එතෙක් ඒ ගොඩනැගිල්ල පදිංචිය සඳහා තවදුරටත් භාවිතා නොකරනු ලැබිය යුතුය.

එතෙක් ඒ ගොඩනැගිල්ල පදිංචිය සඳහා තවදුරටත් භාවිතා නොකරනු ලැබිය යුතුය.

(v) වායු සමීකරණ, යාන්ත්‍රික වාතාශ්‍ර හෝ වෙනත් වාතාශ්‍ර ලබා ගැනීමේ ක්‍රම සවි කිරීමේදී, දීර්ඝ කිරීමේදී හෝ වෙනස් කිරීමේදී අදාල මග සැලසුම් මෙම රෙගුලාසියට අනුකූල වන පරිදි සුදුසුකම්ලත් තැනැත්තකු විසින් පිළියෙල කර අනුමැතිය සඳහා අධිකාරියට ඉදිරිපත් කල යුතුය.

10.0 සංවර්ධන කටයුතු සඳහා විශේෂ උපදෙස්

10.1 ගෘහ නිර්මාණ ශිල්පීය උපදෙස්

(i) අවට සංවර්ධනය සමග ගැලපෙන පරිදි යම් ගොඩනැගිල්ලක උස, ගෘහ නිර්මාණ ශිල්පය, නිර්මාණ ශිල්පීය ලක්ෂණ හෝ ඉදිරි පෙනුම සම්බන්ධයෙන් අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන වෙනස් කිරීම් කරන ලෙස යම් සංවර්ධන කටයුත්තක් සංවර්ධනකරුට අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකිය.

(ii) 'A' හෝ ' B ' මාර්ග දෙකක් ඡේදනය වන අවස්ථාන්හිදී ඡේදන ලක්ෂයේ සිට මීටර් 100 ක් දුරට එම මාර්ග ඔස්සේ විහිදෙන ප්‍රදේශය තුල ඉදි කරනු ලබන ගොඩනැගිලි සඳහා බිම් මහලේ මීටර් 2ක් පළලින් යුත් පොදු ආරුක්කු මාර්ගයක් මහජනයා හට ගමන් කිරීම සඳහා සැලසිය යුතුය.

(iii) ගොඩනැගිලි මුහුණතේ සවි කොට ඇති යම් යාන්ත්‍රික හෝ වෙනත් උපකරණවල ආරක්ෂාව සැලසීම සඳහා පිටතට නොපෙනෙන අයුරින් ආවරණය කරන ලෙසට අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකිය.

10.2 ඓතිහාසික හෝ ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කමක් හෝ භූ දර්ශනයේ වැදගත්කමක් ඇති ස්ථාන සංරක්ෂණය කිරීම

10.2 ඓතිහාසික හෝ ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කමක් හෝ භූ දර්ශනයේ වැදගත්කමක් ඇති ස්ථාන සංරක්ෂණය කිරීම

(i) පුරා වස්තු ආඥා පනතින් ආවරණය නොවූ යම් ස්ථානයක්, ප්‍රදේශයක් හෝ ස්මාරකයක් ඓතිහාසික හෝ ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කමක් ඇති දෙයක් බව අධිකාරියේ මතය වුවහොත්, අවස්ථානුකූල පරිදි ඒ ගොඩනැගිලි, ගොඩනැගිලි පද්ධතිය, ප්‍රදේශය හෝ ස්මාරකය සංරක්ෂණය කිරීම සඳහා සුදුසු යයි අධිකාරිය විසින් සලකනු ලබන විධාන කිසිවක් අධිකාරිය විසින් දෙනු ලැබිය හැකිය.

(ii) අධිකාරියේ මතය පරිදි, යම් ස්ථානයක් හෝ ප්‍රදේශයක් සෞන්දර්යය හෝ භූමි දර්ශනය සම්බන්ධයෙන් වැදගත් වන්නේ නම්, අවස්ථානුකූල පරිදි, ඒ ස්ථානය හෝ ප්‍රදේශය සංරක්ෂණය කිරීම සඳහා සුදුසු යයි සලකනු ලබන විධාන අධිකාරිය විසින් දෙනු ලැබිය හැකිය.

10.3 භූ දර්ශනය සහ වෘක්ෂ සංරක්ෂණය කිරීම

(i) යම් වෘක්ෂ සමූහයක් හෝ වෘක්ෂලතාදියක් කපා හෙලීම, පෙති ගැසීම හෝ ඕනෑකමින්ම විනාශ කිරීම, නැතහොත් ඒ ප්‍රදේශයේ ඇති යම් භූ දර්ශනීය වැදගත්කමක් ඇති ලක්ෂණයක් වෙනස් කිරීම අධිකාරිය විසින් ප්‍රසන්නතාවය රැක ගැනීම සඳහා තහනම් කරනු ලැබිය හැකිය.

(ii) අධිකාරිය විසින් අනුමත කරනු ලබන ආකාරයට සංවර්ධන භූමි භාගයේ භූ දර්ශනය ඇති කරන ලෙසත්, එය පවත්වාගෙන යන ලෙසත් අධිකාරිය විසින් අයිතිකරුට නියම කරනු ලැබිය හැකිය.

10.4 ප්‍රචාරක දැන්වීම්

(i) ප්‍රධාන කොටම ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා හෝ නාමපුවරු වශයෙන් පාවිච්චි කිරීම සඳහා ඉදි කොට ඇති හෝ භාවිතා කරනු ලබන යම් විශාල දැන්වීම් පුවරුවක්, නිර්මාණයක් හෝ වෙනත් උපක්‍රමයක්, ඒ ප්‍රදේශයේ

ප්‍රසන්නතාව රැකීම සඳහා පැනවිය යුතු යයි අධිකාරිය අදහස් කරන කොන්දේසිවලට අනුකූල විය යුතුය.

(ii) එවකට පවත්නා යම් විශාල දැන්වීම් පුවරුවක් හෝ වෙනත් නිර්මාණයක් වටපිටාවේ තත්තවයට හෝ මහජනයාගේ ආරක්ෂාවට අහිතකර යයි අධිකාරිය අදහස් කරන්නේ නම්, ඒ දැන්වීම් පුවරුව හෝ වෙනත් නිර්මාණය ඉවත් කරන ලෙස හෝ වෙනස් කරන ලෙස අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකිය.

10.5 වෙනත් විශේෂ නියෝග

(i) ගුවන් තොටුපළක් අවට පිහිටි ගොඩනැගිලි වල සහ අනෙකුත් ඉදිකිරීම් වල උස, ගුවන් තොටුපළවල් පිලිබඳ අධිකාරියේ අදහස් විමසා, අධිකාරිය විසින් සීමා කරනු ලැබිය හැකිය.

(ii) විදුලි සංදේශ, ගුවන් විදුලි, රූපවාහිනී හෝ වෙනත් ඒ හා සමාන සේවා සම්ප්‍රේෂණ මාර්ගයේ පිහිටි ගොඩනැගිලිවල උස, උචිත නියෝජ්‍ය ආයතනවලින් අදහස් විමසා අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකිය.

10.6 ආබාධිත පුද්ගලයන් සඳහා පහසුකම්

(i) පොදු ගොඩනැගිලි එනම්, රෝහල්, ප්‍රේක්ෂකාගාර, මහජනයා රැස්වන ස්ථාන, කාර්යාල හෝ ආබාධිත පුද්ගලයන් විසින් භාවිතා කළහැකි යැයි සැළකෙන ඕනෑම ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමේදී එම ගොඩනැගිල්ලේ ඇතුළුවීම, පිටවීම, කොරිඩෝ,පඩිපෙල්, සෝපාන, වැසිකිළි හා අනෙකුත් පහසුකම් එම ආබාධිත පුද්ගලයන්ට පහසුවෙන් පාවිච්චි කළ හැකි ආකාරයට තිබිය යුතු අතර 1996 අංක 28 දරණ ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ අංක 23(2) කොටසට අනුකූලව වගුව 20 හි සඳහන් ආබාධිතයන් ආරක්ෂා කිරීම සඳහා වූ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

(ii) මීට අමතරව 2006 ඔක්තෝබර් මස 17 වන දින අංක 1467/ 15 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2006 අංක 01 දරණ ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ (ප්‍රවේශ) නියෝග වලටද අනුකූල විය යුතුය.

වගු අංක 20

වගු අංක 20

ආබාධිත පුද්ගලයන් හට ප්‍රවේශකත්වය සැලසීම සඳහා සහ භාවිතා කිරීම සඳහා ගොඩනැගිලිවල යොදා ගතයුතු ආරක්ෂාකාරී පිරිවිතර

ඇතුළුවීම/පිටවීම දොරටු	▪ ගොඩනැගිල්ලේ එක් ඇතුළුවීමේ/පිටවීමේ දොරටුවක් ආබාධිත පුද්ගලයන් හට රෝද පුටුවලින් ගමන් කළ හැකි පරිදි විය යුතු අතර, එහි පළල සෙ. මී. 80 ක් හෝ ඊට වැඩි විය යුතුය. ▪ ඇතුළුවීමේ/පිටවීමේ දොරටුවල සිට විමසීම් කවුළුව දක්වා මග පෙන්වීමේ ගල් ආදිය ඇතිරිය යුතුය. ▪ සෑම කාමරයකටම ඇතුළුවීමේ/පිටවීමේ දොරටු අවම වශයෙන් එකක් වත් රෝද පුටුවලින් ගමන් කළ හැකි වන ලෙස ඉදිකළ යුතු අතර එය සෙ.මී. 80 ක් හෝ ඊට වැඩි පළලින් යුක්ත විය යුතුය.
ගෘහ අභ්‍යන්තර මාර්ග ආදී	▪ රෝද පුටු භාවිතා කරන්නන් සඳහා අවම වශයෙන් සෙ. මී. 120 ක් හෝ ඊට වැඩි පළලකින් යුතු කොරිඩෝ සැපයිය යුතු අතර එකී රෝද පුටු හරවා ගැනීමට හැකිවන ලෙස නිත්‍ය දුර අන්තරයන්හිදී ඉඩකඩ සපයා තිබිය යුතුය. ▪ තවද බිම් මට්ටම්වල වෙනස් වීමක් සිදුවන අවස්ථාවලදී ආබාධිත පුද්ගලයින් හට ගමන් කිරීම පහසු කරවීම සඳහා උපකරණ යොදා එම මට්ටම වෙනස් කිරීම හෝ බෑවුම් මගක් සැපයීම සිදු කළ යුතුය.
තරප්පු	▪ තරප්පු සඳහා අත්වැල් සවිකර තිබිය යුතුය. ▪ තරප්පුවේ මුදුනේ අනතුරු ඇඟවීමේ ගල් ඇතිරිය යුතුය.
බෑවුම් සහිත මාර්ග	▪ අත්වැල් සවිකර තිබිය යුතුය. ▪ එම මාර්ග සෙ. මී. 120 හෝ ඊට වැඩි පළලකින් යුක්ත විය යුතු අතර එහි ආනතිය 1:12 හෝ ඊට අඩු විය යුතුය. ▪ උස සෙ. මී. 75 ට වඩා වැඩි වන අවස්ථාවලදී සෙ. මී. 150 ක් හෝ ඊට වැඩි ගැඹුරකින් යුත් පතිත වීමේ ඉඩක් අවම වශයෙන් සෙ.මී. 75 ක දුරකින්ම තැබිය යුතුය. ▪ අනතුරු ඇඟවීමේ ගල් බෑවුම් මාර්ගවල මුදුනේ ඇතිරිය යුතුය.

එසවීමේ උපකරණ	▪ මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 2000 ක් හෝ ඊට වැඩි සහ තට්ටු දෙකක් හෝ ඊට වැඩි ගොඩනැගිලිවලදී පහත පිරිවිතර වලින් යුත් සෝපාන සවිකර තිබිය යුතුය. ▪ ඇතුළුවීමේ/පිටවීමේ දොරටුවල පළල සෙ. මී. 80 ක් හෝ ඊට වැඩි විය යුතුය. ▪ එම සෝපානවල ඇතුලත බිම් ප්‍රමාණය වර්ග මීටර් 1.83 ක් හෝ ඊට වැඩි විය යුතුය. ▪ ගැඹුර සෙ. මී. 135 ක් හෝ ඊට වැඩි විය යුතුය. ▪ සෝපාන ආලින්දය හතරැස් විය යුතු අතර, එහි පැත්තක පළල සෙ. මී. 150 ක් විය යුතුය. ▪ එම සෝපාන රෝද පුටු භාවිතා කරන්නන් සඳහා දෘශ්‍යාබාධිත හෝ ශ්‍රව්‍යාබාධිත පුද්ගලයින්ට භාවිතා කළ හැකි වන ලෙස සාදා තිබිය යුතුය.
වැසිකිළි	▪ රෝද පුටු භාවිතා කරන්නන් සඳහා අවම වශයෙන් එක් වැසිකිළියක්වත් ස්ථාපිත කළ යුතුය. ▪ එක් මහලක් සඳහා අවම වශයෙන් එක් මුත්‍රා බඳුනක් බැගින් සපයා තිබිය යුතුය.
වාහන නැවැත්වීමේ ඉඩකඩ	▪ වාහන නතර කිරීමේ ඉඩකඩ සැලසීමේදී රෝද පුටු භාවිතා කරන්නන් සඳහා අවම වශයෙන් සෙ. මී. 60 ක පළල වාහන ගාල් එකක් හෝ ඊට වැඩි ගණනක් සැපයිය යුතුය. ▪ එම වාහන ගාල් කිරීමේ ඉඩකඩ ඇතුළුවීමේ/පිටවීමේ දොරටු අසල සපයා තිබීම සුදුසුය.
ගොඩනැගිලි අභ්‍යන්තර මාර්ග	▪ ගොඩනැගිල්ලට ප්‍රවේශවන / පිටවන මාර්ගයක් රෝද පුටු පරිහරණය කරන්නන්ට භාවිතා කළ හැකි ආකාරයකට විය යුතු අතර, දෘශ්‍යාබාධිත පුද්ගලයන්ටද පහසුකම් සැලසිය යුතුය. ▪ එහි පළල සෙ. මී. 120 හෝ ඊට වැඩි විය යුතු අතර, බිමෙහි මට්ටම් වෙනසක් ඇති විට බෑවුම් මාර්ගයක් සකස් කළ යුතුය. ▪ දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ පරිහරණය සඳහා මාර්ගයන්හි යොමු ගැටි ආදිය සකස් කළ යුතුය.

11.0 අනුමැතිය සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම

11.1 සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා වන මූලික අවශ්‍යතා

(i) සියළු අයදුම්පත් 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8ඒ (2) වගන්තියට අනුකූල විය යුතු අතර, සංවර්ධන අවසර පත්‍ර ලබා ගැනීම සඳහා අධිකාරියේ අයදුම්පත් මගින් ඉල්ලුම් කළ යුතු අතර, (ඇමුණුම් I, III හා VII) වගු අංක 21 ට අදාල ගාස්තු සමග ඉදිරිපත් කළ යුතුය.

වගුව 21

අවම පෙරසැරි ගාස්තු හා සේවා ගාස්තු

සංවර්ධන කාර්යයේ ස්වභාවය	භාවිතා කළයුතු ආකෘති පත්‍රය	අයකළයුතු ගාස්තු		
1. සංවර්ධන ආකෘති පත්‍ර නිකුත් කිරීම	"අ"	පෙර සැරි ගාස්තු i. බිම් කට්ටි ප්‍රමාණය	එක් එක් බිම් කට්ටි ප්‍රමාණය කට අයකළ යුතු මුදල	
I. ඉඩම් අනු කොටස්වලට බෙදීම		* ව.මී. 150-300 අතර	රු. 500/=	
		* ව.මී. 301-600 අතර	රු. 400/=	
		* ව.මී. 601-900 අතර	රු. 300/=	
		* ව.මී. 900 ට වැඩි	රු. 200/=	
	"ආ"			
II. ගොඩනැගිලි ඉදිකිරීම්/පවත්නා ගොඩනැගිලි අලුතින් කොටස් එකතු කිරීම්/ නැවත ඉදිකිරීම්		ii. ගෙබිමේ විශාලත්වය වර්ග මී.වලින්	පදිංචිය සඳහා රු.	වාණිජ/ වෙනත් භාවිත රු.
		45ට අඩු	**500/-**	**1,000/-**
		45-90	**1,500/-**	**2,000/-**
		91-180	**2,500/-**	**3,000/-**
		181-270	**3,500/-**	**4,000/-**
		271-450	**4,500/-**	**6,000/-**
		451-675	**5,500/-**	**8,000/-**
		676-900	**6,500/-**	**10,000/-**
		901-1225	**7,500/-**	**12,000/-**
		1225 ට වැඩි	**7,500/-**	**12,000/-**
			ව. මී. 1226	ව. මී. 1226

		ව. මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු 1000 /-බැගින් ව. මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90 ක් සඳහාම රු.1250 බැගින්
III. මායිම් තාප්ප/ අරක්ෂක බැම් ඉදිකිරීම • ගොඩනැගිලි සීමාවෙන් පිටත • ගොඩනැගිලි සීමාව තුළ		iii. නේවාසික දික් මීටර් 1 ක් සඳහා ගාස්තුව — රු.300 — රු.500 වාණිජ හා වෙනත් වර්ග දික් මීටර් 1 ක් සඳහා — රු.400 — රු.600
IV. ඉඩම් / කුඹුරු ගොඩ කිරීම V. දුරකථන කුළුණු / ඇන්ටනා කුළුණු ඉදිකිරීම් VI. විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම		iv. ව.මී. 150 ට අඩු 1500 සහ එයට වැඩි සෑම ව.මී. 150 ට රු 1000 බැගින් v. උස මීටර් 5 – 20 දක්වා රු 20000 ක් සහ වැඩිවන සෑම මීටර් 1 කටම රු100 බැගින් vi. රු මී.5 ට රු 5000 ක් සහ වැඩිවන සෑම රු.මිලියන 1 ට රු 100 බැගින්
2. නේවාසික සඳහා වූ ඒකකයක භාවිතය වෙනස් කිරීම	"ආ"	**පෙරසැරි ගාස්තු :** ගෙබිම් ප්‍රමාණය (ව.මී.) — රු.ශත 45ට අඩු — **500** **45-90** — **1000** **91-180** — **1250** **181-270** — **1500** **271-450** — **1750** **451-675** — **2000** **676-900** — **2250** **900 ට වැඩි** — **2250** ව.මී. 901වැඩිවන එක් එක් ව.මී 90 සඳහා රු 500 බැගින්
3. මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය	"ඇ"	**පෙරසැරි ගාස්තු :**
i. ඉඩම් අනු බෙදුම් සඳහා		i. * ව.මී.1000ට අඩු ඉඩම් සඳහා — රු 2000 * ව.මී.1001-5000 දක්වා — රු 5000 * ව.මී.5001-10000 දක්වා — රු 10000 * ව.මී.10000 සිට වැඩිවන සෑම ව.මී.1000 කටම රු 1000 බැගින්
ii. ගොඩනැගිලි ඉදිකිරීම/ අලුතින් එකතු කිරීම / නැවතඉදිකිරීම	"ඇ"	i **නේවාසික :** රු 2000 — **වාණිජ හා වෙනත්** රු 5000
iii. මායිම් තාප්ප/ ආරක්ෂක බැම් ඉදිකිරීම	"ඇ"	රු 1500 — රු 3000
iv. ඉඩම් / කුඹුරු ගොඩ කිරීම සඳහා	"ඇ"	*ව.මී. 150 අඩු ඉඩම් සඳහා — රු 2500 * ව.මී. 151 සිට 300 දක්වා — රු 5000 * ව.මී. 301 ට වැඩිවන සෑම ව.මී. 150 ටම — රු 3000 බැගින්
v. දුරකථන / විදුලි සංදේශ කුළුණු	"ඇ"	i * උස මී.5 -20 දක්වා — රු 20000 උස මී. 20 ට වැඩි සෑම මී. 1 ක් සඳහාම — රු 100 බැගින්

vi. විශේෂ සංවර්ධන ව්‍යාපෘති	"ඇ"	i * උස මී.5 -20 දක්වා රු 20000 උස මී. 20 ට වැඩි සෑම මී. 1 ක් සඳහාම රු 100 බැගින්
	"ඇ"	i * කුඩා පරිමාණ රු.මී.5 අඩුවන ව්‍යාපෘති රු10000 * මධ්‍යම පරිමාණ රු. මී. 5- 50 අතර ව්‍යාපෘති රු 50000 * මහා පරිමාණ රු. මී. 50 ට වැඩි ව්‍යාපෘති රු 1 50000
4. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක් /සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබා ගතයුතුය) i. ඉඩම් අනු බෙදුම් ii. *නේවාසික ඉදිකිරීම් * වාණිජ හා වෙනත් ඉදි කිරීම් iii. මායිම් තාප්ප / ආරක්ෂක බැම් ඉදි කිරීම iv. ඉඩම් / කුඹුරු ඉඩම් ගොඩ කිරීම v. දුරකථන / විදුලි සංදේශ කුළුණු vi. විශේෂ ව්‍යාපෘති	"ඇ"	අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තු; i. පළමු බිම් කොටසකට රු 1000 ක් සහ ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු 500 බැගින් ii. ව.මී. 300 අඩු රු 3000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 ටම රු 10 බැගින් ව.මී. 300 අඩු රු 3000 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1 ටම රු 20බැගින් iii. පළමු දික් මී.100 සඳහා රු 1000 ක් සහ ඊට වැඩිවන සෑම මී.1 ම රු 10 බැගින් iv. ව.මී. 150 ට අඩු රු 3000 ක් සහ ඊට වැඩිවන සෑම වර්ග මී. 1 ට රු 20 බැගින් v. උස මී. 5 සිට 20 දක්වා රු 2000 සහ ඊට වැඩිවන සෑම මී. 1 ම රු 100 බැගින් vi. කුඩා පරිමාණ සඳහා රු 5000 මධ්‍ය පරිමාණ සඳහා රු 10000 මහා පරිමාණ සඳහා රු 20000
5. මෝටර් රථ නවතා තැබීමේ ස්ථාන (නා. සං. අ. නියෝග යටතේ සංවර්ධන ස්ථානය තුළ නියම කර ඇති නමුත් සපයා නැති එක් මෝටර් රථයක් නවතා තබන ස්ථාන සඳහා සේවා ගාස්තු) i. නගර සභා ප්‍රාදේශීය සභාව		සේවා ගාස්තු : * සියළුම වාහන සඳහා රු 250000
6. ආවරණ අනුමැතිය ලබා දීම i. නිසි බල පත්‍රයක් නොමැතිව ඉඩම් අනු බෙදුම් කිරීම ii. නිසි සංවර්ධන බල පත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදි කිරීම/ කොටස් එකතු කිරීම/ නැවත ඉදි කිරීම ඉදිකිරීමේ අදියර * අත්තිකාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණකොට ඇති විට		ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු : එක් එක් බිම් කොටස් සඳහා රු 750 කස්තුවක් නේවාසික ව.මී. 1 ක් සඳහා ගාස්තු — වාණිජ හා වෙනත ව.මී. 1 සඳහා ගාස්තු රු 200 — රු 500

මට්ටම) සම්පූර්ණකොට ඇති විට * වහල මට්ටම දක්වා (වහලය රහිත) ඉදිකොට ඇති විට * වහලය ඇතුළුව ඉදි කොට ඇති විට * සම්පූර්ණයෙන් ඉදිකොට ඇති විට		රු 300 රු 1000 රු 400 රු 1500 රු 500 රු 2000 රු 400 රු 400
iii. මායිම් තාප්ප/ ආරක්ෂිත බැම් ඉදි කිරීම		සෑම ව. මී. 150 කට රු 5000 බැගින්
iv. ඉඩම් / කුඹුරු ගොඩ කිරීම සඳහා		සෑම උස මී. 5 කට රු 10000 බැගින්
v. දුරකථන / විදුලි සංදේශ කුළුණු සඳහා		සෑම මී. 5 ම රු 10000 බැගින්
vi. විශේෂ සංවර්ධන ව්‍යාපෘති		එක් දිනකට රු 50 බැගින්
vii. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම / භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම		
7.පදිංචිය සඳහා වූ ඒකකයක් වෙනත් බිම් කාර්යයක් පිණිස භාවිතා කිරීම සඳහා ගාස්තු		
i.අදාල දේපල මූලික වශයෙන් පදිංචිය සඳහා වූ විශේෂ ප්‍රාථමික නේවාසික කලාපයක පිහිටා ඇති විට, පදිංචිය පිණිස වූ ඒකකයක් වෙනත් යම් කාර්යයක් සඳහා පරිවර්තනය කිරීම		වර්ග මීටරයකට රු 2,000 බැගින්
ii.අදාළ දේපල වෙනත් විශේෂ නේවාසික නොවන යම් කලාපයක පිහිටා ඇති විට පදිංචිය පිණිස වූ ඒකකයක් වෙනත් යම් කාර්යයක් සඳහා පරිවර්තනය කිරීම		වර්ග මීටරයකට රු 800 බැගින්
8 නියමිත ගෙබිම් අනුපාතයට වැඩි අතිරේක ගෙබිම් ප්‍රමාණයක් සඳහා වූ සේවා ගාස්තු ඉහත සේවා ගාස්තු ගොඩනැගිල්ල ඉදිකිරීමේ අදියරවල ප්‍රතිශතයක් ලෙස ගණනය කළ යුතු අතර එකී ප්‍රතිශතය පහත දැක්වෙන සාධක පදනම් කරගෙන 40% සිට 10% දක්වා වෙනස් විය හැකිය. (i) ගොඩනැගිල්ල පිහිටා ඇති		

(i) ගොඩනැගිල්ල පිහිටා ඇති ස්ථානය (ii) ලබා ගත හැකි පොදු පහසුකම් තත්ත්වය (iii) සංවර්ධන වර්ගය (iv) වටපිටාවේ බලපෑම (v) සංවර්ධන සැලැස්මක් සකස්කර ඇත්නම් කලාපීය පිහිටීම මෙම ගණනය කිරීම සඳහා සැලකිල්ලට ගනු ලබන ගොඩනැගිලිවල අවම පිරිවැය පහත දැක්වෙන අගයන්ට අඩු නොවිය යුතුය. (i) පදිංචිය සඳහා වූ නිවාස (ii) මහල් 4 ට වැඩි පදිංචිය සඳහා වූ නිවාස,වාණිජ හා කාර්යාල ගොඩනැගිලි (iii) මහල් 4 ක් දක්වා වූ පදිංචිය සඳහා වූ නිවාස, වාණිජ හා කාර්යාල ගොඩනැගිලි (iv) සැහැල්ලු කර්මාන්ත සඳහා වූ ගොඩනැගිලි (v) ගුදම්		 <

9.සේවා සැපයිම, වාර්තා සැපයිම හෝ වෙනත් සේවා කටයුතු සඳහා

i.මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ගමනාගමන වියදම් සංවර්ධනකරු දැරිය යුතු අතර එය අදාල කාර්යාලය පිහිටි ස්ථානයේ සිට යෝජිත ස්ථානයට ඇති දුර ගණනය කර කි.මී. 1කට අවමය රු 35 අඩු නොවිය යුතුය. එහෙත් ඉන්ධන මිලෙහි වෙනස්වීම් කාලීනව ගැලපීම් කරගැනීමේ හිමිකම් ඇත.

ii.විශේෂ උපදේශක සේවා සැපයිම - වින්‍යාස සැලසුම් සකස් කිරීම, ඇස්තමේන්තු පිළියෙළ කිරීම ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම හා වෙනත් උපදේශක සේවා සඳහා ඇස්තමේනතුගත මුදලින් 10% ක අවම සේවා ගාස්තු අය කළ යුතුය.

iii.ආවරණ අනුමැතිය සඳහා අය කරන සේවා ගාස්තු, විවෘත ප්‍රදේශ සඳහා අයකරනු ලබන 10% ක තක්සේරු වටිනාකම් වාහන නවතා තැබීම සඳහා ඉඩකඩ වෙන් නොකිරීම වෙනුවෙන් අයකරනු ලබන සේවා ගාස්තු වෙනවෙනම ගිණුම් වල තැන්පත් කළ යුතු අතර, ඒවා යොදා ගත යුතුතේ විවෘත ප්‍රදේශ සංවර්ධනය, වාහන නවතා තබන ස්ථාන සංවර්ධනය,පදික වේදිකා සකස් කිරීම් හෝ පොදු නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා පමණි.

11.2 සැලසුමක අඩංගු විය යුතු දේ

යම් නිශ්චිත සංවර්ධන කටයුත්තක් සම්බන්ධයෙන් සංවර්ධන අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා පහත සඳහන් විස්තර ඉදිරිපත් කළ යුතුය.

(i) ඉඩම් සංවර්ධනය

අ. යාබද වීථිවලට අදාලව එකී ඉඩමේ පිහිටීම පිළිබඳ දල සැලැස්මක් 1:4000 ක පරිමාණයට නොඅඩු වූ පරිමාණයකින් සැපයිය යුතුය.

ආ. එකී ඉඩමේ මිනුම් සැලැස්මක් 1:1000 යන පරිමාණයට නොඅඩු පරිමාණයකින් ඇඳ පහත දක්වන කරුණු ඇතුලත් කොට සැපයිය යුතුය.

- ගොඩනැගිලි කිසිවක් තිබේ නම්, ඒවායේ දිග, පළල දැක්වෙන ඉලක්කම් යොදා ඉඩමේ පිහිටීම
- සැලැස්මේ පරිමාණය උතුරු දිශාව දැක්වෙන සංකේතයක් සහ යාබද ඉඩම්වල හෝ ගොඩනැගිලිවල වරිපනම් අංක
- ඉඩමට ප්‍රවේශවන මර්ගය සහ එහි පළල
- පවත්නා සියළු කාණු සහ ජල මාර්ග
- ඉඩමේ සමෝච්ජ රේඛා හෝ ස්ථානීය මට්ටම් සහ අවශ්‍ය අවස්ථාවලදී වීථියේ මට්ටම් හෝ ඉඩම ඉදිරිපස වීථියේ මට්ටම්

ඇ. භූමියේ මව් සැලැස්මේ පිටපතක්

ඈ. පහත විස්තර පෙන්නුම් කරන 1:1000ට නොඅඩු පරිමාණයට අඳින ලද සවිස්තරාත්මක යෝජිත අනුබෙදීම් (කට්ටි කැඩීමේ) සැලැස්ම

- යෝජිත කට්ටිවල විශාලත්වය
- යෝජිත සියළු වීථිවල පළල, මට්ටම්, විවෘත භූමි භාග හා වෙනත් පහසුකම් සඳහා වෙන් කිරීමට අදහස් කරන භූමි භාග
- සෑම ඉඩමක්ම කුමන කාර්යයක් සඳහා භාවිතා කිරීමට අදහස් කරන්නේ ද යන්න
- යෝජිත කාණු පද්ධතිය හා ජලාපවාහන ක්‍රමය

ඉ. විදුලිය හා ජල සැපයුම බෙදා හැරීමේ මාර්ග දැක්වෙන සැලැස්ම

ඊ. සංවර්ධන කටයුත්තේ ස්වභාවය අනුව අධිකාරියට අවශ්‍ය යයි හැඟී යන අවස්ථාවකදී වෙනත් ආයතනවලින් අවශ්‍ය නිරාකරණ සහතික ඉදිරිපත් කළ යුතුය.

(ii) ගොඩනැගිලි ඉදි කිරීම

අ. ගොඩනැගිලි ඉදි කරන භූමි භාගය හරියාකාරව දැන ගැනීමට ප්‍රමාණවත් වන පරිදි අවට ප්‍රදේශයේ කටු සැලැස්මක්

ආ. 1:1000 යන පරිමාණයට නොඅඩු පරිමාණයකින් අඳින ලද අනුමත කළ අනුබෙදීම් (කවටි කැඩීමේ) සැලැස්මක්

ඇ. එක් එක් ගෙබිම සඳහා 1:100 යන පරිමාණයට අඳින ලද ගෙබිම් සැලැස්මක් පහත දැක්වෙන කරුණු පෙන්නුම් කරමින් ඉදිරිපත් කළ යුතුය. (කුඩා පරිමාණයක් අවශ්‍ය වන විශාල ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන අවස්ථාවකදී 1:200 යන පරිමාණය යොදා ගත හැක.)

- ගොඩනැගිල්ලේ කාමර සහ වෙනත් ගොඩනැගිලිවල භාවිතය හා ඒවායේ දිග පළල
- සියළු දොරවල් වල, ජනේලවල සහ වෙනත් කවුළුවල පිහිටීම සහ දිග, පළල
- සියළු සනීපාරක්ෂක උපකරණ වල පිහිටීම සහ ඒවා ප්‍රධාන කාණුවලට සම්බන්ධ වන ආකාරය
- උඩින් ඇද ඇති විදුලි රැහැන්වලට ගොඩනැගිල්ලේ සිට ඇති දුර ප්‍රමාණය දැක්විය යුතුය.
- ගින්නකදී භාවිතා කරන දොරටු දැක්විය යුතුය.

- ගොඩනැගිල්ලේ බිත්ති හෝ ඌර්ධව ව්‍යුහය ගෙබිම් තට්ටු සහ වහලේ ව්‍යුහය සඳහා භාවිතා කිරීමට අදහස් කරන ද්‍රව්‍යවල වර්ගය සහ පිරිවිතර

ඇ. පහත දැක්වෙන දේ පෙන්නුම් කරමින් ගොඩනැගිල්ලේ උචිත රේඛා දිගේ හරස්කඩ සහ දිගත්කඩ පෙන්නුම් කරන ඇඳීම්

- ගොඩනැගිල්ලේ සියළු බිත්තිවල, ගෙබිම්වල ඝනකම
- ගොඩනැගිල්ලේ පහත දැක්වෙන කොටස්වල පිහිටීම හා ප්‍රමාණයන්

  - දොර ජනෙල් හෝ වෙනත් කවුළුවල පිහිටීම හා දිග පළල
  - එක් එක් මහලේ උස
  - සිවිලිමට ඇති උස, පවත්නා බිම් මට්ටමට හෝ වීථි මට්ටමට අදාලව ගොඩනැගිල්ලේ මට්ටම්
  - ඉඩමේ මායිම් අතර හා ගොඩනැගිල්ලේ පිටත බිත්ති අතර පැහැදිලි දුර ප්‍රමාණ

ඉ. ඉඩම තුල ඇති සෑම ගොඩනැගිල්ලකම උස, බිම් මට්ටම හා පිටත පෙනෙන වෙනත් ලක්ෂණ පෙන්නුම් කරමින් ඒ ගොඩනැගිල්ලේ ඉදිරි හා පැති කෙවුම්.

ඊ. ඕනෑම හරස් කඩක අත්තිවාරමේ සවිස්තර හරස් කඩක් හා ෙගාඩනැගිල්ල ඉඩමේ මායිමේ පිහිටන අවස්ථාවන්හිදී එම ස්ථානයේ අත්තිවාරෙම් සවිස්තර හරස්කඩක්.

උ. වැසි වතුර පිට කිරීමේ ක්‍රම

ඌ. ගොඩනැගිල්ල මධ්‍යමිකව වායුසමීකරණය කරනු ලැබේද යන්න

එ. අපේක්ෂිත සංවර්ධන කටයුත්තේ නියම ස්වභාවය කවරේදැයි ඒත්තු ගැනීමට අධිකාරියට හැකිවනු පිණිස අධිකාරිය විසින් නියම කරනු ලබන ඒ ගොඩනැගිල්ලට අදාල වෙනත් විස්තර හෝ තොරතුරු

11.3 සැලසුමක ගුණාත්මකභාවය

(i) සියළු සැලැස්මවල්, අළුතින් කරනු ලබන ගොඩනැගිලි වැඩ සහ එවකට පවත්නා යම් ගොඩනැගිල්ලක සියළු කොටස් සහ තබා ගැනීමට හෝ ඉවත් කිරීමට අපේක්ෂා කරන සියළු ලක්ෂණ ඇතුළුව, නියමිත වර්ණ මගින් හෝ සංකේත මගින් හෝ පැහැදිලිව පෙන්නුම් කරමින්, තීන්තෙන් ඇඳ හෝ මුද්‍රණය කොට පැහැදිලිවත්, නිවැරදිවත් පිළියෙල කොට තිබිය යුතුය.

11.4 "ගෘහ නිර්මාණශිල්පීය, ව්‍යුහ, සහ සේවා සැලසුම්"

(i) "ඉල්ලුම් කරු විසින් " සී" වර්ගයේ " සී" III උප වර්ගයට අයත් වන ගොඩනැගිලි හැර සියලු ගොඩනැගිලි සම්බන්ධයෙන් යම් ගොඩනැගිලි වැඩ ආරම්භ කිරීමට පෙර යෝජිත ගොඩනැගිල්ලක් නිර්මාණය ගණනය කිරීම්ද සහිතව එකී ගොඩනැගිල්ලේ සවිස්තරාත්මක ව්‍යුහ සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. " එකී සැලැස්ම සුදුසුකම් ලද තැනැත්තෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය.

(ii) සුදුසුකම් ලද තැනැත්තෙකු විසින් අත්සන් කරන ලද යෝජිත ගොඩනැගිල්ලක නිර්මාණ ගණනය කිරීම්ද සමග වූ සවිස්තරාත්මක ව්‍යුහ සැලැස්මක්

පහත දැක්වෙන කරුණුවලින් සමන්විත විය යුතුය.

- එක් එක් ගෙබිම හෝ එහි කොටසක් හෝ සැලසුම් කොට ඇත්තේ කවර ආරෝපිත බරක් සඳහා දැයි පැහැදිලිව දැක්විය යුතුය.

- පස පිළිබඳ කරන ලද පරීක්ෂණ වල ප්‍රතිඵල, පසෙහි දරා සිටීමේ ධාරිතාව සහ පොළව විදීම පිළිබඳ විමර්ෂණ නිශ්චය කිරීම සඳහා වූ ගණනය කිරීම් ; සහ

- යෙදීමට අදහස් කරන අත්තිවාරමේ වර්ගය හෝ වර්ග;

(iii) යම් ගොඩනැගිල්ලක හෝ ඉන් යම් කොටසක වායු සමීකරණය නැතහොත් යාන්ත්‍රික සංවාහක ක්‍රමයක් සවිකිරීමට අපේක්ෂා කරන අවස්ථාවකදී හෝ එවැනි යම් ක්‍රමයක් ව්‍යාප්ත කිරීමට නැතෙහාත් වෙනස් කිරීමට අපේක්ෂා කරන ලද අවස්ථාවකදී, එසේ යෝජිත සවිකිරීම ව්‍යාප්ත කිරීම හෝ වෙනස් කිරීම පිළිබඳ පිරිසැලැස්ම සහ සවිස්තරාත්මක සැලැස්මවල් ධාරිතාවට අදාලවන තොරතුරු සමග එකී ක්‍රමය සවිකිරීමට, ව්‍යාප්ත කිරීමට හෝ වෙනස් කිරීමට අපේක්ෂා කරන ගොඩනැගිල්ලේ සැලැස්මවල් ද සමග අධිකාරියේ අනුමැතිය සඳහා සුදුසුකම් ලද තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(iv) "ඒ" වර්ගයේ සහ "බී" වර්ගයේ සඳහන් කර ඇති සියලුම ගොඩනැගිලි සම්බන්ධයෙන් සහ අධිකාරිය විසින් නියම කරනු ලැබුවහොත් "සී" වර්ගයේ ගොඩනැගිලිවල "සි I" සහ "සිII" උප වර්ගවලට අයත්වන ගොඩනැගිලි සම්බන්ධයෙන්, ගොඩනැගිලි වැඩ ආරම්භ කිරීමට පෙර ජල සැපයුම, කසල අපවහනය,ජලාපවහනය විදුලිය හා වැසි ජලය එකතු කිරීම යනාදියට අදාල සේවා සැලැස්මක් ඉල්ලුම් කරු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එකී සේවා සැලැස්ම සුදුසුකම් ලද තැනැත්තකු සකස් කරනු ලැබ අත්සන් ලැබිය යුතුය.

11.5 ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනා

(i) අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් අධිකාරිය විසින් ගනු ලැබූ තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් එකී ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ දැන්වීම තමාට ලැබී දින 30ක් ඇතුලතදී, ඊට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

12.0 අනුකූලතා සහතිකය

12.1 අනුකූලතා සහතිකයක් නිකුත් කිරීම සඳහා වූ අවශ්‍යතා

" පනතේ **8** (ඒ) වගන්තිය යටතේ අනුකූලතා සහතිකයක් සඳහා වූ සෑම ඉල්ලීමක් සමගම පහත සඳහන් සහතික ඊට අමුණා තිබිය යුතුය;-

(i) ඉඩම් සංවර්ධනය හෝ ඉඩම් අනුබෙදීමක් සම්බන්ධයෙන් වන විට; -

(අ) අනුමත කරන ලද සැලැස්මේ සහ අවසර පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට අනු බෙදීම කරනු ලැබ ඇති බවට ප්‍රකාශ කරමින් සුදුසුකම් ලත් තැනැත්කතකුගෙන් ලබා ගත් සහතික පත්‍රයක්;

(ආ) ඉංජිනේරු වැඩ සඳහා මාර්ග, බෝක්කු සහ කාණු ඉදි කිරීම වැනි සංවර්ධන කටයුතු ඇතුළත් වන අවස්ථාවකදී සංවර්ධන කටයුතු නිශ්චිතව දක්වා ඇති නියම කිරීම් සහ අවසරයට අනුකූලව සිදු කරනු ලබන බවට ප්‍රකාශ කරමින් සුදුසුකම් ලත් තැනැත්තකුගෙන් ලබා ගත් අවසර පත්‍රයක්;

(ii) **6** වන නියෝගයෙහි " ඒ " වර්ගය යටතට ගැනෙන ගොඩනැගිලි ඉදිකිරීමක් සම්බන්ධයෙන් වන විට -

(අ) සුදුසුකම් ලත් තැනැත්තාගේ අධීක්ෂණය යටතේ සහ අනුමත කරන ලද සැලැස්ම සහ අවසර පත්‍රය ප්‍රකාරව සංවර්ධන කටයුතු සිදු කරනු ලැබූ බවට සහතික කරමින් සුදුසුකම් ලත් තැනැත්තකුගෙන් ලබා ගත් සහතික පත්‍රයක් ;

(ආ) අත්තිවාරම් සහ මතුපිට ව්‍යුහය සහ වෙනත් වැඩ සුදුසුකම් ලත් තැනැත්තාගේ අධීක්ෂණය යටතේ සහ අනුමත කරන ලද සැලැස්ම සහ අවසර පත්‍රය ප්‍රකාරවද **6** වන නියෝගයේ විධිවිධානය අනුව ඉදිරපත් කරන ලද නිර්මාණ සැලසුම් ප්‍රකාරවද, ගොඩනැගිල්ල ව්‍යුහාත්මව

ආරක්ෂිත වන බව සහතික කරමින් සුදුසුකම් ලත් තැනැත්තාලෙන් ලබා ගත් සහතික පත්‍රයක්;

(ඇ) නිර්මාණය, අධීක්ෂණය සහ විද්‍යුත් මෙහෙයුම් උපකරණ සවිකිරීම, ජලනල ඇති කිරීම සහ ජල කාණු, වැසි ජලය එකතු කිරීමේ නියම කිරීම්, වායුසමීකරණ සහ ගිණි ආරක්ෂිත වැඩ අනුමත සැලසුම් සහ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුව සිදුකරනු ලබන බවට සහ සියළු ආරක්ෂිත නියෝග සපුරාලනු ලබන බවට සුදුසුකම් ලත් තැනැත්තකු විසින් නිකුත් කරන ලද සහතික පත්‍රයක්;

(iii) 6 වන නියෝගයේ "බී" වර්ගයට අයත්වන ගොඩනැගිලි ඉදිකිරීමක් සම්බන්ධයෙන් වන විට සුදුසුකම් ලත් තැනැත්තාගේ අධීක්ෂණය යටතේ සහ අනුමත සැලැස්ම සහ අවසරය යටතේ වැඩ සිදු කර ඇති බවට සහ ගොඩනැගිල්ල ව්‍යුහාත්මකව ආරක්ෂිත බවට සහතික වෙමින් සුදුසුකම් ලත් තැනැත්තකු වෙතින් ලබා ගත් සහතික පත්‍රයක්;

(iv) 6 වන නියෝගයේ "සී" වර්ගයේ " සීI" සහ " සීII" උපවර්ග වලට අයත්වන ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් වන විට, සුදුසුකම්ලත් තැනැත්තාගේ අධීක්ෂණය යටතේ සහ අනුමත සැලසුම් සහ අවසරය පත්‍රයට අනුව සිදුකරනු ලබන බවට සහතික වෙමින් සහ ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සියලු ආරක්ෂණ පියවර ගනු ලැබ ඇති බවට සහතික වෙමින් ඉදිකරීම්කරුගෙන් හෝ අයිතිකරු ඉදිකිරීම්කරුම වන අවස්ථාවකදී එහ අයිතිකරුගෙන් ලබා ගත් සහතික පත්‍රයක්;

(v) 8 වන නියෝගයේ "සී" වර්ගයේ "සීIII" උපවර්ගයට අයත් ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් වන විට තමාගේ අධීක්ෂණය යටතේ සහ අනුමත සැලසුම් සහ අවසරය ප්‍රකාරව වැඩ සිදුකරනු ලබන බවට සහ ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සියලු ආක්ෂණ පියවර ගනු ලැබ ඇති බවට සහතික වෙමින් ඉදිකිරීම්කරුගෙන් හා අයිතිකරුගෙන් හෝ අයිතිකරු ඉදිකිරීම්කරු වන අවස්ථාවකදී එම අයිතිකරුගෙන් ලබා ගත් සහතික පත්‍රයක් ;

13.0 අර්ථ නිරූපන

"බද්ද නිවාස" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 11 දරණ බද්ද නිවාස අයිතිවාසිකම් පනතේ අර්ථ නිරූපනය කර ඇති ඒකකයක් අදහස් වේ.

"ප්‍රවේශය" යන්නට, මහජනයාට පාවිච්චි කිරීමට මාර්ග අයිතියක් තිබුණද, නොතිබුණද ඒ ගොඩනැගිලිවලට හෝ වෙනත් ස්ථානවලට ප්‍රවේශ වන මාර්ගයක් වශයෙන් භාවිතා කරනු ලබන යම් වීථියක් ඇතුලත් වේ.

"අධිකාරිය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ සංස්ථාපනය කරන ලද නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ.

"පා මහල" යන්නෙන් බිම් මහලට පහලින් පිහිටියාවූද, සම්පූර්ණයෙන්ම බිම් මට්ටමෙන් පහලින් හෝ උසෙන් 2/3 දක්වා ප්‍රමාණය යාබද භූමියේ මට්ටමෙන් පහලින් පිහිටියා වූද ගෙබිම් කොටස අදහස් වේ.

"පදිංචිය සඳහා වූ ගොඩනැගිල්ල" යන්නෙන්, තනිකරම පදිංචිය සඳහා පමණක්ම වූ එක් ඒකකයකින් හෝ ඒකක වැඩි ගණනකින් සමන්විත ගොඩනැගිල්ලක් අදහස් වේ.

"ගොඩනැගිලි රේඛාව" යන්නෙන් ගොඩනැගිල්ලක් ව්‍යාප්ත කිරීමට ඉඩ දෙනු ලබන්නේ යම් රේඛාවක් දක්වාද ඒ රේඛාව අදහස් වේ.

"ගොඩනැගිලි කර්මාන්ත" යන්නට ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ නැවත ඉදි කිරීම හෝ එවකට පවත්නා ගොඩනැගිල්ලකට අළුතින් කොටස් එකතු කිරීම හෝ එවැනි ගොඩනැගිල්ලක් වෙනස් කිරීම ඇතුලත් වේ.

"සභාපති" යන්නෙන් අධිකාරියේ සභාපතිවරයා අදහස් වේ.

"වරලත් ගෘහ නිර්මාණ ශිල්පි" යන්නෙන් ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පි ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන වරලත් ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ලියා පදිංචි ලේඛණයේ නම සඳහන් පුද්ගලයන්

"වරලත් නගර නිර්මාණ ශිල්පීන්" යන්නෙන් ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පි ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන වරලත් නගර නිර්මාණ ශිල්පීන්ගේ ලියා පදිංචි ලේඛණයේ නම සඳහන් පුද්ගලයන්

"පදිංචිය සඳහා වූ නිවාස" හෝ "පදිංචිය සඳහා වූ ඒකක" යන්නෙන් නිදා ගැනීමේ, ආහාර පිසීමේ සහ සනීපාරක්ෂක පහසුකම් ස්වාධීනව ඇති පදිංචිය සඳහා වූ අංග සම්පූර්ණ ඒකකයක් සමන්විත වන කාමරයක් හෝ කාමර පන්තියක් අඩංගු ගොඩනැගිල්ලක කොටසක් අදහස් වේ.

"සංවර්ධන කටයුත්ත" යන්නට පනතෙහි දී ඇති අර්ථයම ඇත්තේය.

"පවත්නා ඉඩම් කොටස" යන්නෙන් පනත ක්‍රියාත්මක වීමට පෙර පැවති ඉඩම් කොටසක් අදහස් වේ.

"කර්මාන්තශාලාව " යන්නට යම් භාණ්ඩයක් සෑදීම ,නිෂ්පාදනය කිරීම හෝ අළුත් වැඩියා කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් ඇතුලත් වේ.

"තට්ටු නිවාස " යන්නෙන් ප්‍රධාන වශයෙන් මිනිස් වාසය සඳහා භාවිතා වන සේ ගොඩ නගන මුළුතැන් ගෙයක්, වැසිකිළියක් හෝ ජල මුද්‍රිත වැසිකිලියක්, නාන කාමරයකින් යුත් සිරස්ව එකට සම්බන්ධ වී ඇති නිවාස ඒකක දෙකක් හෝ ඊට වැඩි ගණනක්

"ගෙබිම් ප්‍රමාණය" යන්නෙන්, ගොඩනැගිල්ලක බාහිර බිත්තිවල පිට පැතිවල සිට හෝ ගොඩනැගිලි දෙකක් පොදු බිත්තියකින් වෙන් වන අවස්ථාවකදී ඒ පොදු බිත්තියේ මධ්‍ය රේඛාවේ සිට තිරස් අතට මැනීමෙන් ලබා ගන්නා ඒ ගොඩනැගිල්ලේ යම් ගෙබිමක තිරස් වර්ග ප්‍රමාණය අදහස් කෙරෙන අතර, මීටර් 1.0 කට වැඩි පළලකින් යුත් මහලේ නෙරපුම් සහ සදළුතල සියල්ලද වහලක් ඇත්තාවූ සහ ආවරණය කරනු ලැබිය හැකි සියළු ප්‍රදේශද ඊට ඇතුලත් වේ.

"දළ ගෙබිම් ප්‍රමාණය" යන්නෙන් ගොඩනැගිල්ලක සියළු මහල්වල මුළු ගෙබිම් ප්‍රමාණය අදහස් වේ.

"ගෙබිම් ප්‍රමාණයේ අනුපාතය" යන්නෙන් යම් ඉඩම් කොටසක පිහිටි සියළු ගොඩනැගිලිවල දළ ගෙබිම් ප්‍රමාණය ඒ ඉඩම් කොටසේ වර්ග ප්‍රමාණයෙන් බෙදනු ලැබූ විට ලැබෙන අනුපාතය අදහස් වේ.

"ගෙබිම් ඉඩකඩ " යන්නෙන් ගොඩනැගිල්ලක පිහිටි යම් කාමරයක් හෝ ඉඩකඩක් වටවී ඇති බිත්තිවල ඇතුල් පැත්තෙන් මැනීමෙන් ලබා ගන්නා තිරස් වර්ග ප්‍රමාණය අදහස් වේ.

"නිවාස සංකීර්ණය" යන්නෙන් ස්ථිරව පොදුවේ භුක්ති විඳින භූමි භාගයක පිහිටි පදිංචිය සඳහා වූ ඒකක සමූහයක් අදහස් වන අතර තවිටු නිවාස කවටියක්ද ඊට ඇතුලත් වේ.

"කාර්මික ගොඩනැගිල්ල" යන්නට කර්මාන්තශාලා, වැඩපොලවල් සහ ගුදම් ඇතුලත් වේ.

"පනත" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ **1978** අංක **41** දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනත හා කලින් කලට සිදු වූ සංශෝධනයන් අදහස් වේ.

"බලයලත් මිනින්දෝරු සහ තලමිකිකරු " යන්නෙන් ශ්‍රී ලංකා මැනුම් පති විසින් මැනුම් කටයුතු කිරීමට බලයලත් පුද්ගලයෙකු අදහස් වේ.

"පළාත් පාලන ආයතනය" යන්නට පනතෙහි දී ඇති අර්ථය ම ඇත්තේය.

"ඉඩම් කොටස" යන්න ඉඩමකට අදාලව යෙදී ඇති විටෙක, මායිම් සළකුණු මගින් වෙන් කොට ඇති හෝ මායිම් තාප්ප මගින් නැතහොත් වැටවල් මගින් කොටු කර ඇති සහ එක් තැනැත්තෙකුට නැතහොත් කණ්ඩායමකට අයත් වූද, පළාත් පාලන ආයතන හෝ අධිකාරිය විසින් ඉඩම් කොටසක් ලෙස අනුමත කොට ඇත්තාවූ ද මුළු ඉඩම් ප්‍රමාණය අදහස් වේ.

"අයිතිකරු" යන්නට යම් ස්ථානයක ගෙවල් කුලිය තත් කාලයේ භාරගන්නා වූද, ඒ ස්ථානය සම්බන්ධයෙන් කරනු ලබන වැඩ තමා සඳහාම හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ නියෝජිතයකු

නැතහොත් භාරකරුවකු වශයෙන් ඒ ස්ථානය කුලී නිවැසියෙකුට කුලිය දෙන ලද විටෙක පවා ඒ ගෙවල් කුලියට ලබා ගන්නාවූ ද තැනැත්තෙකු ඇතුලත් වේ.

"ආබාධිත පුද්ගලයන්" යන්නෙන් ශාරීරික හෝ මානසික ආබාධයක් ඇති වී තිබීම නිසා තමන්ගේ එදිනෙදා අවශ්‍ය කටයුතු සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් කරගැනීමට නොහැකිව ඇති පුද්ගලයන් අදහස් වේ.

"පොදු ජනයා රැස්වන ස්ථා නය" යන්නෙන් රඟහලක්, සිනමාහලක්, පොදු ශාලාවක්, විවිධ ප්‍රසංග ශාලාවක්, දේශනශාලාවක් හෝ ප්‍රදර්ශනාගාරයක් වැනි නිතිපතා නැතහොත්, යම් යම් අවස්ථාවලදී මහජනයාට රැස්වීම සඳහා හෝ ඒ හා සමාන කාර්යයක් සඳහා භාවිතා කරනු ලබන ස්ථානයක් හෝ ගොඩනැගිල්ලක් අදහස් වන අතර, පොදු ගොඩනැගිල්ලක් ද ඊට ඇතුලත් වේ.

"සැලසුම් කම්ටුව" යන්නෙන් පනතේ **8** ආ වන වගන්තිය යටතේ පත් කරන ලද කම්ටුව අදහස් වේ.

"මූලික සැලසුම් නිරාකරණය" යන්නෙන් අදහස් කරනු ලබන්නේ යෝජිත සංවර්ධන ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්ම හා අනුකූලතාවය සහතික කිරීම සඳහා නිකුත් කරනු ලබන නිර්දේශය සහිත වූ ලිපියකි.

"පොදු ගොඩනැගිල්ල" යන්නට මහජනයා වන්දනාමාන කිරීම සඳහා උපදෙස් ලබා ගැනීම සහ විනෝද කටයුතු හෝ රැස්වීම් සඳහා භාවිතා කරනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ වෛද්‍ය ආයතනයක් හෝ සාත්තු නිවාසයක් හෝ රජයේ ගොඩනැගිල්ලක් අදහස් වේ.

"පොදු වීථිය" යන්නෙන් යාමට ඒමට මහජනයාට මාර්ග අයිතියක් ඇත්තා වූ සහ යම් නීතියක් නැතහොත් යම් නීතියක් ක්‍රියාත්මක කිරීම හේතු කොටගෙන යම් බලාධිකාරයක් වෙත පවරා ඇත්තා වූ යම් වීථියක් අදහස් වන අතර, එවැනි වීථියකට සම්බන්ධ වී ඇති කාණුවක් හෝ අඩි පාරක් ඊට ඇතුලත් වේ.

"සුදුසුකම් ලත් තැනැත්තා " යන්නට අතිවිශේෂ ගැසට් නිවේදනයේ iv වන උපලේඛනයේ **2009.4.17** දින අංක **1597/8** දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයේ iv උපලේඛනයෙන් විස්තර කර දක්වා ඇත.

වගු අංක 22

සුදුසුකම්ලත් තැනැත්තා

